
# සටහන

2024 ජනවාරි - මාර්තු

43 වෙළුම 1 - 3 කලාපය




2 සෞදි අරාබියේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්

3 ආර්ථික කම්පන මධ්‍යයේ උග්‍ර වන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන අංශයේ විෂමතාවන් දුරලීම

11 හරිත බැංකුකරණය

18 ශ්‍රී ලාංකේය ආර්ථික ඉතිහාසයේ සුවිශේෂී මං සලකුණු

29 මහ බැංකු සන්නිවේදනයේ වෙනස් වන භූමිකාව


රු. 80/-


ISSN-1391-3697

9 770202 401035

ශ්‍රී ලංකා මහ බැංකුව

සන්නිවේදන දෙපාර්තමේන්තුව




# සෞදි අරාබිය

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



සවුදි අරාබි රාජධානිය ඇල් සවුඩ් පවුල යටතේ ඒකාධිපති රාජාණ්ඩුවකි. වර්තමාන පාලකයා වන්නේ ඔටෝමාන් අධිරාජ්‍යයේ ස්වාධීනත්වයෙන් පසුව සිට හයවන පාලකයා වූ අබ්දුල්ලා රජු ය.

සවුදි අරාබියට නිල වශයෙන් ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නොමැති නමුත්, රජු කුරානය හා ෂරියා නීතිය මත බැඳී ඇත.

මැතිවරණ සහ දේශපාලන පක්ෂ තහනම් කර ඇති නිසා, සෞදි දේශපාලනය විශාල සවුදි රාජකීය පවුල තුල ප්‍රධාන වශයෙන් වෙනස් කණ්ඩායම් ඇති විය. 7000 ක් පමණ අධිපතීන් සිටින අතර, පැරණි පරම්පරාව තරුණ පරම්පරාවට වඩා වැඩි දේශපාලන බලයක් හිමි අය වේ. සියලුම ප්‍රධාන අමාත්‍යංශවල ප්‍රධානීන් අධිපතිවරුන් ය.

සෞදි අරාබියට ආසන්න වශයෙන් මිලියන 27 ක ජනගහනයක් සිටින නමුත් එම සංඛ්‍යාව මිලියන 5.5 කි. සවුදි ජනතාව 90% ක් අරාබි, නගරවාසීන් සහ බෙදුම්වාදීන් ද ඇතුලුව, ඉතිරි 10% මිශ්‍ර අප්‍රිකානු සහ අරාබි සම්භවයක් සහිත වේ.

අරාබි යනු සෞදි අරාබියේ නිල භාෂාවයි. සවුදි අරාබිය යනු මුහම්මද් (සල්) තුමාගේ උපන් ස්ථානයයි. මෙක්කා සහ මෙදිනාහි ශුද්ධ නගරද ඇතුළත් වේ. ජනගහනයෙන් සියයට 97 ක් මුස්ලිම්වරුන් වන අතර, 85% ක්ම සුන්නිවරුන්ගේ ආකෘතීන් අනුගමනය කරමින් හා ෂීස් සමත්වීමෙන් 10% ක් පමණි. නිල ආගම යනු වහබිවාදය, සාලෆිස් ලෙස හැඳින්වෙන අතිශයින් ගතානුගතික (සමහරක් "puritanical") සුන්නි ඉස්ලාම් ආකාරයකි.

මූලාශ්‍ර -
https://si.eferrit.com/සෞදි-අරාබිය-තොරතුරු-සහ/

| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය වර්ග කි.මී.<br>ගොඩ බිම් ප්‍රමාණය වර්ග කි.මී.<br>අභ්‍යන්තර ජලාශ වර්ග කි.මී. | <br>2,149,690<br>2,149,690<br>0 |
| ජනගහනය (2023 ඇස්තමේන්තු) | 35,939,806 |
| ජනගහන වර්ධන වේගය (2023 ඇස්තමේන්තු) | 1.65% |
| උපත් අනුපාතය (2023 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 13.9 |
| මරණ අනුපාතය (2023 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 3.5 |
| ළදරු මරණ අනුපාතය (2023 ඇස්තමේන්තු)<br>(සජීවී උපත් දහසකට) | 12 |
| උපතේ දී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2023 ඇස්තමේන්තු) | 76.9 |
| දළ දේශීය නිෂ්පාදිතය (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 833.5 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය<br>(2021 ඇස්තමේන්තු) | 3.24% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 23,185.87 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2017 ඇස්තමේන්තු)<br>කෘෂිකර්මය<br>කර්මාන්ත<br>සේවා | <br>2.6%<br>44.2%<br>53.2% |
| ශ්‍රම බලකාය (2021 ඇස්තමේන්තු) | මිලියන 16.06 |
| සේවා වියුක්තිය (2021 ඇස්තමේන්තු) | 7.36% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2019 ඇස්තමේන්තු) | 45.9 |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) (2017 ඇස්තමේන්තු)<br>දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | -8.9% |
| උද්ධමන අනුපාතය (2021 ඇස්තමේන්තු) | 3.4% |
| ආනයන (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 213.016 |
| ආනයන භාණ්ඩ | කාර්, රත්රන්, විකාශන උපකරණ, ඇසුරුම් කළ ඖෂධ, පිරිපහදු කළ ඛනිජ තෙල් |
| අපනයන (2021 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 286.502 |
| අපනයන භාණ්ඩ | බොරතෙල්, පොලිමර්, කාබනික මධ්‍යසාර, පිරිපහදු කළ ඛනිජ තෙල්, ස්වභාවික වායු |
| මුදල් ඒකකය | සෞදි රියාල් |

"සටහන" සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

# ආර්ථික කම්පන මධ්‍යයේ උග්‍ර වන ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපන අංශයේ විෂමතාවන් දුරලීම

**ලසන්තා විජේරත්න,**
**අර්ථ ශාස්ත්‍රඥ,**
**ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකාවේ දිගු කාලීන ව මුල් බැස ගත් සාර්ව ආර්ථික අසමතුලිතතාවන් වඩාත් උග්‍ර වීමේ ප්‍රතිඵලයක් ලෙස නිදහසින් පසු රට මුහුණ දුන් දරුණු ආර්ථික පසුබෑම හේතුවෙන් පවතින සමාජ ආර්ථික ගැටලු වඩාත් අයහපත් අතට පත්වීම අවිවාදාත්මක ය. ආර්ථික අර්බුදය මධ්‍යයේ නිෂ්පාදන කර්මාන්ත බිඳ වැටීම, ජීවනෝපායයන් අහිමි වීම, ශීඝ්‍රයෙන් ඉහළ ගිය උද්ධමනය හේතුවෙන් ජීවන වියදම දැරිය නොහැකි මට්ටමකට ළඟා වීම, සැපයුම් දාමයේ අවහිරතා හේතුවෙන් අවශ්‍යතා සපුරාගැනීමේ දුෂ්කරතා යනාදී බහුවිධ බලපෑම් සමඟ පුද්ගලයින්ගේ සමාජ ආර්ථික පසුබිම විශාල අභියෝගයන්ට මුහුණ දී ඇත. විශේෂයෙන් ම, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය, ආර්ථික අර්බුදයට පෙරාතුව සිට ම, එනම් කොවිඩ්-19 වසංගතය ආරම්භයේ සිට ම විවිධ හැලහැප්පීම් වලට මුහුණ දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ළමුන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල මත වසර තුනකට අධික කාලයක් මුළුල්ලේ විවිධ මට්ටමෙන් බලපෑම් ඇති වී ඇත. එවන් වාතාවරණයක් තුළ, ඉදිරි ආර්ථික ගමන් මග තීරණය කිරීමෙහිලා වැදගත් කාර්ය භාරයක් හිමිවෙන අනාගත ශ්‍රම බලකායට එක්වීමට අපේක්ෂිත වත්මන් ශිෂ්‍ය පරපුරේ අධ්‍යාපනය මත බාහිර ආර්ථික හා සමාජීය කම්පන මගින් ඇති වී ඇති බලපෑම මෙන් ම, ඊට අදාළ ප්‍රතිපත්තිමය විසඳුම් පිළිබඳ ව මෙම සටහන තුළින් අවධානය යොමු කෙරේ.

**ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ ව්‍යුහය:**

පසුගිය දශක ගණනාව තුළ ජනගහනයේ අධ්‍යාපන මට්ටම් වැඩි දියුණු කිරීම සඳහා රජය ඇතුළු ප්‍රතිපත්ති අධිකාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සාධනීය ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රය සැලකිය යුතු මට්ටමේ ප්‍රගතියක් අත්කරගෙන ඇත. සියයට 93 ඉක්මවා ගිය ජනගහනයේ සාමාන්‍ය සාක්ෂරතා අනුපාතය සමඟ ශ්‍රී ලංකාව අද වන විට මානව සංවර්ධන දර්ශකයෙහි රටවල් 189ක් අතුරින් 73 මට්ටමේ පසුවන අතර, අනෙකුත් කලාපීය රටවලට සාපේක්ෂව එය යහපත් මට්ටමකි. 1940 දශකයේ පටන් ආරම්භ වූ ප්‍රාථමික අංශයේ සිට විශ්වවිද්‍යාල දක්වා නිදහස් අධ්‍යාපනයක් ලබා දීම සඳහා වූ ප්‍රතිපත්තිය යටතේ මේ දක්වා පැවති ඒ ඒ රජයයන් මගින් ගනු ලැබූ ප්‍රයත්නයන් මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වී ඇත. නිදහස් අධ්‍යාපනය සඳහා අවස්ථාව හිමි කර දීම පමණක් නොව ඊට සමගාමී ව පාසැල් ළමුන් සඳහා නොමිලයේ දිවා ආහාරය සැපයීම, නොමිලයේ නිල ඇඳුම් ලබා දීම මෙන් ම, ආර්ථිකමය වශයෙන් පසුගාමී පවුල්වල දරුවන් සඳහා මූල්‍ය සහාය (ශිෂ්‍යාධාර) සැපයීම වැනි අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුබසාධන වැඩසටහන් හරහා අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශය පුළුල් කිරීමට ගනු ලැබූ පියවර ද, අධ්‍යාපන ක්ෂේත්‍රයේ වැඩි දියුණුව සඳහා ඉවහල් වී ඇත. විශේෂයෙන් ම, සිසුන් අධ්‍යාපන පද්ධතිය තුළ රැඳී සිටීමේ අනුපාතය ඉහළ නැංවීමේ අරමුණින් 2016 වසරේ දී රජය විසින් හඳුන්වා දෙනු ලැබූ වසර 13ක අනිවාර්ය අධ්‍යාපනයක් ලබාදීම සඳහා වූ ප්‍රතිපත්තිය අධ්‍යාපන ක්ෂේත්‍රයය තුළ සිදු කළ වැදගත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග යක් වූ අතර, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයෙන් අසමත් ව අධ්‍යාපන පද්ධතියෙන් ඉවත් වන සිසුන්ට

වෘත්තීය ධාරාව යටතේ පාසල් අධ්‍යාපනය තවදුරටත් ලබාගැනීමේ අවස්ථාව ද මේ හරහා හිමි විය.


විවිධ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්ති හා සමගාමී ව වර්ධනය වී ඇති ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ 2022 වසර අවසානය වනවිට රජයේ සහ පෞද්ගලික අංශය ද ඇතුළත් ව පාසල් 11,082ක් පැවති අතර, ඉන් පාසල් 10,134ක් රජයේ පාසල් වේ. ඒ අනුව මෙම පාසල් හරහා සිසුන් මිලියන හතරකට අධික ප්‍රමාණයකට 2022 වසර තුළ දී අධ්‍යාපන පහසුකම් සපයා දී ඇත.

### අර්බුදයට පෙර සිටම අධ්‍යාපන පද්ධතියේ පැවති විෂමතාවන්:

තිරසර සංවර්ධන ඉලක්ක යටතේ 2030 වසර වනවිට සියලු ම දරුවන් සඳහා නිදහස්, සමාන සහ ගුණාත්මක ප්‍රාථමික සහ ද්විතීයික මට්ටමේ අධ්‍යාපනයක් සහතික කිරීම සඳහා ඒ ඒ රජයන් විසින් ගෙන ඇති බහුවිධ ප්‍රයත්නයන් හේතුවෙන් සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මට්ටම්වල ඉහළ ප්‍රගතියක් දැකගත හැකි වුව ද, රටේ අධ්‍යාපන පද්ධතිය තුළ විවිධ මානයන්ගෙන් නිර්මාණය වූ විෂමතාවන්, මෑත කාලීන ආර්ථික අර්බුදයට පෙරාතුව සිට ම දක්නට ලැබුණි.

විශේෂයෙන් ම, අධ්‍යාපන පද්ධතිය තුළ මානව සහ භෞතික යටිතල පහසුකම් ව්‍යාප්තියේ මෙන් ම, දරුවන්ගේ ඉගෙනුම් ප්‍රතිඵලවලට අදාළ ව භූගෝලීය වශයෙන් හා ආර්ථික කාණ්ඩ අතර දිගු කාලීන ව පවතින විෂමතාවන් පවතී. 2018 වසරට අදාළ ව දත්ත අනුව දිස්ත්‍රික්ක මට්ටමින් පාසල් ව්‍යාප්තිය සැලකීමේ දී වැඩි ම පාසල් සංඛ්‍යාව කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් වාර්තා වුව ද ඉන් සියයට 40ක් පමණ පාසල් පහ වසර දක්වා හෝ අට වසර දක්වා පන්ති පැවැත්වෙන පාසල් වේ. එසේ ම, දිස්ත්‍රික්කයේ පවතින පාසල් සංඛ්‍යාව අතරින් උසස් පෙළ සඳහා විද්‍යා විෂය ධාරාව උගන්වනු ලබන පාසල් ප්‍රතිශතය කොළඹ දිස්ත්‍රික්කයේ සියයට 19.4ක් වැනි ඉහළ ප්‍රතිශතයක් ගන්නා අතර, එහි අවම ප්‍රතිශතය වන සියයට 6.3 මාතලේ දිස්ත්‍රික්කයෙන් වාර්තාවේ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ එම ප්‍රතිශතය සියයට 6.6ක් වේ. එසේ ම, කලාපීය වශයෙන් ගුරුවරුන් ව්‍යාප්තව වී ඇති අකාරය ද දරුවන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල මත තීරණාත්මක බලපෑමක් ඇති කරන සාධකයක් ලෙස සැලකිය හැකි ය. දිස්ත්‍රික්ක අනුව සිටින උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාව සැලකීමේ දී, කිලිනොච්චිය, නුවරඑළිය, ත්‍රිකුණාමලය සහ වවුනියාව යන දිස්ත්‍රික්කවල, ළමුන් සියයක් සඳහා උපාධිධාරී ගුරුවරුන් සංඛ්‍යාව දෙකකට වඩා අඩු මට්ටමක පවතී. විශේෂයෙන් ම, ශ්‍රී ලංකාවේ

**රූප සටහන 01: දිස්ත්‍රික්ක අනුව පාසල් සංඛ්‍යාව සහ උසස් පෙළ සඳහා විද්‍යා විෂය ධාරාව ඇති (1AB) පාසල් ප්‍රතිශතය (2018)**




මූලාශ්‍රය: අධ්‍යාපන අමාත්‍යාංශය

දුෂ්කර පළාත්වල පාසල්වල දිගු කාලයක් මුළුල්ලේ පවතින සුදුසුකම් ලත් ගුරුවරුන්ගේ හිඟය ළමුන්ගේ අධ්‍යාපන මට්ටම් කෙරෙහි සැලකියයුතු බලපෑම් ඇති කරන සාධකයක් ලෙස සැලකිය හැකි ය.


තව ද, බොහෝ දුෂ්කර පළාත්වල පාසල් අධ්‍යාපනය ලබා ගැනීමේ දී ළමුන්ට විවිධ අසීරුතාවලට, එනම් පාසල් සඳහා ළඟා වීමට පවතින ප්‍රවාහන දුෂ්කරතා වැනි අනෙකුත් සමාජ-ආර්ථික ගැටලු වලට මුහුණ දීමට සිදුවන අතර, එය ඔවුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියට අහිතකර බලපෑම් ඇතිකර ඇත. වර්ග කිලෝමීටර සියයක් තුළ පවතින පාසල් සංඛ්‍යාව පිළිබඳව 2018 වසරට අදාළ දත්ත විමසීමේ දී, කොළඹ දිස්ත්‍රික්කයේ එම අගය 57ක් පමණ වන අතර, මුලතිවු දිස්ත්‍රික්කයේ එම අගය පාසල් හතරකට පමණක් සීමා වේ. ඒ අනුව, මුලතිවු, අනුරාධපුරය, අම්පාර, මන්නාරම, කිලිනොච්චිය ආදී දිස්ත්‍රික්කවල දරුවන්ට පාසල් සඳහා වැඩි දුරක් යෑමට සිදුවේ. ඒ අනුව, ප්‍රාදේශීය වශයෙන් සම්පත් ව්‍යාප්තියේ පවතින විෂමතා, අඛණ්ඩ අධ්‍යාපනයක් සඳහා වන ප්‍රවේශය මෙන් ම පවතින ඉගෙනුම් අවස්ථා කෙරෙහි බලපෑම් ඇති කරන අතර, එමගින් ඉගෙනුම් ප්‍රතිඵලවල පරතරයන් සහ විෂමතාවන් නිර්මාණය කර ඇත.

කලාපීය වශයෙන් සම්පත් බෙදී යෑමේ විෂමතාව මෙන් ම, වඩාත් ඵලදායී ආර්ථිකමය අවස්ථා සඳහා පුද්ගලයින් ප්‍රධාන වශයෙන් නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය වීම පිළිබිඹු කරමින් ඉගෙනුම් ප්‍රතිඵලවලට අදාළ ව ද දිස්ත්‍රික්ක අතර ඉහළ විෂමතාවක් පවතින අතර, එය කිසියම් දුරකට මෙවැනි දුෂ්කර පළාත්වල අනාගත ඉගෙනුම් අවස්ථා කෙරෙහි ද අහිතකර බලපෑමක් ඇතිකළ හැකි ය.

සම්පත් සඳහා පවතින ප්‍රවේශයෙහි විෂමතාව පිළිබිඹු කරමින්, නාගරික, ග්‍රාමීය සහ වතු යන අංශ අතර පරිගණක සාක්ෂරතාවේ ඉහළ විෂමතාවක් පවතී. නාගරික අංශයේ පරිගණක සාක්ෂරතාව 2018 වසරේ පැවති සියයට 40.4 සිට 2022 වසර වනවිට සියයට 48.9ක් දක්වා ඉහළ ගොස් ඇති අතර, ග්‍රාමීය අංශයේ පරිගණක සාක්ෂරතාව 2018 වසරේ පැවති සියයට 27.5 සිට 2022 වසර වනවිට සියයට 34.6ක් දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වෙතත්, වතු අංශයේ අවුරුදු පහේ සිට අවුරුදු 69 දක්වා වූ ජන කාණ්ඩයේ පරිගණක සාක්ෂරතාව 2018 මෙන් ම, 2022 වසර තුළ ද සියයට 11ක පමණ මට්ටමේ පවතී.


මෙවැනි ව්‍යුහාත්මක විෂමතාවන් මධ්‍යයේ, අධ්‍යාපනය සඳහා වන රාජ්‍ය වියදම් දීර්ඝ කාලයක්

**රූප සටහන 02: දිස්ත්‍රික්ක අනුව උපාධිධාරී ගුරු පත්වීම් සංඛ්‍යාව (2018)**




මූලාශ්‍රය: අධ්‍යාපන අමාත්‍යාංශය


**රූප සටහන 03: දිස්ත්‍රික්ක අනුව වර්ග කිලෝමීටර 100ක් තුළ ස්ථාපිත පාසල් සංඛ්‍යාව (2018)**




මූලාශ්‍රය: අධ්‍යාපන අමාත්‍යාංශය

පුරා සැලකිය යුතු අන්දමින් පහළ මට්ටමක පැවතීම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය තුළ දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවකි. 2030 වනවිට අධ්‍යාපනයට අදාළ ව තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට අදාළ ව යුනෙස්කෝ සංවිධානය මගින් 2015 වසරේ දී ඉදිරිපත් කරන ලද නිර්දේශ අතර ප්‍රධාන අවශ්‍යතාවක් වන්නේ රජය විසින් අධ්‍යාපනය සඳහා දරන වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් 4%-6% හෝ සමස්ත

**රූප සටහන 04: ශ්‍රී ලංකාවේ ඩෙස්ක්ටොප් පරිගණකයක් හෝ ලැප්ටොප් පරිගණකයක් හිමි කුටුම්භ ප්‍රතිශතය**




මූලාශ්‍රය: ජන ලේඛන සහ සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

රජයේ වියදමෙන් 15%-20% අතර පරාසයක පවත්වා ගැනීමයි.


කෙසේ වෙතත්, දශක ගණනාවක් මුළුල්ලේ අධ්‍යාපනය සඳහා ශ්‍රී ලංකා රජය විසින් දරා ඇති වියදම දළ දේශීය නිෂ්පාදිතයෙන් 1%-2% ක් වැනි ඉතා අඩු මට්ටමක පවතින අතර, කලාපීය සෙසු රටවල් හා සැලකීමේ දී එය ඉතා පහළ මට්ටමකි. උදාහරණයක් ලෙස, ලෝක බැංකු දත්තවලට අනුව අසල්වැසි ඉන්දියාවේ මෙම ප්‍රතිශතය පසුගිය වසර ගණනාව තුළ 4% මට්ටමට වඩා ඉහළ අගයක පවතී. එසේ ම, ශ්‍රී ලංකාවේ රාජ්‍ය වියදමේ ප්‍රතිශතයක් ලෙස අධ්‍යාපනය සඳහා වන වියදම ද පසුගිය දශකය තුළ බොහෝ දුරට නොවෙනස් ව පැවති අතර, 2012 වසරේ වාර්තා වූ 6.8% හා සාපේක්ෂ ව එය 2022 වසරේ දී 7.2%ක් විය.

**මෑත කාලීන ආර්ථික සහ සමාජීය කම්පන මගින් ඇති කළ අභියෝග:**

මෑත කාලීන ව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය මුහුණ දුන් වඩාත් ම අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් වන්නේ කොවිඩ් 19 වසංගතය ව්‍යාප්ත වූ 2020 සහ 2021 යන වසර ද්විත්වයයි. 2020 වසරේ දී ලොව පුරා ව්‍යාප්ත වූ කොවිඩ්-19 වසංගතය පාලනය කිරීම සඳහා අනෙකුත් රටවල් මෙන් ශ්‍රී ලංකාව ද පුද්ගල සංචරණය අවම කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ගත් සමග බොහෝ සමාජ ආර්ථික කටයුතු සැලකිය යුතු ලෙස අකර්මණ්‍ය විය. මෙම ක්‍රියාමාර්ග යටතේ පාසල් මෙන් ම අනෙකුත් අධ්‍යාපන ආයතන ද සැලකිය යුතු කාලයක් පුරා වසා දැමීමට සිදුවූ අතර, පසුව විවිධ දුෂ්කරතා මධ්‍යයේ වුව ද ක්‍රමානුකූල ව දුරස්ථ අධ්‍යාපන විධි ක්‍රියාවට නංවමින් ඉගෙනුම් කටයුතු අඛණ්ඩ ව පවත්වාගෙන යෑමට බලධාරීන් විසින් කටයුතු කරන ලදී. කොවිඩ් 19 වසංගතය මගින් ලොව බොහෝ රටවල ඉගෙනුම් ක්‍රියාවලියට ඉහළ බලපෑමක් ඇති කළ අතර, ආසියානු සංවර්ධන බැංකුවේ වාර්තාවකට අනුව 2021 අප්‍රේල් මාසය වනවිට සංවර්ධනය වෙමින් පවතින ආසියාවේ රටවල් 46න් රටවල් 8ක පාසල් වසරකට වඩා අධික කාලයක් පුරා වසා තිබුණු අතර, කලාපය තුළ ශ්‍රී ලංකාව ඇතුළු රටවල් 11ක පාසල් දින 200-300 දක්වා පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් වසා දැමීම සිදුවිය.

පාසල් වසා තැබුණු කාල පරාසය තුළ දුරස්ථ/මංගත මාර්ග ඔස්සේ ඉගෙනුම් ක්‍රියාවලිය අඛණ්ඩ ව පවත්වා ගැනීමට රජය ප්‍රයත්න දැරුව ද, ව්‍යුහාත්මක වශයෙන් පවතින සම්පත් සඳහා වන ප්‍රවේශය විෂමකාර වීම මෙන් ම, එම ක්‍රමෝපායන් ක්‍රියාත්මක කිරීමේ දී පැවති අකාර්යක්ෂමතා මධ්‍යයේ ඉගෙනුම් ප්‍රතිඵලවල ඉහළ

**රූප සටහන 05: දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස අධ්‍යාපනය සඳහා රජයේ වියදම (කලාපීය රටවල් සහ ශ්‍රී ලංකාව)**




මූලාශ්‍රය: ලෝක බැංකුව /ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තා

විෂමතාවන් වර්ධනය වීමක් දැකිය හැකි විය. එසේ ම, පන්ති කාමරය තුළ භෞතික වශයෙන් ඉගෙනුම් කටයුතු සිදු කිරීම අත්‍යවශ්‍ය වන ප්‍රාථමික අංශයේ දරුවන්ගේ ඉගෙනුම් ප්‍රතිඵල මත පාසල් වසා තැබූ කාලය තුළ ඇතිවූ බලපෑම ඉතා විශාල ය. අධ්‍යාපන අමාත්‍යාංශය පෙන්වා දෙන්නේ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් අනපේක්ෂිත පරිදි පාසල් වසා දැමීම සමඟ 2021 වසර අවසානය වනවිට 01 ශ්‍රේණියේ දරුවන් ආසන්න වශයෙන් 333,000කට පමණ පාසල් අධ්‍යාපනයේ තීරණාත්මක පළමු වසර අහිමිව ඇති අතර, ඒ අනුව ඔවුන්ට වඩාත් අනුබල සැපයෙන ඉගෙනුම් පරිසරයක් අහිමි වීමෙහි බලපෑම දිගු කාලීන වශයෙන් ඉගෙනුම් ප්‍රතිඵල කෙරෙහි බලපෑම් කළ හැකි බවයි. තවද, කොවිඩ් 19 වසංගතය මගින් නිර්මාණය වූ ආදායම් කම්පන මගින් ද අධ්‍යාපනය මත වක්‍රාකාරයෙන් බලපෑම් ඇති විය. වසංගතය මධ්‍යයේ ආර්ථික කටයුතු අඩපන වීමත් සමඟ, විශේෂයෙන් ම අවදානමට ලක් විය හැකි කාණ්ඩවල ආදායම් මත දැඩි බලපෑමක් ඇති කළ අතර, එමගින් එම පවුල්වලට අධ්‍යාපන කටයුතු සඳහා වියදම් කළ හැකි ප්‍රමාණය සීමා විය.

මේ අතර, 2022 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දුන් උග්‍රතම ආර්ථික අර්බුදය සමඟ වසංගතය මධ්‍යයේ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය මුහුණ දුන් අභියෝග තවදුරටත් තීව්‍ර විය. ආර්ථික අර්බුදය සමඟ උග්‍ර වූ ඉන්ධන හිඟය හේතුවෙන් මතු වූ ප්‍රවාහන ගැටලු හේතුවෙන් කෙටි කාලීන ව වුව ද, පාසල් වසා දැමීමට සිදුවීමත් සමඟ නැවතත් අධ්‍යාපන කටයුතු භෞතික වශයෙන් කරගෙන යෑම අසීරු විය. ඉන්ධන අර්බුදය මධ්‍යයේ දීප ව්‍යාප්ත ව සිදු කළ දීර්ඝ විදුලිය විසන්ධි කිරීම ද සිසුන්ගේ ඉගෙනුම් කටයුතු මත අහිතකර බලපෑම් ඇති කළේ ය. එසේ ම, ආර්ථික අර්බුදය මධ්‍යයේ රැකියා සහ ජීවනෝපායයන් අහිමි වීම මෙන් ම, ආහාර උද්ධමනය සමඟ පුද්ගලයන්ගේ ආදායමෙන් සැලකියයුතු කොටසක් ආහාර සඳහා වැය වීම හේතුවෙන් අධ්‍යාපනය වෙත කෙරෙන වියදම් කපා හැරීමට සිදු වීම, විශේෂයෙන් ම අවදානමට ලක් විය හැකි ජන කාණ්ඩය තුළ දරුවන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය මත සැලකිය යුතු බලපෑමක් සිදු කර ඇත. ලෝක ආහාර සංවිධානයේ 2023 මැයි වාර්තාවකට අනුව, 2023 මාර්තු වනවිට කුටුම්භවලින් සියයට 23ක් සෞඛ්‍යය සහ අධ්‍යාපනය මත වන වියදම් කපා හැර ඇති අතර, එය කුටුම්භවල යහ පැවැත්ම මෙන්ම ඒවායේ අනාගත දියුණුව කෙරෙහි ද අහිතකර බලපෑමක් ඇති කරනු ඇතැයි පෙන්වා දේ. තව ද, අනෙකුත් භාණ්ඩ මිල ගණන් ඉහළ යෑමට සමගාමී ව පොත් පත් ඇතුළු පාසල් උපකරණ මිල ගණන් අසාමාන්‍ය පරිදි ඉහළ යෑම සිදුවූ අතර, අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශයට එමගින් බාධා එල්ල වී ඇත. ඒ අතර ම, කුටුම්භ මුහුණ දුන් ආර්ථික දුෂ්කරතා සමඟ පෝෂණීය ආහාර වේලක් ලබා ගැනීමට මෙන්ම අවශ්‍ය මූලික සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමට ඇති හැකියාව දරුණු ලෙස පිරිහීමකට ලක්වූ අතර, එය දරුවන්ට ඵලදායී අධ්‍යාපනයක් ලබා ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථා සැලකියයුතු ලෙස සීමා කිරීමට ද හේතු විය.

මෙම පසුබිම තුළ 2021-2022 යන වසර තුළ දී තුන්වන ශ්‍රේණියේ ඉගෙනගත් ළමුන් පදනම් කරගනිමින් ශ්‍රී ලංකාවේ පළාත් නවය ම ආවරණය පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කළ අධ්‍යයනය මගින් කොවිඩ් 19 ඇතුළු අනෙකුත් කම්පන මගින් ඉගෙනුම් ප්‍රතිඵල මත සිදු කළ බලපෑම මනාව පෙන්නුම් කරයි. 2021-2022 වසර තුළ දී තුන්වන ශ්‍රේණියේ ඉගෙනගත් ළමුන්ගේ භාෂා සාක්ෂරතාව සහ ගණිතයට අදාළ මූලික කුසලතා මට්ටම් ඇගයීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කළ මෙම අධ්‍යයනයට අනුව, සලකා බලන ලද ළමුන් කාණ්ඩය තුළ සාක්ෂරතාවට අදාළ මූලික කුසලතා (කියවීම, ලිවීම, කථනය ඇතුළු) සියල්ල අත්කර ගත් ප්‍රතිශතය සියයට 6ක මට්ටමේ අඩු අගයක පවතින අතර, ගණිතයට අදාළ මූලික කුසලතා සියල්ල සාක්ෂාත් කර ගත් ප්‍රතිශතය සියයට 7ක් පමණක් වේ. ආර්ථික හා සමාජීය කම්පන මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට උග්‍ර බලපෑමක් සිදුව ඇති බවත් ඒ සඳහා කඩිනමින් පියවර ගැනීමේ අවශ්‍යතාවත් මෙම ප්‍රතිඵල මගින් පෙන්නුම් කරයි.

එසේ ම, විවිධ කම්පන හේතුවෙන් ඉගෙනුම් ක්‍රියාවලියට සිදුවූ අඛණ්ඩ බාධා මධ්‍යයේ විෂය නිර්දේශ කිසිදු වෙනස් කිරීමකින් තොර ව ජාතික මට්ටමේ විභාග ඇගයුම් පැවැත්වීම සිසුන්ගේ අනාගත සේවා නියුක්ති අවස්ථා සඳහා වන ඉඩ ප්‍රස්ථා කෙරෙහි තීරණාත්මක බලපෑමක් කර ඇත. තව ද, ආර්ථික අර්බුදයත්, ඒ හා සමගාමී ව පුද්ගලයන්ගේ ජීවන තත්ත්වය පහළ යෑමත් සමඟ, බොහෝ වෘත්තිකයන් විදේශ ගතවීමේ ප්‍රවණතාවක් වර්තමානයේ අත්දකින්නට ලැබෙන අතර, අධ්‍යාපන අංශයේ ද එවැනි මානව ප්‍රාග්ධන ගලනයක් ඇතිවීම වත්මන් දරු පරපුරේ ඉගෙනුම් ප්‍රතිඵල මත දීර්ඝ කාලීන ව අහිතකර බලපෑමක් ඇති කළ හැකි ය.

ළමුන්ගේ වර්තමාන ඉගෙනුම් ක්‍රියාවලිය ඔවුන්ගේ අනාගත ආර්ථික ප්‍රතිසාධනය තහවුරු කරන ප්‍රධාන සාධකයක් වන අතර, වර්තමානයේ ඉගෙනුම් ක්‍රියාවලිය දුර්වල වීම මගින් ඔවුන්ගේ අනාගත ආදායම් උත්පාදන අවස්ථා සීමා කළ හැකි ය. මොටෙන්ග රෝ සහ පැට්‍රිනොස් (2014) පෙන්වා දෙන පරිදි, පාසල් යන වසර ගණන වැඩිවෙන විට පුද්ගලයන්ගේ අනාගත  ආදායම ඉහළ යෑමේ හැකියාවක් පවතින අතර, සාමාන්‍යයෙන් පාසල් අධ්‍යාපනය ලබන අමතර වසරක් පාසා පුද්ගලයින්ගේ වාර්ෂික අදායම, සියයට 9.7කින් ඉහළ යා හැකි ය. වර්තමාන අධ්‍යාපන අවස්ථා සහ ඉගෙනුම් ප්‍රතිඵල පුද්ගලයන්ගේ අනාගත අදායම් තීරණය කිරීමෙහිලා ඉහළ බලපෑමක් ඇති කරන අතර ම, අඩු අධ්‍යාපන අවස්ථා හා දුර්වල ඉගෙනුම් ප්‍රතිඵල මගින් පුද්ගලයන්ගේ සේවා නියුක්ති අවස්ථා සීමා කරමින් දුගී බවේ විෂම චක්‍රයක් නිර්මාණය කිරීමට තුඩුදෙන හෙයින්, ආර්ථික සහ සමාජීය කම්පන මගින් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉගෙනුම් ප්‍රතිඵල මත ඇතිකර ඇති අහිතකර බලපෑම මගින් දිගු කාලීන ව ඇති  කරන අනිටු ප්‍රතිවිපාක පිළිබඳ ව ප්‍රතිපත්ති සම්පාදකයින් සංවේදී විය යුතු අතර, මෙම තත්ත්වයට පිළියම් යෙදීම කඩිනම් කළ යුතු ය.

### අධ්‍යාපන ක්ෂේත්‍රයේ නව අභියෝග ජය ගැනීම:

මෙම අභියෝගාත්මක කාල සීමාවේ දී අධ්‍යාපන අංශයේ පවතින විෂමතාවන් තවදුරටත් පුළුල් වීමට පවතින ඉඩකඩ සීමා කරමින්, අර්බුදයට පෙර පැවති මට්ටමටත් වඩා ඉහළට මෙම අංශය ගෙන යෑම සඳහා නිසි කාලීන ව සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම කළ යුතු අතර,  අධ්‍යාපන  අංශයෙහි ඔරොත්තු දීමේ හැකියාව මෙන් ම කාර්යක්ෂමතාව වර්ධනය කරමින් සැමට ප්‍රතිලාභ හිමිවන අධ්‍යාපනය ක්ෂේත්‍රයක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, අධ්‍යාපන අංශයේ ප්‍රතිපත්ති ප්‍රධාන වශයෙන් දෙයාකාර විය යුතු ය. එනම් කෙටි කාලීන ප්‍රතිපත්ති මගින් ඉගෙනුම් ක්‍රියාවලිය යථා තත්ත්වයට පත් කිරීම ඉලක්ක කළ යුතු අතර, අධ්‍යාපන පද්ධතීන් හා පවතින ප්‍රතිපත්ති වෙනස් කිරීම ඉලක්ක කරගත් ප්‍රතිපත්ති මැදි හා දිගු කාලීන වශයෙන් ක්‍රියාවට නැංවිය යුතු ය.

කොවිඩ් 19 වසංගතයෙන් පසු අධ්‍යාපනය යථාවත් කිරීම සඳහා කඩිනම් ප්‍රධාන ක්‍රියාමාර්ග හයක් ආසියානු සංවර්ධන බැංකුව මගින් පෙන්වා දී ඇත. එනම්, භෞතික වශයෙන් පාසල් ආරම්භ කිරීම, ඉගෙනුම් ප්‍රතිඵල මත වූ බලපෑම තක්සේරු කිරීම, සිසුන්ගේ ඉගෙනුම් මට්ටමට ගැළපෙන පරිදි ඉගැන්වීමේ ක්‍රියාවලිය සකස් කිරීම, මූලික කුසලතා වර්ධනය කිරීම වඩාත් ඉලක්කගත කෙරෙන පරිදි විෂය පථය සංශෝධනය හෝ ඒකාබද්ධ කිරීම, ඉගෙනුම් පැය ගණන දීර්ඝ කිරීම සහ ගුරුවරුන්ගේ කුසලතා වර්ධනය සඳහා සහාය සැපයීම වේ. ශ්‍රී ලංකාව ද මින් සමහර ක්‍රියාමාර්ග පසුගිය වසර දෙකක කාලය තුළ ක්‍රියාවට නංවා ඇතත්, වසංගතය මගින් මෙන් ම ආර්ථික අර්බුදය මගින් ද ඉගෙනුම්  පද්ධතියට සිදු වූ විශාල  බලපෑම සැලකීමේ දී, කෙටි කාලීන ව ඉන් යථා තත්ත්වයට පත්වීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග ප්‍රමාණවත් නොවන මට්ටමක පවතී.  එසේ හෙයින්, ආර්ථික හා සමාජයීය කම්පන හේතුවෙන් අධ්‍යාපන පද්ධතියෙන් ඉවත් වූ කණ්ඩායම් හඳුනා ගැනීම සඳහා නොපමාව කටයුතු කළ  යුතු අතර, බහුවිධ බාධාවන් හේතුවෙන් ඉගෙනුම් ප්‍රතිඵල මත ඇතිකළ අහිතකර බලපෑම තක්සේරු කිරීම සහ විශේෂයෙන් ම අවදානමකට ලක්විය හැකි කාණ්ඩ පිළිබඳ ඉහළ අවධානයක් යොමු කරමින්, සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලිය යථා තත්ත්වයට පත් කිරීම සහ ඉගෙනුම් ප්‍රතිඵල ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම සඳහා කඩිනම් පියවර අවශ්‍ය වේ. ඊට අදාළ විසඳුම් ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම කඩිනම් කළ යුතු අතර, එම වියදම් සඳහා රාජ්‍ය වියදම් තුළ ප්‍රමුඛතාව හිමිවිය යුතු ය. විශේෂයෙන් ම, විෂය නිර්දේශය දරුවන්ගේ ඉගෙනුම් මට්ටමට ගැළපෙන පරිදි සංශෝධනය වීම අවශ්‍ය වන අතර, එහි ද ප්‍රමුඛතා අංශ හඳුනා ගනිමින් අවශ්‍ය ගැළපුම් සිදු කළ යුතු ය. නව පරිසරය හා සරිලන පරිදි ඉගෙනුම් පද්ධතියක් නිර්මාණය කිරීම සඳහා ගුරුවරුන්ගේ කුසලතා සහ තාක්ෂණික දැනුම නංවාලීම සඳහා කටයුතු කරන අතර, තාක්ෂණික සම්පත් සඳහා වන ප්‍රවේශය වැඩි දියුණු කිරීම ද අවශ්‍ය වේ.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය ආර්ථික සහ සමාජීය කම්පන සඳහා වඩාත් ඔරොත්තු දෙන මට්ටමක නොපවතින බව මෑත කාලීන අත්දැකීම් මගින් මනාව තහවුරු වී ඇත. එසේ හෙයින් සැමට සමාන ව ඉගෙනුම් අවස්ථා මෙන් ම එහි අනෙකුත් ප්‍රතිලාභ අත්කරගැනීම තහවුරු කෙරෙන  ශක්තිමත් අධ්‍යාපන පද්ධතියක් නිර්මාණය කරලීම දිගු කාලීන ව මානව ප්‍රාග්ධනය නංවාලීමෙහිලා ඉතා වැදගත් වේ.  ඒ සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ සිදු කෙරෙන ආයෝජන පුළුල් කිරීම සඳහා කඩිනමින් කටයුතු කිරීමේ අවශ්‍යතාව පවතී. ඒ යටතේ, රජයේ ප්‍රමුඛත්වයෙන් යුතු ව ආර්ථිකයේ

සියලුම පාර්ශ්වකරුවන්, විශේෂයෙන් ම පෞද්ගලික අංශය ද මැදිහත් වන ආයෝජන දිරිමත් කිරීම සිදු කළ යුතු ය. විශේෂයෙන් ම, රටේ විවිධ කාණ්ඩවලට තාක්ෂණික සම්පත් සඳහා පවතින විෂම ප්‍රවේශය සැලකිල්ලට ගනිමින් එම විෂමතා අවම කිරීම සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වයක් යටතේ ඩිජිටල් සම්පත් පුළුල් කිරීම සඳහා වන ආයෝජන දිරිමත් කළ යුතු ය. එසේ ම, පවතින සීමිත රාජ්‍ය මූල්‍ය අවකාශය මධ්‍යයේ පසුගිය වසර කිහිපය තුළ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන අංශය මුහුණ දුන් අවහිරතා සහ එහි ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූ ඉගෙනුම් පරතරයන් සඳහා පිළියම් යෙදීම වඩාත් අභියෝගාත්මක වී ඇති බැවින්, අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආයෝජනවලට අදාළ ව නව හවුල්කාරීත්වයන් මෙන් ම නව සහනදායී මූල්‍ය මුලාශ්‍ර ගවේෂණය කිරීම පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය.

අවසාන වශයෙන්, ලොව ශ්‍රම වෙළෙඳපොළ ගතිකතා හා සරිලන පරිදි වත්මන් අධ්‍යාපන පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා සියලු පාර්ශ්වයන්ගේ දායකත්වය ලබන මනාව සම්බන්ධීකරණය වූ වැඩපිළිවෙළක් යටතේ සම්පත් කාර්යක්ෂම ව යෙදවීම සඳහා අවධානය යොමු කළ යුතු අතර, ඒ යටතේ වඩාත් ගුණාත්මක අධ්‍යාපනයක් සැමට හිමි වන පරිදි දිගු කාලයක් මුළුල්ලේ පවතින සමාජ ආර්ථික සාධක හේතුවෙන් නිර්මාණය වී ඇති අධ්‍යාපන අංශයේ විෂමතාවන් විසඳාලීම ප්‍රමුඛ විය යුතු වේ. අධ්‍යාපන අංශයේ අවශ්‍ය කඩිනම් ප්‍රතිසංස්කරණ ඉදිරියට ක්‍රියාත්මක කරන අතර, පසුගිය වසර තුන තුළ විශාල ලෙස පුළුල් වූ ඉගෙනුම් පරතරයන් අවම කිරීම සඳහා දිවයිනම ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාවට නැංවිය යුතු අතර, ඉගෙනුම් ප්‍රතිඵලවල ගුණාත්මක භාවය තීරණය කෙරෙන අනෙකුත් සාධක එනම්, සුරක්ෂිත ඉගෙනුම් වටපිටාවක් නිර්මාණය කිරීම, සෞඛ්‍ය හා පෝෂණ මට්ටම් නංවාලීම මෙන් ම, විශේෂයෙන් ම, අවදානමට ලක්විය හැකි ජන කාණ්ඩවල ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කිරීම යනාදිය ඉලක්ක කරගත් ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම හා ක්‍රියාවට නැංවීම සඳහා ඉහළ ප්‍රමුඛතාවක් හිමි විය යුතු ය.

මූලාශ්‍ර:

*Assessment on Achievement Levels of Foundational Skills in Literacy and Numeracy of Grade 03 Students in Sri Lanka (2023). Ministry of Education Sri Lanka.*

*Education Finance in Asia-Pacific (2022). Policy Brief. 2nd Asia Pacific Regional Education Ministers Conference.*

*Learning and Earning Losses from Covid-19 School Closures in Developing Asia. Asian Development Outlook (2021). Asian Development Bank.*

*Montenegro, C. and Petrinos, H. (2014). Comparable Estimates of Returns to Schooling Around the World. Policy Research Working Paper. World Bank.*

*Reaching Every Sri Lankan: Human Development Achievements and Challenges (2021). United Nations Development Programme.*

*Situation Analysis on the Effects of and Responses to COVID-19 on the Education Sector in Asia: Sri Lanka Case Study (2021). United Nations Children's Fund and United Nations Educational, Scientific and Cultural Organization.*

# හරිත බැංකුකරණය



**එල්.එච්.එම්.යු.එම්. ලන්සකාර**
**ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂ**
**ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**

පෘථිවිය නිර්මාණය වූ දා පටන් ම එහි සියලුම දේ ඇතිවූයේ ස්වභාවිකව වුවත් කල්යත්ම මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් කෘතිම පාරිසරික තත්ත්වයන් ගොඩනැගෙන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ මිනිස් ක්‍රියාකාරකම් මත ගොඩනැගුණ කෘෂිකාර්මික සහ කාර්මික පරිසර පද්ධති සමූහයක් අපට දැකගත හැකි ය. විශේෂයෙන් ම මිනිස් ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ඇති වී ඇති ගෝලීය උණුසුම ඉහළ යෑම ද වත්මන් පරිසර අර්බුදයන්ට හේතු වී ඇත. උදාහරණයක් ලෙස ඇමරිකා එක්සත් ජනපදයේ නිව්යෝක්හි මෑන් හැටන් නගරය ආශ්‍රිත ප්‍රදේශයේ එදා සහ අද තත්ත්වය සැසඳීමේ දී ස්වභාවික පරිසරයට සිදුව ඇති බලපෑම මැනවින් පෙන්නුම් කෙරෙයි. එබැවින් අද වන විට පෘතුවිය පුරා පැතිරී ඇති කෘතිම පාරිසරික තත්ත්වයන් හේතුවෙන් ලොව පුරා ජීවත්වන මිනිසුන්ට මෙන්ම සත්වයින්ට ද අතිමහත් අර්බුද රාශියකට මුහුණ දීමට සිදුව ඇත.

මෙවන් තත්ත්වයක් තුළ, ස්වභාවික පරිසරයට හානියක් නොවන පරිදි හෝ අවම හානියක් සිදුවන ආකාරයට මානව ක්‍රියාකාරකම් සිදු කිරීමට මෙන්ම මිනිස් හා සත්ත්ව ජීවිත පවත්වාගෙන යෑමට අවශ්‍ය වන භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා පවත්වාගෙන යෑමට අවශ්‍ය වන්නා වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කෙරෙහි වර්තමානයේ දී බෙහෙවින් ම පෙළඹී ඇති බවක් පෙනේ. එහි ප්‍රතිඵලයක් ලෙස "හරිත සංකල්පය" අද වන විට ලොව පුරා ප්‍රචලිත වී ඇත.

මිනිසා පුනර්ජනනීය බලශක්ති කෙරෙහි යොමු වීම, බලශක්ති ඉතිරි කිරීමේ ක්‍රමවේද භාවිත කිරීම, පරිසර හිතකාමී නිෂ්පාදන මිලදී ගැනීමට යොමු වීම, දිරාපත් වන අපද්‍රව්‍ය නිසිලෙස බැහැර කිරීමේ ක්‍රමවේද අනුගමනය කිරීම, කාබනික ආහාර අනුභව කිරීමට පෙළඹීම, කාර්යාලවල කඩදාසි භාවිතය අවම කිරීම ආදී ක්‍රමවේද හරහා, විශේෂයෙන් මිනිසාගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා සාගර, ගොඩබිම සහ වනාන්තර ඇතුළු ස්වභාවික සම්පත් තිරසර ලෙස කළමනාකරණය කර සංරක්ෂණය කර තිබීම හරිත සංකල්පය යටතට ගැනේ. ඒ අනුව, පෘථිවියේ ස්වභාවික පරිසරයට හානි නොවන හෝ අවම ලෙස හානි වන ආකාරයට භාණ්ඩ හා සේවා පවත්වාගෙන යෑමට අවශ්‍ය මාර්ගෝපදේශනය සහ ප්‍රතිපත්ති අනුගමනය කිරීම "හරිත සංකල්පය" යනුවෙන් නිර්වචනය කළ හැකි අතර ස්වාභාවික පරිසරයේ ශාක වැස්ම වැඩි කිරීමත් ගෝලීය උණුසුම ඉහළ යාමට හේතුවන හරිතාගාර වායු විමෝචනය අවම කිරීමත් හරිත සංකල්පයේ මූලික අරමුණ ලෙස හඳුන්වා දිය හැකි ය.


වර්තමාන ගෝලීය සහ දේශීය ආර්ථිකයක් තුළ "හරිතකරණය" යන සංකල්පය ඉතාමත් ප්‍රචලිත වී ඇත. විශේෂයෙන් ව්‍යාපාර ආයතන තම ව්‍යාපාර මෙහෙයුම් සඳහා හරිත මූලාරම්භයන් හඳුන්වාදීමේ අරමුණින් පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාවලි සඳහා විශාල වශයෙන් ආයෝජනය කරයි. එබැවින් බැංකු ක්ෂේත්‍රය ද, ගෝලීය වශයෙන් සහ දේශීය වශයෙන්, ඔවුන්ගේ දෛනික ක්‍රියාවලි සඳහා පරිසර හිතකාමී වැඩසටහන් දියත් කරමින් සහ නව්‍ය හරිත නිෂ්පාදන හඳුන්වා දෙමින් හරිතකරණය වෙමින් සිටින අතර වර්තමානයේ දී "හරිත බැංකුකරණය" බැංකු අතර

පමණක් නොව විශේෂයෙන් ම විවිධාංගිකරණය වූ මූල්‍ය සේවා සපයන්නන්, වත්කම් කළමනාකරණ ආයතන සහ රක්ෂණ සමාගම් අතරද ප්‍රචලිත ව පවතී.

හරිත බැංකුකරණය පිළිබඳ සංකල්පය මුලින් ම බටහිර රටවල ප්‍රවර්ධනය විය. පරිසරය සුරැකීමේ අරමුණින් යුතු ව හරිත බැංකුකරණය 2003 වර්ෂයේ විධිමත් ලෙස ආරම්භ කරන ලදී. එහි දී, Equator Principle (EPS)[1] හඳුන්වා දෙන ලද අතර එය Citigroup Inc" The Royal Bank of Scotland" West Pac Banking Corporation වැනි ප්‍රමුඛ පෙළේ ගෝලීය බැංකු විසින් සම්මත කරන ලදී. පාරිසරික තිරසරභව සඳහා බැංකු විසින් දක්වන සැලකිල්ල හරිත බැංකුකරණය පිළිබඳ සංකල්පයට හේතු වී ඇත. පසුව කොන්ග්‍රස් සභික ක්‍රිස් වැන් හොලන් විසින් බලශක්ති භාවිතයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම, කාබන් විමෝචනය අඩු කිරීම සහ බලශක්ති උත්පාදනය හේතුවෙන් ඇතිවන පරිසර දූෂණය අවම කිරීම සඳහා දරන උත්සාහය සඳහා අවශ්‍ය මූල්‍යමය සහයෝගය ලබාදීමට හරිත බැංකුවක් පිහිටුවීමේ අරමුණින් 2009 වර්ෂයේ දී "හරිත බැංකු පනත" හඳුන්වා දෙන ලදී.

එමෙන් ම හරිත බැංකුකරණය, පුළුල් පාරිසරික හා සමාජීය මානයක් ග්‍රහණය කර ගැනීමට නැඹුරු වන තිරසර බැංකුකරණයේ උප කුලකයක් ලෙස ද හඳුන්වා දී ඇත. තිරසර, ආර්ථික සමාජීය සහ පාරිසරික සංවර්ධනය ලඟාකර ගැනීම සඳහා මූල්‍ය භාවිත කිරීමේ හවුල් මෙහෙවරක් සහිත ස්වාධීන බැංකු ජාලයක් ලෙස වටිනාකම් මත බැංකුකරණය සඳහා වූ ගෝලීය සන්ධානය (Global Alliance for Banking on Value) හඳුන්වා දිය හැකි අතර එම සන්ධානය මඟින් තිරසර බැංකුකරණයේ මූලධර්ම අනුමත කර ඇත. එහි දී හඳුන්වා දෙන ලද ව්‍යාපාර ආකෘතිය තුළ සමාජීය, පාරිසරික හා මූල්‍ය මානයන් ඇතුළත් වන අතර එය ප්‍රජාව මත පදනම් වූ සහ විනිවිදභාවයෙන් යුතු සියලු දෙනා ම අන්තර්ගත වූවක් වේ. නමුත් මෙම නිර්වචනය සහ එහි සංකල්ප අතර බොහෝ ව්‍යාකූල තත්ත්වයන් පවතී. එබැවින් එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන (UNEP) මඟින් හරිතකරණය සහ තිරසරකරණය පිළිබඳ ව දක්වා ඇති මනා අර්ථකථන පහත රූප සටහන මඟින් දක්වා ඇත.

ඒ අනුව, හරිත බැංකුකරණය තිරසර බැංකුකරණයේ අංගයක් වන අතර හරිත බැංකුකරණයේ දී කාලගුණික




1. ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතාවය සමඟ බොහෝ බැංකු එක් ව 2002 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ දී පොදු මාර්ගෝපදේශ සකස් කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා පිහිටුවන ලද අතර 2003 වර්ෂයේ ජූනි මාසයේ දී මාර්ගෝපදේශනය සකස් කර අවසන් කරන ලදී. එය සමක මූලධර්ම (Equator Principle) ලෙස පිළිගනු ලැබූ අතර අවසානයේ එය මිණුම් සලකුණක් ලෙස සලකන ලදී. (සමක මූලධර්ම යනු ව්‍යාපෘතිවල පාරිසරික හා සමාජීය අවදානම් තීරණය කිරීම, තක්සේරු කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා මූල්‍ය ආයතන විසින් අනුගමනය කරන ලද අවදානම් කළමනාකරණ රාමුවකි.)

විපර්යාස ආශ්‍රිත අභියෝග හා කාබන් විමෝචනය අඩු ආර්ථිකයක් කරා ගමන් කිරීමේ දී මුහුණ පාන අභියෝග ජය ගැනීමට අවශ්‍ය මූල්‍ය ප්‍රවාහයන් ලබාදීම ද සිදුකරනු ලබයි.

මේ අනුව බැලීමේ දී හරිත බැංකුකරණය යනු පරිසරය ආරක්ෂා කිරීමේ සහ ස්වභාවික සම්පත් සංරක්ෂණය කිරීමේ අරමුණ ඇති ව සියලු ම සමාජීය සහ පාරිසරික සාධක සලකා බලමින් සිදුකරනු ලබන බැංකු පරිචයන් වන අතර එය සදාචාරාත්මක බැංකුකරණය හෝ තිරසාර බැංකුකරණය ලෙස ද හැඳින්වේ. එහි දී ආර්ථික, පාරිසරික සහ සමාජීය වශයෙන් බැංකු තිරසර බවට පත්කරන මාර්ගෝපදේශ සහ භාවිතයන් කෙරෙහි අවධානය යොමු වන අතර පරිසරයට ශුන්‍ය හෝ අවම බලපෑමක් ඇති කරමින් බැංකු ක්‍රියාවලිය සහ තොරතුරු තාක්ෂණය සහ භෞතික යටිතල පහසුකම් භාවිතය හැකිතාක් කාර්යක්ෂම හා ඵලදායී කිරීම මෙහි මූලික ම අරමුණ වේ.
තව ද, හරිත බැංකුකරණය මඟින් පිරිවැය ප්‍රශස්ථ කිරීමටත්, අවදානම අවම කිරීමටත් බැංකු කීර්තිය ඉහළ නැංවීමටත් සහ පාරිසරික තිරසරත්වය ඇති කිරීමටත් දායක වන අතර එමගින් බැංකුවක වාණිජ පරමාර්ථයන් මෙන්ම සමාජ වගකීම් ඉටු කරනු ලබයි.


එමෙන් ම හරිත බැංකුකරණය යන සංකල්පය තුළ පරිසරයේ අනාගත තිරසරත්වය උදෙසා දායකවන දුරදර්ශී පරිසර හිතකාමී මූලපිරීම් ඇත. එබැවින් වත්මන් බැංකුකරණය තුළ හරිත සංකල්පය ප්‍රවර්ධනය කිරීම සැබැවින් ම බැංකු ව්‍යාපාරයේ තිරසාරත්වයට මනා පිටිවහලක් වනු ඇත.

බැංකු විසින් දෛනික ව සිදු කෙරෙන බැංකු කටයුතුවල දී කාබන් භාවිතය හෝ මුදා හැරීම අඩු කර පරිසර හිතකාමී හරිත නිෂ්පාදන හෝ හරිත භාවිත ප්‍රවර්ධනය කරනු ලබන බැංකු මූලපිරීම්, හරිත බැංකුකරණය ලෙස හඳුනාගෙන ඇති අතර එය පහත පරිදි රූප සටහනක් මඟින් සංක්ෂිප්ත ව දක්වා ඇත.

**හරිත බැංකුකරණ මූලපිරීම් :-**

1. විශේෂ ඉතුරුම් ගිණුම්, උපයෝගිතා බිල්පත් පියවීම්, ණය ආපසු ගෙවීම්, ණයපත් පියවීම්, ගිණුම් ශේෂය විමසීම්, ගනුදෙනු ප්‍රකාශන නිකුත් කිරීම, නිත්‍ය විද්‍යුත් ප්‍රකාශන, විද්‍යුත් අරමුදල් මාරු කිරීම වැනි කඩදාසි රහිත බැංකු සේවාවන් සඳහා පරිසර හිතකාමී මාර්ගගත සහ ජංගම බැංකු පහසුකම් සැපයීම.

**හරිත බැංකුකරණ සංකල්පය**



2. කඩදාසි භාවිතයෙන් හැකිතාක් ඉවත් ව ස්වයංක්‍රීය මුදල් තැන්පතු යන්ත්‍ර භාවිතය හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා මුදල් ආපසු ගැනීම්, චෙක් තැන්පතු ආදිය සිදු කිරීම ප්‍රවර්ධනය කිරීම.

3. ඩිජිටල් දර්ශක සංරක්ෂිත සහ (Digital Archived) සහ ඩිජිටල් දර්ශන විමසුම් පද්ධතියක් (Digital Index Query System) සහිත ඩිජිටල් ගොනුකිරීමේ පද්ධති (Digital Filing Systems) හඳුන්වා දීම.

4. තැපැල මඟින් ලිපි හුවමාරුව සහ මුහුණට මුහුණ හමුවීම වෙනුවට විද්‍යුත් ලිපි (E-mail) හුවමාරුව සහ වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීම.

5. හරිත ණය ප්‍රවර්ධනය කිරීම සහ හරිත ආයෝජන ප්‍රවර්ධනය කිරීම.

6. හරිත උකස් ක්‍රම හඳුන්වා දීම (බලශක්ති කාර්යක්ෂම නිවාස/ගොඩනැගිලි සඳහා සහන පොලී අනුපාත සහ නියමයන්)

7. තිරසර ලෙස ස්ථාන සැලසුම්කරණය, ජල කාර්යක්ෂමතාව, බලශක්ති කාර්යක්ෂමතාව, ද්‍රව්‍ය සම්පත් සංරක්ෂණය සහ ගෘහස්ථ පරිසරයේ ගුණාත්මකභාවය සමඟින් පරිසර හිතකාමී "හරිත ගොඩනැගිලි" හඳුන්වා දීම.

8. බැංකු විසින් හරිත ප්‍රතිපත්ති සහ ප්‍රතිඥාවන් හඳුන්වා දීම.

9. හරිත බැංකු දිනයක් හෝ සතියක් වෙන් කිරීම සහ හරිත ආයතනික සමාජ වගකීම් ක්‍රියාකාරකම් මෙන්ම පරිසර ආරක්ෂණ ක්‍රියාකාරකම්වල නිරත වීම.

හරිත බැංකුකරණය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී මූලික වශයෙන් ඉහතින් සඳහන් කරන ලද කරුණු හරිත බැංකුකරණ මුලපිරීම් ලෙස හඳුන්වා දිය හැකි ය. එහි දී බැංකු විසින් පාරිභෝගික ඉල්ලුමට ප්‍රතිචාර දක්වන නිෂ්පාදන සහ සේවාවන් හඳුන්වාදෙනු ලබයි. විශේෂයෙන්

- ඉලෙක්ට්‍රොනික සහ ජංගම බැංකුකරණය මඟින් පාරිභෝගිකයින්ට ඔවුන්ගේ බැංකු අවශ්‍යතා බොහෝමයක් ඕනෑ ම වෙලාවක, ඕනෑ ම තැනක ඉටුකර ගැනීමට පහසුකම් සලසනු ලබයි.

තවද,

- ස්වයංක්‍රීය ගෙවීම් හඳුන්වා දීම තුළින් සාමාන්‍ය තැපැල මඟින් චෙක්පත් ලිවීමේ සහ යැවීමේ අවශ්‍යතාවය අඩු කරනු ලැබීමත්
- බැංකු විසින් තම පාරිභෝගිකයින්ට සහ පාර්ශ්වකරුවන්ට කඩදාසි රහිත ප්‍රකාශන, නිෂ්පාදන, තොරතුරු මාර්ගෝපදේශ සහ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීමට හැකිවීමත්
- හරිත සමාගම්වල ආයෝජනය කෙරෙහි අවධානය යොමු කරන අන්‍යෝන්‍ය අරමුදල් පිරිනැමීම සහ ප්‍රවර්ධනය කිරීමත්
- විවිධ ගෙවීම්වල දී මුදල් භාවිතයෙන් තොර ව ණය කාඩ්පත් සහ හර කාඩ්පත් භාවිතය තුළින් ගනුදෙනු කිරීමට හැකිවීමත්

හරිත බැංකුකරණය තුළින් අපට ලැබෙන සේවාවන් ලෙස හඳුන්වා දිය හැකි ය.

**හරිත බැංකුකරණයෙහි ඇති වාසි :-**

- හරිත බැංකුකරණය මඟින් අන්තර්ජාල බැංකුකරණය, SMS බැංකුකරණය සහ ATM බැංකුකරණය වැනි මාර්ගගත ගනුදෙනු භාවිත කරනු ලබන බැවින් කඩදාසි භාවිතයෙන් තොර වීම.
- ඉලෙක්ට්‍රොනික බිල්පත් ගෙවීමේ හැකියාව නොමිලේ ම ලබා දීම.
- පරිසර හිතකාමී නිෂ්පාදන සහ ව්‍යාපෘති සඳහා සහනදායී ණය පොලී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් ලබාදිය හැකි වීම.
- කඩදාසි භාවිතයෙන් තොර බැංකුකරණය තුළින් සම්පත් වඩාත් කාර්යක්ෂම ලෙස සංරක්ෂණය කර භාවිත කළ හැකි වීම.
- පාරිභෝගිකයන්ගේ ඔවුන්ගේ බැංකු ප්‍රකාශනයන් ආදිය විද්‍යුත් තැපැල මඟින් යැවීමට හැකිවීමත් ගිණුම් අතර මුදල් හුවමාරුව, බිල්පත් ගෙවීම් වැනි විවිධ ගෙවීම් පහසුවීමත් සහ නව ගිණුම් මාර්ගගත ක්‍රම ඔස්සේ විවෘත කිරීමට හැකි වීම.
- හරිත බැංකුකරණය තුළින් පරිසර හිතකාමී ක්‍රියාමාර්ග කෙරෙහි වැඩි නැඹුරුවක් ඇති

වීම නිසා පාරිසරික සංරක්ෂණය සඳහා බැංකු පද්ධතියට දායකත්වය ලබාදිය හැකි වීම.

- ශාඛා බැංකුකරණය වෙනුවට අන්තර්ජාල බැංකුකරණය තුළින් කාලය ඉතිරි වීම.

**හරිත බැංකුකරණයේ අවාසි :-**

- බොහෝ පාරිභෝගිකයින්ට හරිත බැංකුකරණ නිෂ්පාදනයන් ක්‍රියාත්මක කිරීමේ අපහසුතා පවතී. විශේෂයෙන් නවීන මෘදුකාංග පිළිබඳ ව ඇති අඩු දැනුවත්භාවය මෙයට හේතු වේ.
- හරිත බැංකුකරණ නිෂ්පාදනයන් භාවිතය පිළිබඳ දැනුවත්භාවය ලබා ගැනීම සඳහා අවශ්‍ය සහාය නිසි පරිදි නොලැබීම.
- හරිත බැංකුකරණ නිෂ්පාදන සහ සේවාවන් සඳහා ඉහළ මූලික සැකසුම් පිරිවැයක් පැවතීම.
- බැංකු ගිණුම් වෙත අනවසර පුද්ගලයින්ට (හැකර්ස්) ප්‍රවේශ විය හැකිවීමේ සම්භාවිතාව ඉහළ මට්ටමක පැවතීම සහ මෙහෙයුම් පද්ධතිවල බිඳ වැටීම් සිදු විය හැකි වීම.
- තාක්ෂණික බිඳ වැටීම් හේතුවෙන් අන්තර්ජාල බැංකු වෙබ් අඩවි වෙත ප්‍රවේශවිය නොහැකි වීම.
- නව්‍ය අදහස් හඳුනාගැනීමේ අපහසුතා.
- ආදායම් ලබාගැනීම සඳහා යම් කාලසීමාවක් ගත වීම.
- හරිත බැංකුකරණය ප්‍රවර්ධනය කිරීමේ දී බැංකු සේවකයන් පුහුණු කිරීම් සඳහා සැලකිය යුතු පිරිවැයක් දැරිය යුතු වීම.

**හරිත බැංකු නිෂ්පාදන :**

- හරිත ණය
- හරිත සංයුක්ත තැටි
- මාර්ගගත බැංකුකරණය
- ජංගම බැංකුකරණය
- හරිත ශේෂ පිරික්සුම්/ හරිත ගිණුම්/ හරිත උකස්
- හරිත ණය කාඩ්පත්, හරිත මුදල් වෙළෙඳපොළ ගිණුම්
- හරිත තැන්පතු, හරිත ත්‍යාග පිරික්සුම් ගිණුම් (Green Rewards Checking Accounts)

**හරිත බැංකුකරණයේ අභියෝග**

පුළුල් ව ගත් කල හරිත බැංකුකරණය වෙත යොමු වීම සහ ක්‍රියාත්මක කිරීම පරිසර හිතකාමී මෙන් ම අවදානම් සහ පිරිවැය අවම කරගත හැකි සංකල්පයක් වුවත් එය ක්‍රියාත්මක කිරීමේ දී පහත අභියෝගයන්ට මුහුණ පෑමට සිදුවිය හැකි ය.

- පාරිසරික හානියට හෝ පාරිසරික රෙගුලාසීවල බලපෑමට ලක්වූ ව්‍යාපාර වලට ණය ලබා දීම හේතුවෙන් බැංකුවකට මුහුණ පෑමට සිදුවිය හැකි ණය අවදානම.
- යම් බැංකුවක් පරිසරයට හානි කරන ව්‍යාපෘති සමඟ සම්බන්ධ වී සිටීම සහ යම් බැංකුවක් තම ව්‍යාපාර ගනුදෙනු හරිත බැංකු ප්‍රවර්ධනය සඳහා පමණක් ම සීමා කිරීම.
- තවද, හරිත බැංකුකරණ සේවාවන් සැපයීම සඳහා පළපුරුදු දක්ෂ සේවක මණ්ඩලයක් අවශ්‍ය වන අතර හරිත ව්‍යාපාර සහ ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීම සඳහා අමතර අත්දැකීමක් ඔවුන්ට ලබාදිය යුතු වීම සහ හරිත බැංකුකරණය සඳහා ඉහළ ආයෝජන පිරිවැයක් දැරීමට සිදු වීම.
- හරිත බැංකුකරණය බොහෝ බැංකුවලට නව්‍ය අත්දැකීමක් වන අතර එමඟින් ලාභ ඉපයීමට වසර කිහිපයක් ගත විය හැකි වීම නිසා ආරම්භක අවස්ථාවේ සිට ම ලාභ ඉපයීමට නොහැකි වීම.
- දේශගුණික අවදානම් පිළිබඳවත් විවිධ තාක්ෂණයන් පිළිබඳවත් සහ හරිත බැංකු නිෂ්පාදන සැලසුම් කිරීම සහ ප්‍රවර්ධනය පිළිබඳවත් පවතින අඩු දැනුවත්භාවය.
- හරිත බැංකුකරණය පිළිබඳ සංකල්පය කෙරෙහි ඉහළ කළමනාකාරීත්වය විසින් වැඩි වැදගත්කමක් ලබා නොදීම.

**ශ්‍රී ලංකාවේ හරිත බැංකුකරණය :-**

ශ්‍රී ලංකාවේ හරිත බැංකුකරණ සංකල්පය සඳහා මුලපිරීමක් ලෙස තිරසර බැංකුකරණය හඳුන්වා දිය හැකි ය. විශේෂයෙන් තිරසර ආර්ථික වර්ධනයට සහාය දැක්විය හැකි වගකීම් සහගත බැංකු පරිචයන් පිළිබඳව හඳුන්වා දීම සහ ඒ පිළිබඳ ව ඇති දැනුවත්භාවය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් 2015 වර්ෂයේ දී ශ්‍රී ලංකා තිරසර බැංකුකරණ මුලපිරීම් හඳුන්වා දෙන ලදී. එම මුලපිරීම් මගින් තිරසර බැංකුකරණය පිළිබඳ ව හඳුනාගත් ප්‍රතිපත්ති 11ක් එළිදක්වා ඇත. කෙසේ වෙතත් මේ වන විට ශ්‍රී ලංකාවේ බොහෝමයක් බලපත්‍රලාභී බැංකු විසින් තිරසර බැංකුකරණ කටයුතු ආරම්භ කර ඇති අතර විශේෂයෙන් තිරසර මූල්‍ය ඒකක පිහිටුවමින් පුනර්ජනනීය බලශක්තිය, ව්‍යවසායකත්ව සංවර්ධනය, පරිසර සංරක්ෂණය සහ කාන්තා සවිබල ගැන්වීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

තවද 2016 වර්ෂයේ දී අන්තර්ජාතික බැංකු ජාලයට (SBN) ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධ විය. එමෙන් ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තිරසර මූල්‍යනය පරිචයන් ප්‍රවර්ධනය කිරීමේ හා පහසුකම් සැපයීමේ අරමුණින් 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා තිරසර මූල්‍යන පෙර දැක්ම ගොඩනැංවීම ආරම්භ කරන ලද අතර 2019 වර්ෂයේ ජුනි මස දී එය ප්‍රසිද්ධියට පත් කරන ලදී. විශේෂයෙන් මෑතක දී පාරිසරික ව සහ සමාජීය වශයෙන් තිරසර ආර්ථික කටයුතු (Taxonomy) හඳුනාගනු ලබන ලැයිස්තුගත ක්‍රමවේදයන් හඳුන්වා දෙන ලදී. මේ වන විට ශ්‍රී ලංකාව තුළ බොහෝ බලපත්‍රලාභී බැංකු තිරසාර බැංකුකරණ කටයුතු ආරම්භ කර ඇත.

එපමණක් නොව බැංකු විසින් පාස් පොත් භාවිතා කරමින් සම්ප්‍රදායික ඉතුරුම් ගිණුම් පවත්වාගෙන යෑම වෙනුවට "SMART GEN" නමින් ස්මාර්ට් නිෂ්පාදන හඳුන්වා දීමත්, දින හතේ ම පැය 24 සඳහා ම කඩදාසි ගනුදෙනුවලින් තොර ස්මාර්ට් කලාප හඳුන්වා දීමත්, බැංකු අභ්‍යන්තර පරිසරය තුළ විස්තීරණ ලේඛන කළමනාකරණ පද්ධතිය (DMS) ස්ථාපිත කර තිබීමත් සියලු ණය යෝජනා සහ බැංකු කටයුතු සඳහා බැංකු සමාජ හා පාරිසරික කළමනාකරණ පද්ධතියෙහි නිර්ණායක භාවිත කිරීමත්, බැංකු විසින් 3ඍ ප්‍රතිපත්තිය එනම් (අඩු කිරීම-Reduce, නැවත භාවිතය-Re Use, ප්‍රතිචක්‍රීකරණය-Recycle) පාරිසරික ආරක්ෂණය හඳුන්වා දීමත්, විශේෂ දිරිගැන්වීම්, ප්‍රදාන, ණය සහ මඟ පෙන්වීම හරහා හරිත ව්‍යවසායන් සඳහා බැංකු විසින් ආධාර කිරීමත්, හරිත ණය යෝජනා ක්‍රම හඳුන්වා දීමත් සහ සේවක පුහුණුව සඳහා විද්‍යුත් ඉගෙනුම් යොදා ගැනීමත් හරිත බැංකුකරණය වෙත බැංකු අවතීර්ණ වීමේ අවස්ථා ලෙස දැක්විය හැකි ය. එමෙන් ම ණය ලබාදීමේ දී තීරණ ගැනීමේ දී හරිත විගණන, හරිත සම්පත් භාවිතය, පාරිසරික සහ සමාජීය කළමනාකරණ පද්ධති තවදුරටත් ක්‍රියාත්මක කිරීම පිළිබඳ ව සලකා බැලිය හැකි ය.

තවද, හරිත බැංකුකරණය දිරිමත් කිරීමට බැංකු සඳහා පහත යෝජනාවන් ඉදිරිපත් කළ හැකි ය.

- මුද්‍රණය හරහා හරිත බැංකු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, සන්නිවේදනය කිරීම
- හරිත බැංකු මුලපිරීම් පිළිබඳ නවතම තොරතුරු වෙබ් අඩවි හරහා ප්‍රචාරණය කිරීම
- විද්‍යුත් ඉගෙනුම් වැඩසටහන් හරහා අධ්‍යාපනය ලබා දීම
- වාර්ෂික පාරිසරික වාර්තාවේ අංගයක් ලෙස හරිත බැංකු කටයුතු සිදු කිරීම
- බැංකු සේවකයින්ට අදාළ පුහුණු වීම් ලබා දීම සහ කුසලතා සංවර්ධනය කිරීම
- පාරිසරික දෘෂ්ටි කෝණයට අදාළ ව නව්‍ය මූල්‍ය උපකරණ බැංකු විසින් හඳුන්වා දීම
- පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට කැමති පාරිභෝගිකයින් සඳහා හරිත අරමුදල් හඳුන්වා දීම

නමුදු, ශ්‍රී ලංකාවේ බැංකු ක්ෂේත්‍රය තුළ හරිත බැංකුකරණය තවදුරටත් දියුණු කළ යුතු ව ඇත. එබැවින් හරිත බැංකුකරණය සඳහා ප්‍රතිපත්ති රාමුවක් සකස් කර ක්‍රියාත්මක කිරීම කඩිනමින් සිදු කළ යුතු වේ. කෙසේ වෙතත්, හරිත බැංකුකරණය පිළිබඳ නිශ්චිත ප්‍රතිපත්තියක් නොමැති වුව ද, රාජ්‍ය සහ පෞද්ගලික වාණිජ බැංකු විසින් දැනටමත් යම් යම් මුලපිරීම් ගෙන ඇත. එහි දී රජය විසින් බැංකු

ක්ෂේත්‍රයේ ප්‍රවණතා සහ නව විශ්ලේෂණයන් මෙන් ම එම මුලපිරීම් නිරන්තරයෙන් නිරීක්ෂණය කළ යුතු වේ. එමෙන් ම හරිත බැංකුකරණ භාවිතයන්ගේ අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීම සඳහා සියලු ම පාර්ශ්වකරුවන්ට සහ ආර්ථිකයට එමගින් ඇති බලපෑම සහ බැංකුකරණ භාවිත පිළිබඳ ව මහජනයා දැනුවත් කිරීම ඉතා වැදගත් වේ. එහි දී බැංකු පිළිබඳ ව සහ අනෙක් පාර්ශවයන් පිළිබඳ ව දැනුම වැඩි දියුණු කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සිදු කළ යුතු වේ. තව ද, අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම තුළින් හරිත බැංකුකරණ භාවිත බැංකු තුළ ප්‍රවර්ධනය කිරීම සඳහා දිරිගැන්වීම ද සිදු කළ යුතු කාලෝචිත ක්‍රියාමාර්ගයක් වේ.

**සංක්ෂිප්තය**

හරිත බැංකුකරණය යන සංකල්පය මෑත කාලයේ දී ලොව පුරා වඩාත් ප්‍රචලිත වී ඇත. මෙම සංකල්පය සාම්ප්‍රදායික බැංකුකරණයට වඩා වෙනස් වන අතර එය පරිසර හිතකාමී බැංකුකරණය ප්‍රවර්ධනය කෙරෙහි අවදානය යොමු කරයි. විශේෂයෙන් හරිත බැංකුකරණය මගින් බැංකු වත්කම්වල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමත් පරිසර හිතකාමී ආයෝජන දිරිමත් කිරීමත් සිදු කෙරෙයි. එමෙන් ම, මෙතුළින් රටක අනාගත තිරසරබව සඳහා ධනාත්මක බලපෑමක් ද ඇති කරනු ලබන අතරම ආර්ථික වර්ධන වේගය තීව්‍ර කිරීම සඳහා ක්‍රියාකාරි භූමිකාවක් ඉටු කෙරෙයි.

එබැවින් රටේ තිරසර වර්ධනයට දායක වන හරිත බැංකු ක්‍රියාකාරකම් තුළින් බැංකු ක්ෂේත්‍රය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය මුලපිරීම් ගණනාවක් මේ වන විටත් අප විසින් ගෙන ඇති වුව ද ඒවා ක්‍රියාත්මක කිරීමේ දී වාසි අවාසි මෙන් ම අභියෝග රාශියකට මුහුණ පෑමට සිදුව ඇත. එබැවින් එය බැංකුවක තනි කාර්යයක් නොවන අතර අපේක්ෂිත හරිත වර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා වූ බහුපාර්ශ්වීය උත්සාහයකි.

මේ අනුව සමස්තයක් ලෙස ගත් කළ, හරිත බැංකුකරණය යනු පාරිසරික වශයෙන් තිරසර ආයෝජනය සඳහා සහය වන බැංකු මුල පිරීම් ලෙස හඳුන්වා දිය හැකි අතර එමගින් දිගු කාලීන තිරසර බව සඳහා අවශ්‍ය නව්‍ය සහ ඉදිරි චින්තන ප්‍රවේශයක් සපයනු ලබයි.


1) Role of banking sector in promoting green investments:

   Exploring new developments Wijethunga A.W.G.C.N & Dayaratne D.A.I Department of Accountancy& Finance, Faculty of Management Studies, Sabaragamuwa University of Sri Lanka

2) http:// greenbankingbd.com/index.php/2014-06-28-05-50-35/history-of-green-banking



# ශ්‍රී ලාංකේය ආර්ථික ඉතිහාසයේ සුවිශේෂී මං සලකුණු 1

**අරුණ ශාන්ත**
**කෞතුකාගාර පාලක, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලාංකේය වෙළෙඳ - වාණිජ ඉතිහාසයේ වත ගොත හෙළි කරන සාහිත්‍ය මූලාශ්‍රය හා ඒවායේ අන්තර්ගත විශේෂ කරුණු පිළිබඳ මූලික හැඳින්වීමක්

ශ්‍රී ලාංකේය වෙළෙඳ - වාණිජ ඉතිහාසයේ වත ගොත හෙළි කරන සාහිත්‍ය මූලාශ්‍රය හා ඒවායේ අන්තර්ගත විශේෂ කරුණු පිළිබඳ මූලික හැඳින්වීමක් සිදු කිරීම මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වෙයි. ප්‍රස්තුථ වෙළෙඳ හා වාණිජ කටයුතු පිළිබඳ මූලාශ්‍රය ප්‍රධාන පාර්ශ්ව දෙකක් යටතේ සාකච්ඡා කළ හැකි ය. ඒවා නම් සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වශයෙනි. මෙහි විශේෂ අවධානයට ලක් කෙරෙන සාහිත්‍ය මූලාශ්‍රය පාර්ශ්වය, දේශීය සාහිත්‍ය මූලාශ්‍රය හා විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය වශයෙන් වර්ග කළ හැකි ය. දේශීය සාහිත්‍ය මූලාශ්‍රය අතර ඓතිහාසික වංස කථා, අට්ඨ කථා, ධර්ම ග්‍රන්ථ, සන්දේශ කාව්‍ය ආදී කෘතිවලට වඩාත් වැදගත්කමක් හිමි වේ . වංස කථා අතර දීපවංසයත්, මහාවංසය හා මහාවංසයේ ද්වීතීය හා තෘතීය භාගවලත් වෙළෙඳාම පිළිබඳ වැදගත් තොරතුරු අන්තර්ගතය. පපඤ්චසූදනී, මනෝරථපූරණී, ජාතකාට්ඨ කථා, අත්ථසාලිනී, සම්මෝහවිනෝදනී, ධම්මපදට්ඨ කථා, පරමත්ථජෝතිකා, විසුද්ධිමග්ග වැනි අට්ඨ කථා ද මෙහි දී වැදගත් වන අතර බෝධිවංසය, ථූපවංසය, ධාතුවංසය ආදී වංස නමින් හඳුන්වන ධර්ම ග්‍රන්ථයන්හි ද සීහළවත්‍ථුප්පකරණය, සාහස්සවත්‍ථුප්පකරණය, රසවාහිනිය, සද්ධර්මාලංකාරය ආදී ධර්ම ග්‍රන්ථවල ද මයුර, තිසර, ගිරා, පරෙවි, සැළලිහිණි, හංස, කෝකිල, සැවුල් ආදී සන්දේශ කාව්‍යවල ද වෙළෙඳ ඉතිහාසයේ සුලමුල සෙවීමට උපකාර වන තොරතුරු අන්තර්ගත ය.

විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය ඉන්දීය, ග්‍රීක හා රෝම, චීන හා අරාබි වශයෙන් කොටස් කිහිපයකට බෙදා දැක්විය හැකි ය. කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍රය, දිව්‍යාවධානය ආදී මූලාශ්‍රය ශ්‍රී ලංකාවේ වෙළෙඳ - වාණිජ ඉතිහාසය හැදෑරීමේ දී ඉවහල් වන ඉන්දියානු සාහිත්‍ය මූලාශ්‍රය ය. ඇරිස්ටෝටල්ගේ ඩිමුණ්ඩෝ, ඔනෙක්සික්‍රිටස්ගේ ග්‍රන්ථය, මෙගස්තීනිස්ගේ ඉන්ඩිකා, ටොලමිගේ ජියොග්‍රැෆියා හෙවත් භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය, පෙරිප්ලස් ඔෆ් ද එරිත්‍රියන් සී, ප්‍රකෝෆියස්ගේ පර්සියානු යුද්ධ, කොස්මස්ගේ ටොපෝග්‍රැෆියා ක්‍රිස්ටියානියා, ප්ලිනීගේ නැචුරාලියා හිස්ටොරියා ආදී ග්‍රීක හා රෝම සාහිත්‍ය කෘති ද මෙහි දී සැලකිල්ලට ගත යුතු ය. ෆාහියන්; හියුංසාන්; ඉත්සිං යන චීන දේශාටක භික්ෂූන්ගේ දේශාටන වාර්තා, වජ්‍රබෝධි භික්ෂුවගේ වාර්තා, හං; ටාං; මිං; සුං; යුආන් ආදී චීන රාජකීය වාර්තා ශ්‍රී ලංකාවේ වෙළෙඳ ඉතිහාසය ගොඩනගා ගැනීමේ දී මහෝපකාරී වේ. සුලෙයිමාන්, අල් ඉද්‍රිසි, අබු සෙයිඩ්, ඉබ්න් බතුතා, ඉබ්න් හකෝලා, අල් බලධූරි ආදී අරාබි වාර්තාකරුවන් විසින් රචනා කළ දේශාටන විස්තර ද මෙරට වෙළෙඳ ඉතිහාසය ගොඩනගා ගැනීමේ දී මෙන් ම ලෝක ආර්ථික ප්‍රවණතා වටහා ගැනීමේ දී ද ප්‍රයෝජනවත් ය.

ශ්‍රී ලංකාවේ වෙළෙඳ - වාණිජ ඉතිහාසය පිළිබඳ ව කියැවෙන දේශීය මූලාශ්‍රය අතර දීපවංසය හා මහාවංසය වැදගත් වේ. කිතු වසින් 4 වන සියවසෙහි රචනා කොට ඇති දීපවංසය වංස කථා සම්ප්‍රදායෙහි පළමු වැන්න ලෙස බොහෝ පර්යේෂකයන්ගේ පිළිග ැනීමට ලක්ව තිබේ. විජයාගමනය පිළිබඳ ව සඳහන් කරනු ලබන දීපවංසය විජය සමග පැමිණි උපතිස්ස අමාත්‍යවරයා විසින් පිහිටවනු ලැබූ උපතිස්ස ගාමයෙහි වෙන් වෙන් වශයෙන් පැවති ආපණශාලා

වූ බව සඳහන් කරයි. විජය විසින් පිහිටවනු ලැබූ තම්මැන්නා නුවර ද වෙළෙඳපොළක් වූ බව දීපවංසය පෙන්වා දෙයි. දීපවංසය රචනා වී සියවසකට පමණ පසු ව ලියැවුණු එනම් කිතු වසින් 5 වන සියවසේ රචනා වූ මහාවංසයෙහි වෙළෙඳාම හා වාණිජ්‍යය සම්බන්ධ තොරතුරු ද අතරින් පතර වාර්තා වී තිබේ. පණ්ඩුකාභය රජුගේ කාල පරිච්ඡේදයේ නගරයෙහි සභාග වත්ථු නමින් යෝනයන් සඳහා වූ කොටසක් වෙන් කරනු ලැබූ බව අසන්නට ලැබේ. මෙහි සඳහන් යෝනයන් කවුරුන් ද? යන්න ප්‍රශ්නයක් වුව ද ග්‍රීක සම්භවයක් පැවැති පිරිසක් වන්නට ඇතැයි විශ්වාස කිරීම යෝග්‍ය ය. දුටුගැමුණු රජුගේ කාල පරිච්ඡේදයෙහි වාසය කළ එක් වෙළෙන්දෙක් ඉගුරු සියඹලා ආදි භාණ්ඩ ගෙන ඒම සඳහා මලය රටට යාමට පුරුදු වී සිටි බව මහාවංසයෙහි සඳහන් වේ. එමෙන් ම විහාර මහා දේවියගේ දොළ සන්සිඳුවීම සඳහා මාගම සිට අනුරාධපුරයට ගිය වේළුසුමන යෝධයා තිසා වැවෙන් පැන් ගෙන ඒම සඳහා කළයක් මිල දී ගෙන ඇත්තේ අනුරාධපුරයේ පිහිටි කුඹල් වීදියකිනි.

මහා විජයබාහු රජු චෝළ විරෝධී සටන් ව්‍යාපාරය මෙහෙයවන අතරතුර දී බුරුමය සමග වෙළෙඳ සබඳතා පවත්වා ඇති බවට මහාවංසයේ දෙවන භාගයෙහි සඳහන් විස්තරයකින් අනාවරණය වේ. පොළොන්නරු අවධිය වන විට මාතරට නුදුරු වැලිගම වෙළෙඳ නගරයක් ලෙස දියුණුව පැවති බව මහාවංසයෙහි දෙවන භාගයෙහි සඳහන්ව තිබේ. දෙවන ගජබාහු රජු පිළිබඳ තොරතුරු සෙවීම සඳහා පරාක්‍රමබාහු කුමරු යොදා ගත් එක් උපක්‍රමයක් ලෙස මහාවංසයේ දෙවන භාගය විස්තර කරනුයේ කදා වළලු විකුණන වෙළෙන්දන් ලෙස වෙස්වලා ගත් චර පුරුෂයින් යොදවනු ලැබීමයි. මහා පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය සමයේ රාජ සභාවේ සිටි සිටුනාවෙකු පිළිබඳ ව මහාවංසයේ දෙවන භාගයෙහි විස්තර ව තිබේ. මහා පරාක්‍රමබාහු රජු විසින් බුරුම දේශය ආක්‍රමණය කරනුයේ වෙළෙඳාම පිළිබඳ ව දෙරට අතර පැනනැගි ගැටලු කිහිපයක් විසඳා ගැනීමට නොහැකි වූ අවස්ථාවේ දී බව එහි එන විස්තරය අනුව ප්‍රකට වේ. තව ද මහාවංසයෙහි ම කෙරෙන විස්තරයකට අනුව මහා පරාක්‍රමබාහු රජු දක්ඛිණ දේශයේ උපන් මැණික් විකුණා මුදල් ලබා ගත් බව ද කියැ වේ. කිතු වසින් 8 වන සියවසේ සිට කිතු වසින් 11 වන සියවස දක්වා කාල පරිච්ඡේදය අතර රචනා වූයේ යැයි විශ්වාස කරන මහාවංස ටීකාව හෙවත් වංසත්ථප්පකාසිනිය ද වෙළෙඳ - වාණිජ ඉතිහාසය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් ලබා දෙන්නකි. දේවානම්පියතිස්ස රජු අශෝක අධිරාජ්‍යයාහට යැවූ පුද පඬුරු අතර වටිනා මැණික් මෙන් ම විවිධ වර්ගවලට අයත් බෙල්ලන් විශේෂ ද වූ බව සඳහන් කරයි. මේවා වෙළෙඳ වාණිජ පදනමකින් නොයැවුව ද, අන්තර්ගතය අනුව එහි ආර්ථික අරමුණක් ද වූ බව වැටහෙයි. මීට අමතර ව භාතිකාභය රජුගේ රාජ්‍ය සමයේ රෝමනුක්ඛ නම් රට කට යැවූ දූත පිරිසක් මෙන් ම ඔවුන් විසින් ගෙන ආ රතු පබළුවලින් අලංකෘත කොට මහාසෑය හෙවත් රුවන්වැලිසෑය උදෙසා කළ පූජාවක් පිළිබඳ ව ද තොරතුරු අන්තර්ගත ව තිබේ.

මෙම මූලාශ්‍රයවලට අමතර ව පාලි අට්ඨ කථා මගින් ද වරින් වර වෙළෙඳ වාණිජ ඉතිහාසය හා සම්බන්ධ වැදගත් තොරතුරු කිහිපයක් ම අනාවරණය වේ. මේ අතුරින් විශුද්ධිමග්ගයෙහි සඳහන් විශාඛ නම් ඉන්දියානු කෙළඹි පුත්‍රයෙකුගේ කථාව වැදගත් වෙයි. පැවිදි වීමට සිතා ලක්දිවට නැව් නැගීම සඳහා විශාඛ කෙළඹි පුත්‍ර තෙම නැව් තොටට පැමිණිය ද ලක්දිව බලා යන නැව මසක් පමණ ප්‍රමාද වන බව ඇසූ ඔහු තමා සන්තකයේ පැවති කහවණුව වියදම් කොට සුළු ව්‍යාපාරයක් ආරම්භ කර මසකින් කහවණු දහසක් උපයා ගත් බව සඳහන් වේ. මෙමගින් මෙරට හා ඉන්දියාව අතර පැවති නාවික ගමනාගමනය පිළිබඳ ව හා එහි ස්වභාවය පිළිබඳ ව මෙන් ම නාවික තොටුපළ ආශ්‍රිතව පැවති වෙළෙඳ ව්‍යාපාරවල ස්වරූපය ගැන ද යම් අවබෝධයක් ලබා දේ. සද්ධාතිස්ස රාජ්‍ය සමයේ දී නගරයේ වෙළෙඳසල්වල පැවති භාණ්ඩ අතර මස් මාංස ද වූ බව පෙනෙයි. රජුගේ දොළක් සන්සිඳුවීම සඳහා සේවකයෙකු යොදවා වෙළෙඳ පොළින් මිල දී ගත් වටු මස් පිළිබඳ ව අංගුත්තර නිකාය අටුවාවෙහි සඳහන් ව තිබේ. නිගම යනු කුමක් ද? යන්න පැහැදිලි කිරීමේ දී මහා නිද්දේස අට්ඨ කථාව ලබා දෙන අර්ථකථනය වැදගත් වෙයි. නිගම යනු ආපණශාලා සහිත කඩවීදිවලින් ගැවසුණු ගම් යනුවෙන් එහි අරුත් සපයා තිබේ. සාහස්සවත්ථුප්පකරණය හා සීහළවත්ථුප්පකරණ යන පැරණි කෘති යුගලයෙහි ද මෙරට වෙළඳ - වාණිජ ඉතිහාසය පිළිබඳ වැදගත් තොරතුරු කිහිපයක් අන්තර්ගත ය. සාහස්සවත්ථුප්පකරණයේ විස්තර



මහාවංසය - https://www.lankavnews.com/


කෙරෙන ආකාරයට මහා විජයබාහු රජු විසින් චෝළ විරෝධි සටන් ව්‍යාපාරය මෙහෙයවන අවස්ථාවේ ලක්දිව දකුණු මුහුදු තීරයට සේන්දු වී තිබූ බුරුම නැව්වල සංඛ්‍යාව හැටක් බවත් ඒවා පට පිළි පටවා ගෙන පැමිණි බවත් අසන්නට ලැබේ. සද්ධාතිස්ස රජුගේ රාජ්‍ය සමයේ මිහින්තලයේ පිහිටා තිබූ කඩවීදියක් පිළිබඳවත් අනුරාධපුරයේ ජීවත් වූ ධනවත් වෙළෙඳ පවුලක් පිළිබඳවත් සීහළවත්ථුප්පකරණයෙහි අසන්නට ලැබේ.

කිතු වසින් 13 වන සියවස තරම් කාල පරිච්ඡේදයක රචනා වූ රසවාහිනියේ ද මහාවංසය හා සීහළවත්ථුප්පකරණය වැනි සාහිත්‍ය මූලාශ්‍රයන්හි විස්තර කරනු ලබන තොරතුරුවලට සමාන ඒවා අන්තර්ගත වේ. ජාතක අටුවා ගැටපදය පෙන්වා දෙන පරිදි නිගම යනු අංගාණි හෙවත් කඩවීදි සහිත මහාග්‍රාම බවත් සත්ථවාහන කුල යන්න සඳහා වෙළෙඳ කුල යනුවෙනුත් අර්ථ දක්වා තිබේ. විමතිවිනොදනී අමාවතුර ධර්මප්‍රදීපිකාව හා අටදා මහ සන්නය යන පොළොන්නරු අවධියට අයත් කෘතිවල ද වෙළෙඳ භාණ්ඩ හා වෙළෙඳපොළ පිළිබඳ විස්තර කිහිපයක් අන්තර්ගත වේ. ගම්පොළ අවධියෙහි රචනා වූ මයූර සන්දේශය නගරම් සිටු නම් තනතුරක් පිළිබඳ ව සඳහන් කරයි. නගරම් සිටු යනු වෙළෙඳ ශ්‍රේණියක ප්‍රධානියා යන්නයි. කෝට්ටේ අවධියෙහි රචනා වූ ගිරා සන්දේශයෙහි වෙළෙඳාම්වල නිරත වූ කාන්තාවන් පිළිබඳ ව ගෙනහැර දැක්වෙයි. හංස සන්දේශයෙහි කැලණි ගංගාවේ ඔරු පාරු මගින් වෙළෙඳාම් කළ වෙළෙන්දන් පිළිබඳ ව සඳහන් කර තිබෙයි. කඩපිල්වල වෙළෙඳාම සඳහා පැවති සාමාන්‍ය භාණ්ඩවලට අමතර ව වටිනා මැණික් වර්ග ආදිය ද තිබූ බව මයූර, ගිරා, හංස, කෝකිල, පරවි, සැවුල් යන සන්දේශ කාව්‍යවල විස්තර කෙරේ. එමෙන් ම එහි යොන් වෙළෙඳුන්ගේ වෙළෙඳපොළ කිහිපයක් පිළිබඳ ව ද එක් එක් නගරවල පැවති ඓශ්වර්යය පිළිබඳ ව ද සඳහන් කොට තිබේ.

ශ්‍රී ලංකාව පිළිබඳ ව කෙරෙන විදේශීය මූලාශ්‍රය සඳහන්වල දී ආර්ථික ඉතිහාසය කෙරෙහි යොමු කොට ඇති අවධානය සෙසු කරුණුවලට වඩා වැඩි ය. ඇතැම් මූලාශ්‍රය බොහෝ විට ආර්ථික කරුණු ගෙනහැර දැක්වීමට පමණක් ම අවධානය යොමු කර තිබීම විශේෂත්වයකි. මෙරට වෙළෙඳ - වාණිජ ඉතිහාසය හැදෑරීම උදෙසා ඉවහල් වන විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය අතුරින් ග්‍රීක හා රෝම මූලාශ්‍රයවලට හිමිවන්නේ වැදගත් ස්ථානයකි. ශ්‍රී ලංකාව පිළිබඳ ව සටහන් සහිත පළමු ග්‍රීක වාර්තාව ඇරිස්ටෝටල් විසින් රචිත ඩිමුණ්ඩෝ නම් ග්‍රන්ථයයි. ග්‍රීක ජාතික ඔනෙක්සික්‍රිටස් විසින් රචිත ග්‍රන්ථයෙහි වයඹ දිග ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර පැවති වෙළෙඳ සබඳතා පිළිබඳ තොරතුරු කිහිපයක් අනාවරණය වෙයි. ඔනෙක්සික්‍රිටස් යනු මහා ඇලෙක්සැන්ඩර් රජු යටතේ සේවය කළ සෙන්පතිවරයෙකි. ලක්දිව සිට ඉන්දියාවේ වයඹ දිග ප්‍රදේශ වෙත යාත්‍රා කිරීම උදෙසා දින විස්සක්වත් ගත වූ බව හෙතෙම සඳහන් කරයි. එකල වෙළෙඳාම සඳහා භාවිත වූ නෞකා ශක්තියෙන් අඩු බවත් මෙරට සිටි අලි ඇතුන් ඉන්දියානු අලි ඇතුන්ට වඩා ප්‍රමාණයෙන් විශාල බවත් සටන්කාමී බවින් වැඩි බවත් හෙතෙම වැඩි දුරටත් සඳහන් කරයි. මෙම විස්තරවලින් සමහරක් අතිශයෝක්තියෙන් යුතු වන නමුදු වෙළෙඳ - වාණිජ සබඳතා පිළිබඳ ව ලක්දිව ඉසිලූ කීර්තිය ක්‍රිස්තු පූර්ව සමයේ සිට ම පවත්වා ගෙන ඇති බව පෙනෙයි. ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ

ඉන්දියාවේ චන්ද්‍රගුප්ත මෞර්ය රජුගේ රාජ සභාවේ සිටි ග්‍රීක තානාපතියෙකු වූ මෙගස්තීනිස් විසින් රචිත ඉන්ඩිකා නම් වූ කෘතිය ද වෙළෙඳ - වාණිජ ඉතිහාසය අධ්‍යයනය කිරීම විෂයෙහි ඉවහල් වන කරුණු කිහිපයක් ම අන්තර්ගත ය. ඉන්ඩිකා ග්‍රන්ථය දැනට විද්‍යමාන නොවූව ද ඉන් උපුටාගත් උද්ධෘත වෙනත් ග්‍රීක රෝම කෘති කිහිපයක ම දක්නට ලැබේ. ලක්දිව ස්ටේඩියා 700ක් දිගින් හා ස්ටේඩියා 500ක් පළල රාජ්‍යයක් බව මෙගස්තීනිස් සඳහන් කරයි. ගංගාවකින් මෙරට දෙකට බෙදී ඇති බවත් ඉන් එක් කොටසක පැලිගෝනි නම් මිනිස් වර්ගයක් වාසය කළ බවත් ඔවුන් රන් හා මැණික් නිපද වූ බවත් ඉතිරි කොටසේ අලීන් සහ වන සතුන් සිටි බවත් මෙගස්තීනිස් වැඩි දුරටත් සඳහන් කර සිටියි. එහෙත් මෙම විස්තරවලින් ඇතැම් ඒවා ලක්දිව පිළිබඳ සැබෑ තතු නොදත් මෙගස්තීනිස් විසින් අතිශයෝක්තියෙන් ගෙතු ඒවා බව විශ්වාස කෙරේ.

ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ සිටි භූගෝල ශාස්ත්‍රඥයෙකු හා ගණිතඥයෙකු වූ ග්‍රීක ජාතික ඉරටෝතීනිස් ලක්දිව පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කොට ඇති ලේඛකයෙකි. මෙරටෙහි නගර නොතිබූ බවත් ගම්මාන හත්සියයක් පමණ පැවති බවත් සිය කෘතිය මගින් විස්තර කොට තිබේ. මීට අමතර ව ලක්දිව නැවියන් වෙළෙඳාම සඳහා ශක්තිමත් නැව් භාවිත කළ බවත් ඉන්දියාව හා ලංකාව අතර ගමන් කිරීමට දින හතක් පමණ ගත වූ බවත් ඉරටෝතීනිස් සඳහන් කරයි. මෙම විස්තරය අනුව මෙකල ලක්දිව පැවති නාවික ශක්තියෙහි තත්ත්වය ද කියාපායි. එපමණක්



ටොලමිගේ ලෝක සිතියම හා එහි නිරූපිත අතීත ශ්‍රී ලංකාව https://digitalmapsoftheancientworld.com

නොව, මුහුදේ දී ගොඩබිම සොයා ගැනීම උදෙසා නාවිකයින් පක්ෂීන් භාවිත කළ බව ද ඉරටෝතීනිස් වැඩි දුරටත් සඳහන් කර සිටියි. සාගර තරණයේ යෙදුනු නාවිකයින්හට උපදෙස් දීම උදෙසා රචනා වූ පෙරිප්ලස් ඔෆ් ද එරිත්‍රියන් සී නමැති කෘතිය ද මෙරට වෙළෙඳ වාණිජ ඉතිහාසය හැදෑරීමේ දී ඉවහල් කර ගත හැකි ග්‍රීක සාහිත්‍ය මූලාශ්‍රයකි. මෙහි කතුවරයා කවරෙකුද යන්න සඳහන් නොවේ. පෙරිප්ලස් එෆ් ද එරිත්‍රියන් සි කතුවරයා මුතු, මැණික්, කපු පිළි නිෂ්පාදනය කරන රාජ්‍ය ලැයිස්තුවට මෙරට නම ද එක් කොට තිබේ. ටොලමි විසින් කිතු වසින් දෙවන සියවසේ දී පමණ රචනා කළ භූගෝල ශාස්ත්‍ර ප්‍රවේශය නම් කෘතියෙහි මෙරට පැවති වෙළෙඳ වරාය පිළිබඳ ව සිතියමක් සපයා තිබේ. මෙම සිතියම ටොලමිගේ විස්තරය අනුව පසුකාලීන ව සැකසූ එකක් බවට ද විශ්වාස කරන නමුත් ලක්දිව සිතියමකට නැගූ පළමු අවස්ථාව මෙය ලෙස සලකනු ලැබේ.

ඉතියෝපියානු වෙළෙන්දන් හා පර්සියානු වෙළෙන්දන් අතර මෙරට වෙළෙඳාම කෙරෙහි ඇති කරගත් තරගය පිළිබඳ ව කිතු වසින් හය වන සියවසේ විසූ ප්‍රකෝපියස් විසින් රචිත පර්සියානු යුද්ධ නම් කෘතියෙහි වාර්තා කොට ඇත. මෙරට දී පට පිළි ලබා ගැනීම සඳහා ඉතියෝපියානු වෙළෙන්දන්හට පර්සියානු වෙළෙන්දන් ඉඩ ලබා නොදුන් බව මෙහි සඳහන් ය. කිතු වසින් හය වන සියවසේ දී ම කොස්මස් නම් ලේඛකයා විසින් රචනා කළ ටොපෝග්‍රැෆියා ක්‍රිස්ටියානා නම් කෘතියෙහි මෙරට වෙළෙන්දන් විසින් ගෙන ගිය අතරමැදි වෙළෙඳාම ගැන තොරතුරු රැසක් වාර්තා කොට ඇත. චීනය වැනි රටවලින් පට රෙදි, සඳුන් දර, ආදී වෙළෙඳ භාණ්ඩ ගෙන් වූ ලක්දිව වෙළෙන්දන් ඒවා ඉන්දියානු, පර්සියානු හා ඉතියෝපියානු වෙළෙන්දන්හට ලබා දී ඔවුන්ගෙන් ලබා ගත් භාණ්ඩ වෙනත් රටවලට අපනයනය කළ බව මෙහි සඳහන් ව ඇත. එලෙස අපනයනය කළ රටවල් අතුරින් මාලේ, තලියාන, සින්දු හා පර්සියාව යන ප්‍රදේශ වැදගත් වූ බව සඳහන් ය. මීට අමතරව පර්සියානු වෙළෙන්දන් විසින් ගෙන ආ අනර්ඝ අශ්වයින් පිළිබඳ ව මෙන් ම ඔවුන්හට තීරු බදු අය කිරීමකින් තොර ව අශ්වයින් වෙළෙඳාම් කිරීමේ අවසරය හිමි වූ බව ද, කොස්මස් සිය කෘතියෙහි සඳහන් කොට තිබේ. ලක්දිව දිග පළල ගෞඩියා තුන්සියය බැගින් වූ බව ද මෙම කෘතියෙහි සඳහන් වේ.


කිතු වසින් පළමු වන සියවසේ සිටි රෝම ලේඛක ප්ලිනී විසින් රචනා කරන ලද නැචුරාලියා හිස්ටෝරියා නමැති කෘතය ලක්දිවෙන් රෝමයට ගිය දූත කණ්ඩායමක් පිළිබඳ ව වාර්තා කරයි. භාතිකාභය රාජ්‍ය සමයේ රෝමනුක්ඛ නම් රටට ගිය දූත පිරිසක් පිළිබඳ ව සඳහන් කරන මහාවංස ටීකාව හෙවත් වංසත්ථප්පකාසිනීයෙහි දැක්වෙන දූත ගමන ද මෙය ම විය හැකි ය. රතු මුහුදේ අය බදු එකතු කරමින් සිටි ප්ලොකෙමස් අහම්බෙන් ලක්දිවට ගොඩබැසීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම දූත ගමන සිදු වූ බව සඳහන් ය. ශ්‍රී ලංකාවේ සිට රෝමයට ගිය දූත පිරිස අහසේ පිහිටි ඇතැම් තාරුකා රටා දැක පුදුමයට පත් වූ බවත් ඔවුන් මෙවැනි තාරකා රටා කිසි කලෙකත් තම රට දී නොදුටු බව ප්‍රකාශ කළේ යැයි ප්ලිනී සඳහන් කරයි. එමෙන් ම මෙරට නගර 500ක් තිබූ බවත් එහි ප්‍රධාන නගරය පැලැසිමුන්ඩු නමින් හැඳින් වූ බවත් එහි ම සඳහන් වේ. මෙරට හා චීනය අතර වෙළෙඳ සබඳතා පවත්වා ගෙන ගියේ ය යන ප්‍රවෘත්තිය මෙහි දී වඩාත් සැලකිල්ලට ලක් විය යුතු වේ. ඇමීනස් මර්සලිනස් විසින් රචනා කරන ලද වාර්තාවක ජුලියන් රාජ්‍ය සමයේ රෝමයට ගිය ලාංකේය දූත පිරිසක් පිළිබඳ ව ද සඳහන් වේ. මෙම දූත ගමන් වෙළෙඳ සබඳතා තහවුරු කර ගැනීම උදෙසා පිටත් කළ ඒවා ම වන්නට ඇතැයි සිතිය හැකි ය.

ශ්‍රී ලංකාවේ වෙළෙඳ - වාණිජ ඉතිහාසය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී චීන මූලාශ්‍රය මගින් ලැබෙන දායකත්වය ද ඉහළ අගයක් ගනී. කිතු වසින් පළමු වන සියවස පමණ සිට චීනය සමග මෙරට පැවැත් වූ සබඳතා ගැන අනාවරණය වේ. කිතු වසින් 97 දී ශ්‍රී ලංකාවේ සිට චීනයට යැවූ භාණ්ඩ අතර ඇත්දත්, මීහරක් මෙන් ම මොල්ලිය සහිත ගවයින් ද සිටි බව සඳහන් වේ. කිතු වසින් 120, 121, 405, 428, 430, 435, 515, 523, 527, 531 යන වර්ෂවල දී ද ලක්දිවින් දූත පිරිස් චීන රාජ සභාව වෙත ගිය බව කියැවෙයි. චීනය හා පැවති දිගු කාලීන සබැඳියාවත් බුදුදහමින් පෝෂණය වූ සංස්කෘතියේ ආභාසයත් හේතුවෙන් වෙළෙඳ - වාණිජ සබඳතා මෙන් ම දෙරට අතර සංස්කෘතික සබඳතා ද ශක්තිමත් කිරීමට හේතු වූ බව පෙනෙයි. මෙම සබඳතා කොතරම් ප්‍රබල වූයේ ද යත් කිතු වසින් 405 දී ජේඩ් ගලින් කළ ප්‍රතිමාවක් මෙරට සිට චීනයට වැඩමවා ඇත. මෙම සංස්කෘතික සබඳතාව කොතරම්

ප්‍රබල වූයේ ද යන්න පෙනෙනුයේ කිතු වසින් 412 දී අභයගිරි විහාර සංකීර්ණයට පැමිණි ෆාහියන් නම් චීන දේශාටන භික්ෂුවගෙනි. උන්වහන්සේ වසර දෙකක් වැනි කාලයක් මෙරට ගත කරමින් අප රට පිළිබඳ වැදගත් තොරතුරු සමුදායක් සටහන් කර තිබේ. මේ අතුරින් ලක්දිව ජනාවාසවීම පිළිබඳ ව ෆාහියන් හිමියන් ගෙනහැර දක්වන විස්තරය ඈත අතීතයේ සිට ම වෙළෙඳ වාණිජ පදනම ජනාවාස බිහිවීම කෙරෙහි ඉවහල් වූවා ද යන්න සිහි කැඳවන්නකි.

ෆාහියන් විස්තරයේ සටහන් ව ඇති පරිදි දුරාතීතයේ මෙරට වාසය කොට ඇත්තේ මිනිසුන් නොව යක්ෂයින් ය. ඔවුහු මිනිස් ඇසුරට අකමැති වූවෝ මෙරට වෙළෙඳ කටයුතුවලට පැමිණි පිරිස් සමග මුහුණට මුහුණලා ගනු-දෙනු නොකළහ. මිල සටහන් කොට තබා ඔවුහු නොපෙනී සිටි බවත් සටහන් කළ මිල තබා වෙළෙඳුන් එම භාණ්ඩ රැගෙන ගිය බවත් එම විස්තරයේ සඳහන් වේ. මෙලෙස වරින් වර පැමිණි වෙළෙඳ කණ්ඩායම් දිවයින කෙරෙහි ආකර්ෂණය වූයෙන් මෙහි පදිංචිව මිනිස් ජනාවාස බිහි කර ගත් බව ෆාහියන් හිමියන් සටහන් කරයි. අභයගිරි විහාර සංකීර්ණය පිළිබඳ ව ෆාහියන් හිමියන් කර ඇති විස්තරයේ හරිත වර්ණ මාණික්‍යයෙන් සැකසූ අඩි 22ක් පමණ උස බුදු පිළිමයක් ගැන සඳහන් කරයි. මෙම බුදු පිළිමයට පූජා කර තිබූ චීන අවානක් උන්වහන්සේ දුටු බවත් සිය රට සිහි වී නෙතට කඳුළක් ඉනු බවත් එම විස්තරයෙහි තවදුරටත් සටහන් වේ. ෆාහියන් හිමියන් විසින් රචිත බටහිර ලෝකයේ බෞද්ධ වාර්තා නම් දේශාටන විස්තරය අනුව පෙනී යනුයේ උන්වහන්සේ මෙරට හා චීනය අතර පැවති වෙළෙඳ සබඳතා ප්‍රත්‍යක්ෂයෙන් ම අවබෝධ කර ගෙන සිටි බවයි.

වසර දෙකක කාලයක් අභයගිරි විහාරයේ ගත කළ ෆාහියන් හිමියන් මහීසාංසක නිකායට අයත් විනය පිටකයේ පිටපත් ද රැගෙන තම රට බලා යාත්‍රා කිරීමට ලක්දිවින් නැව් නැග්ගේ ය. මෙම කරුණින් පැහැදිලි වන එක් සාධකයක් නම් කිතු වසින් 5 වන සියවස පමණ වන විට චීනය දක්වා යාත්‍රා කළ නැව් ලක්දිව සිට ගමන් ආරම්භ කළ බවයි. එම නැව් එක දිගට ම චීනය වෙත ගියේ ද? නැතහොත් අග්නිදිග ආසියානු කලාපයේ දී වෙනත් නැවක් වෙත මාරු වී චීනය දක්වා යාමට පහසුකම් සැපයුවේ ද? යන්න පිළිබඳ තොරතුරු අල්ප වේ. එහෙත් මෙම මුහුදු ගමන අතිශය


法顯傳一卷
東晉沙門 法顯自記遊天竺事
法顯昔在長安慨律藏殘缺於是遂以弘始
二年歲在己亥與慧景道整慧應慧嵬等同
契至天竺尋求戒律初發跡長安度隴至乾
歸國夏坐夏坐訖前行至耨檀國度養樓山
至張掖鎮張掖大亂道路不通張掖王慇懃
遂留為作檀越於是與智嚴慧簡僧紹寶雲

පාහියන් හිමිගේ 'බටහිර ලෝකයේ බෞද්ධ වාර්තා' නම් කෘතියේ පළමු පිටුව - ක්‍රි.ව.12වන සියවසේ චීන ලී කුට්ටි මුද්‍රණය https://en.wikipedia.org/wiki/Faxian

භයානක ජීවිත අවදානම් සහිත වූවක් බව ෆාහියන් හිමියන්ගේ ම විස්තර මගින් සනාථ වේ. ලක්දිවින් යාත්‍රා කළ ඔවුන්හට චණ්ඩ මාරුතයකට මුහුණදීමට සිදු වූ ආකාරයත් ඉන් නෞකාව සිදුරුව ඉතා අපහසුවෙන් යවද්වීපයට ගොඩබැසි ආකාරයත් එහි දී චීනය දක්වා යන වෙනත් නැවකට මාරු වූ ආකාරයත් උන්වහන්සේ කදිමට විස්තර කර තිබේ. මෙම විස්තරයෙන් පෙනෙනුයේ, යවද්වීපය නමැති ප්‍රදේශය මේ වන විට පහසුකම් සපයන කලාපයක් ලෙස චීනයට යාත්‍රා කරන නාවිකයින් වෙනුවෙන් කටයුතු කළ වගයි. යවද්වීපය යනු සුමාත්‍රාව ද එසේත් නොමැති නම් ජාවා දිවයින

ද යන්න පිළිබඳ ව පර්යේෂකයන් අතර එකඟතාවක් නොපවතියි. ෆාහියන් හිමියන් ලක්දිව සිට චීනය බලා යෑමට පිටත් වූ නෞකාවේ මිනිසුන් 200ක් දෙනෙකු ගමන් කළ බව ෆාහියන් සටහන් කර සිටියි. එමෙන් ම යවද්වීපයේ දී චීනය බලා යාමට ගොඩ වූ නෞකාවේ ද එවැනි ම පිරිසක් රැගෙන ගිය බව උන්වහන්සේ කියා සිටියි. මෙමගින් වටහා ගත යුතු වනුයේ මෙකල පැවති නාවික තාක්ෂණයේ දියුණුවයි. මිනිසුන් 200ක් ගෙන යා හැකි නෞකාවක් යනු තත්කාලීන නාවික තාක්ෂණය පිළිබඳ විමතියට පත් කරවන්නකි. මේවා ඉතා ඉහළ තාක්ෂණයකින් යුතු වූවා විය යුතු ය. මිනිසුන්ට අමතර ව මෙම නෞකා භාණ්ඩ ද විශාල ප්‍රමාණයක් පටවා ගත් ඒවා බැවින්, මේ පිළිබඳ ව අවධානය යොමු කිරීම ඉතා වටියි. ෆාහියන් භික්ෂූන් වහන්සේ ගොඩ වූ නෞකා දෙක ම වෙළෙඳ නෞකාවන් වූ බවත් මගී ප්‍රවාහණය සිදු කරන ලද්දේ ද මෙවැනි නෞකාවන්ගෙන් ම බවත් මෙම සාධකවලින් පෙනී යයි.

මෙරට හා චීනය අතර පැවති සංස්කෘතික සබඳතා ද බොහෝ විට වාණිජ පරමාර්ථ ඇතුළත ක්‍රියාත්මක වූවක් බවට සැක නැත. ඒ මෙවැනි සංස්කෘතික සබඳතා ඔස්සේ සිදු කරනු ලබන ගනු-දෙනු බොහෝමයක දී පුද පඬුරු ආදිය හුරුමාරු කර ගැනීම් සිදු වන බැවිනි. කිතු වසින් 426 දී හා කිතු වසින් 429 දී ලක්දිව සිට චිනයට ගිය භික්ෂුණීන් වහන්සේලා එකොළොස්නමකගේ මූලිකත්වයෙන් කිතු වසින් 434 දී ඇරඹි චීන භික්ෂුණී ශාසනය මෙහි දී සැලකිය යුත්තකි. ලක්දිව සිට චීනය දක්වා මෙකල නාවික ගමනාගමනය ශක්තිමත් ව පැවති බව පෙනෙනුයේ කාබුල් නුවර රජුගේ මුණුබුරෙකු වූ ගුණවර්මන් නම් භික්ෂුව චීනය බලා යාත්‍රා කිරීම සඳහා ලක්දිවට පැමිණ මෙහි තොටුපළකින් නැවු නැගි බව සඳහන් වන හෙයිනි. මීට අමතර ව නාන්තේ නමැති මූර්ති ශිල්පියෙකු විසින් ලක්දිවින් භික්ෂූන් වහන්සේලා පස් නමක් චීනයට වැඩමවනු ලැබූ බවත් මෙරට අධ්‍යාපනය ලද සංඝභද්‍ර නම් භික්ෂුව සිය ආචාර්යවරයා ද සමග චිනය බලා යාත්‍රා කළේ ලක්දිවින් බවත් අසන්නට ලැබේ. මෙම තොරතුරු මගින් පෙනී යන්නේ කිතු වසින් 5 වන සියවසේ පමණ සිට 7 වන සියවස පමණ දක්වා කාලයෙහි චීනය දක්වා යාත්‍රා කළ බොහෝ දෙනෙකුහට ලක්දිවට පැමිණ චීනය බලා යාත්‍රා කිරිමට සිදු වූ බවයි. මෙමගින් චීනය දක්වා ඍජු නාවික ගමනාගමනයක් පැවති බව නොකියවෙතත් අවම වශයෙන් අග්නිදිග ආසියාවේ නාවික තොටුපළ වෙත යාත්‍රා කිරීමෙන් පසු චීනය වෙත යාත්‍රා කිරීමේ පහසුකම් ලැබුණු බවක් හැඟවේ. කිතු වසින් 6 වන සියවසේ පා ඕ චං විසින් රචනා කරන ලද පි-චියු-නි-චුවාන් ග්‍රන්ථයෙහි මෙරට සිට චිනයට වැම කළ භික්ෂුණීන් වහන්සේලා පිළිබඳ තොරතුරු ඇතුළත් වේ. කිතු වසින් 607 දී පමණ චීනයේ සිට ලක්දිවට පැමිණි දූත පිරිසක් පිළිබඳ චීන වාර්තාවන්හි ගෙනහැර දැක් වේ.

මෙම කාල වකවානුවට ම ආසන්න අවධියක දී ඉන්දියාවට පැමිණි චීන දේශාටක භික්ෂුවක වූ හියුංසාන් හිමියන්ගේ භ්‍රමණ වෘත්තාන්ත නම් කෘතිය ද ලක්දිව වෙළෙඳ - වාණිජ ඉතිහාසය හැදෑරීමේ දී මහෝපකාරී වේ. මෙරට ජනාවාස වීම පිළිබඳ සිංහබාහු පුරාවෘත්තයට බෙහෙවින් සමාන කථා පුවතක් හියුන්සාන් හිමියන් ඉදිරිපත් කරයි. මෙම විස්තරයෙහි සිංහයා මැරීම නිසා රටින් පිටුවහල් කරනුයේ ඔහුගේ පුත්‍රයායි. හෙතෙම මෙරටට ගසා ගෙනවිත් වරින් වර මැණික් මිලදී ගැනීම සඳහා ලක්දිවට පැමිණි වෙළෙන්දන් මරා ඔවුන්ගේ දරුවන් රඳවා ගෙන කෙටි කලෙකින් ඔවුන්ගේ ද සහය ගෙන ලක්දිව පාලකයා බවට පත් වූ බව එහි විස්තර වේ. හියුන්සාන් හිමියන් දක්වනු ලබන මීළඟ කතා පුවතේ දී, හෙතෙම සඳහන් කරනුයේ ඉන්දියාවේ සිට පැමිණි සිංහල නමැති වෙළෙන්දෙකුගේ මාර්ගයෙන් මෙරට මුල් මිනිස් ජනාවාස බිහි වූ වගයි. කතා පුවත්වල භව්‍යතාවයට වඩා මෙහි දී සැලකිය යුතු වනුයේ එමගින් නිරූපිත කතා සාරයයි. ඒ තුළ ගැබ් ව ඇත්තේ මෙරට ජනාවාස ඇති කිරීමෙහි ලා වෙළෙඳ වාණිජ සබඳතා කොතරම් දුරට ඉවහල් වූයේ ද යන්නයි. ලක්දිව ජනාවාස වීම කෙරෙහි මුළුමණින් ම බලපා ඇත්තේ වෙළෙඳ කණ්ඩායම්හි ක්‍රියාකාරීත්වය මය යන්න මෙහි දී අතිශයෝක්තියක් විය හැකි වුව ද, එමගින් ලැබී ඇති දායකත්වය මෙවැනි කතා පුවත් තුළ ගැබ් ව තිබේ. හියුන්සාන් හිමියන් මෙම කතා පුවත් ගෙනහැර දක්වනුයේ මෙරටට පැමිණියෙකු ලෙස නොවේ. උන්වහන්සේ ඉන්දියාවේ දී මෙරට පිළිබඳ ව ඇසූ ජනප්‍රවාදගත කතා පුවත් මගිනි. කිතු වසින් 7 වන සියවසේ යුවාන් තා-ඕ විසින් ලියන ලද සුං-කාඕ-සෙං-චුවාං හා චෙන්-යුවාං-සිං-තිං-ෂිහ්-වියාඕ-මු-ලු යන කෘතිවල ද ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු අන්තර්ගත වේ.

ක්‍රිතු වසින් 8 වන සියවසේ මුල් දශක කිහිපය ඇතුළත වජ්‍රබෝධි නමැති මහායාන භික්ෂුව ලක්දිවට පැමිණ චීනය බලා පිටත් වූ බව කියැවේ. අමෝඝවජ්‍ර නමැති මහායාන භික්ෂුවක් අත මහා ප්‍රඥා පාරමිතා සූත්‍රයේ පිටපත් කිහිපයක් ශිලාමේඝ (චී-ලො-මී-කියා) රජු දවස චීනයට යැවූ බව ද වාර්තා වේ. ක්‍රිතු වසින් 10 වන සියවසේ රචනා කළ කෙ-නී-සි-යිහ්-හිං-චිං හෙවත් කෙනී බටහිර පෙදෙස්වලට ගිය ගමන්වල වෘත්තාන්තය යන ග්‍රන්ථයෙහි ද ක්‍රිතු වසින් 14 වන සියවසේ රචනා වූ සෙ-යිහ්-කෙ-පු-චු හෙවත් බටහිර රටවල් පිළිබඳ විස්තරය නමැති ග්‍රන්ථය ද හයි-කුඕ-තු-චෙ හෙවත් විදේශ පිළිබඳ භූගෝල විද්‍යාව නමැති ග්‍රන්ථය ද ක්‍රිතු වසින් 15 වන සියවසේ රචනා වූ තා-යුවාන් විසින් රචනා කළ තාඕ-ඉ-චිහ්-ලිඕ හෙවත් දිවයින්වාසී පිටරැටියන් පිළිබඳ සාමාන්‍ය විස්තර නම් ග්‍රන්ථයත් ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් චීන මූලාශ්‍රය වේ. මිං රාජ වංශ සමයේ පෙරදිග සංචාර කිහිපයක් ම සිදු කළ චෙන්-හ සෙන්පතියා පිළිබඳ විස්තර ඇතුළත් සිං-චියා-ෂෙං-ලං හෙවත් තාරකා පහුර පිළිබඳ වර්ණනාව චීන මුස්ලිම්වරයෙකු වූ මා-හුවාන් විසින් රචනා කළ යිං-යයි-ෂෙං-ලං හෙවත් මුහුදු වෙරළවල වැනුම් නමැති ග්‍රන්ථයත් චාඕ-ජුකුවා විසින් රචනා කළ චූ-පන්-චිහ් නමැති ග්‍රන්ථයත් ශ්‍රී ලංකාව පිළිබඳ ව තොරතුරු ඇතුළත් අනෙක් චීන මූලාශ්‍රය කිහිපයයි.

මීට අමතර ව චීන රාජකීය වාර්තාවල ද ශ්‍රී ලංකාවෙන් ගිය දූත පිරිස් මෙන් ම චීනයේ සිට ලක්දිවට පැමිණි දූත පිරිස් පිළිබඳ ව ද තොරතුරු මෙම වාර්තාවන්හි සඳහන් ව තිබේ. මෙම වාර්තා අතර සුං ෂ වෙයි ෂ ලියෑං සූ සුයි ෂූ තන් ෂිහ් සිං තං ෂූ සුං ෂිහ් යුවන් ෂිහ් මින් ෂිහ් යන වාර්තා මේ අතුරින් කැපී පෙනෙයි. මීට අමතරව තුන් තෙන් හෙවත් ඉතිහාස විශ්වකෝෂය තායි-පින්-යු-ලං හෙවත් තායිපින් ඉතිහාස සංග්‍රහය, සෙ-පු-යුවාන්-කුවෙයි හෙවත් ජාතික මහා ලේඛනාගාරය, වෙන්-සියන්-තුන්-කඕ හෙවත් පුරාවිද්‍යා පර්යේෂණ, හු-හයි හෙවත් මාණික්‍ය සාගරය, සා-චි හෙවත් විවිධ ලේඛන, හ්සු-වෙන්-සියන්-තුන්-කඕ හෙවත් පුරාවස්තු පර්යේෂණ පරිශිෂ්ට, හුං-කෙන්-ලු හෙවත් මධ්‍යතන යුගයේ ඉතිහාසය හා එහි පරිශිෂ්ටය මෙන් ම තා-චිං-ඉ-තුං හෙවත් මංචු රාජ වංශයේ ස්ථාන නිරූපන නමැති ග්‍රන්ථයත් ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් අනෙකුත් ග්‍රන්ථ අතර කැපී පෙනේ.

ශ්‍රී ලංකාව පිළිබඳ ව ලියූ විදේශීය වාර්තාකරුවන් අතුරින් අරාබිවරුන්හට හිමි වන්නේ විශේෂ ස්ථානයකි. අල් බලධූරිගේ වාර්තා අනුව මෙරට වාසය කළ මුස්ලිම් වෙළෙන්දන් පිළිබඳ විශේෂ සඳහනක් සිදු කර තිබේ. ඉරාකයේ බැග්ඩෑඩ්හි අරාබි ආණ්ඩුකාරවරයා ඉන්දියාවේ සින්ද් ප්‍රදේශය අත්පත් කර ගැනීමට කෙටි කලකට පෙර, ශ්‍රී ලංකේය පාලකයා මෙරට දී මිය ගිය ඇතැම් මුස්ලිම් වෙළෙන්දන්ගේ දූවරුන් පිරිසක් ඉරාකය වෙත පිටත් කර හැරි බව සඳහන් වේ. මේ අනුව පෙනී යන්නේ මෙම කාල පරිච්ඡේදය වන විටත් (ක්‍රිතු වසින් 8 වන සියවස පමණ) ඉස්ලාමය වැළඳ ගෙන සිටි අරාබි වෙළෙන්දන් මෙරට වෙළෙඳාමේ නිරත ව සිටියා පමණක් නොව මෙරට කාන්තාවන් විවාහ කර ගනිමින් ඇතැම් ස්ථානයන්හි පදිංචිව සිටි බවය. මෙලෙස පදිංචිව සිටි ස්ථාන බොහෝ විට වෙරළාසන්න වරාය තදාශ්‍රිත ප්‍රදේශය වන්නට ඇත. අල් බලධූරි විසින් රචිත යැයි ජනප්‍රවාදයන්හි සඳහන් සින්බෑඩ්ගේ චාරිකා නම් කෘතිය ද මෙරට පිළිබඳ තොරතුරු අන්තර්ගත වැදගත් අරාබි මූලාශ්‍රයක් වේ. නාවිකයෙකු විසින් තමාට එල්ල වන විවිධ අභියෝග හමුවේ සාගරය තරණය කරන ආකාරය දැක්වෙන මෙහි බොහෝ කථා පුවත් කුතුහලය මෙන්ම අතිශයෝක්තිගත සාහිත සල්ලාපවලින් යුක්ත ය. සාගර තරණය උදෙසා තිබිය යුතු නිර්භීතබව මෙන් ම එතුළින් ලබාගත හැකි වීරත්වය මෙම කථා පෙළින් ඉස්මතු කිරීමට උත්සාහ දරා තිබේ. සුලෙයිමාන් විසින් රචිත අක්බර් අල් - සින් - ව-අල් - හින්ද් නම් වූ කෘතියෙහි ද ලක්දිව වෙළෙඳ කටයුතු පිළිබඳ තොරතුරු අන්තර්ගත ව තිබේ. ඉබ්න් ෂහාරියාර් විසින් රචනා කළ අජායිබ් අල් හින්ද් හෙවත් ඉන්දියාවේ ඓශ්වර්යය නම් වූ ග්‍රන්ථය ද, ලක්දිව වෙළෙඳ - වාණිජ කටයුතු පිළිබඳ තොරතුරු අන්තර්ගත මූලාශ්‍රයකි. මොහුගේ වාර්තාවන්ට අනුව තෙවන අග්‍රබෝධි රාජ්‍ය සමයේ ලක්දිව සිට අරාබියේ මදීනා නගරය වෙත ගිය දූත ගමනක් පිළිබඳ ව සඳහන් වී තිබේ. මදීනාවට ලාංකේය දූතයා පැමිණෙන විට මොහොමඩ් නබිතුමාට පසුව එහි කාලිෆ්වරයා බවට පත් වූ අබුබකර් මිය ගොස් උමර් බලයේ සිටියේ ය. දූත ගමන සාර්ථකව නිම කොට ශ්‍රී ලංකාවට ආපසු පැමිණෙන අවස්ථාවේ මක්‍රාන් වෙරළේ දී දූතයා මිය ගොස් තිබේ. එහෙත් ඔහුගේ ඉන්දියානු සහචරයා එහි විස්තර ලක් රජුට දැනුම් දුන් බව සඳහන් ය. ඉබ්න් ෂාහාරියාර්ගේ කෘතියේ ලක්දිව සෙරන්ඩිබ් හා සහීලාන් යන නම්වලින් හඳුන්වා ඇත.

අබු සෙයිඩ් විසින් රචිත කිතාබ් අල් මසලික් ව අල් මමලික් නම් ග්‍රන්ථයෙහි පර්සියානු බොක්කේ සිට චීනය දක්වා වැටී තිබූ වෙළෙඳ මාර්ග විස්තර කරන අවස්ථාවේ දී ලක්දිව පිළිබඳ ව ද තොරතුරු ඇතුළත් කොට තිබේ. ඉස්ටාක්‍රි ඉබ්න් හවුක්වාල් හා මක්දිසි ආදි අරාබි වාර්තාකරුවන් සඳහන් කරනුයේ අරාබින්ගේ නැගෙනහිර මුහුදු මාර්ගයන්හි ගමනාන්තය ලක්දිව වූ බවයි. කුළුබඩු කෝමාරිකා ඇතුළු ඖෂධ, මැණික් ආදිය රැගෙන යෑම සඳහා තමා මෙහි පැමිණි බව ඉස්ටාක්‍රි සඳහන් කර තිබෙයි. එමෙන් ම දූෂාබ් නම් වූ පැණි වර්ගයට අරාබි ලෝකයේ රජවරුන්ගෙන් හා ප්‍රභූන්ගෙන් ලැබුණු ඉහළ රුචිකත්වය කෙරෙහි මෙන් ම ඒවා ලක්දිවින් ලබාගත් බව ද ඉස්ටාක්‍රි සඳහන් කරයි. ලොව පුරා ප්‍රචලිත වූ මෙරට කුරුඳු පිළිබඳ පළමු සටහන ද අරාබි ලේඛකයෙකුගේ වාර්තාවල අන්තර්ගත ය. බුසර්ග් බි ෂාහිරියර් නම් කතුවරයා විසින් රචිත වාර්තාවේ මෙම විස්තරය සඳහන් ය. හෙතෙම කිතු වසින් දහවන සියවසේ විසූවෙකි. අබු සෙයිඩ් උපුටා දක්වන ඉබ්න් වහාබ් මෙරටින් හමුවන මැණික්වලින් කොටසක් පතල්වලින් ලබා ගත් බවත් අනෙක් කොටස ගං මෝයවලින් ලබා ගත් බවත් විස්තර කරයි.

අරාබි ජාතික වාර්තාකරුවෙකු වූ අල් ඉද්‍රිසි මෙරට වෙළෙඳාම පිළිබඳ ව කරනු ලබන සඳහන් ඉතා වැදගත් වේ. ඒ අනුව මැණික් හා ඇතැම් සුවඳ විලවුන් වර්ග ලක්දිව නිපදවන බව ද දහසය දෙනෙකුගේ කවුන්සලයක් විසින් මෙරට වෙළෙඳාම හැසිරවීම උදෙසා රජුට සහය වූ බව ද හෙතෙම සඳහන් කරයි. මෙලෙස පත් වූ දහසය දෙනොගේ කවුන්සලය වෙත බෞද්ධයින් හතර දෙනෙකු, කිතුනුවන් හතර දෙනෙකු, යුදෙව්වන් හතර දෙනෙකු හා ඉස්ලාමිකයින් හතර දෙනෙකු අන්තර්ගත වූ බව සඳහන් වෙයි. කිතු වසින් 13 වන සියවසේ වාසය කළ අල් කස්වීනී නම් අරාබි වාර්තාකරුවා මෙරට සිට බැග්ඩෑඩය දක්වා ගිය විශිෂ්ට ඉස්ලාමීය නීතිවේදියෙකු පිළිබඳ ව සඳහන් කරයි. වසාෆ් නම් වූ අරාබි වාර්තාකරුවා සඳහන් කරනුයේ මුස්ලිම්වරුන් හා ලක්දිව අතර ඇති වූ වෙළෙඳාමේ වැඩි වාසි ශ්‍රී ලංකාවට හිමි වූ බවයි. කිතු වසින් 14 වන සියවසේ ලක්දිවට පැමිණි ඉබ්න් බතූතා නම් වාර්තාකරුවා ලක්දිව පිළිබඳ සටහන් කර ඇති විස්තරය ඉතා වැදගත් එකකි. හෙතෙම ලක්දිවට පැමිණෙන කාල පරිච්ඡේදය වන විට දකුණේ පාලකයින් හා උතුරේ ආර්ය චක්‍රවර්තී පාලකයින් අතර වෙළෙඳ - වාණිජ වශයෙන් මෙන් ම දේශපාලනික වශයෙන් ද ප්‍රබල තරගයක් පැවතියේ ය. යාපනයේ පාලකයාගේ සහයෙන් ශ්‍රී පාද වන්දනාවේ ගිය හෙතෙම කොළඹ අවට මුහුදු කලාපයෙහි සිදු වූ මංකොල්ලකෑම් පිළිබඳවත් මෙරට නිපද වූ මැණික් පිළිබඳවත් කදිම විස්තරයක් සපයා දේ. අබු අබ්දුල්ලාහ් ඉබ්න් අල් කාෆි නමැත්තෙකු ශ්‍රී පාද වන්දනාවේ ගිය පළමු මුස්ලිම් වන්දනාකරුවා බවත් ඔහු ලක්දිවින් ලද විශාල පරිමාණයේ මැණික් ගල් දෙකක් එරට රජුට තෑගි කළ බවත් බතූතා සිය වාර්තාවේ අතුරු තොරතුරු ලෙස දක්වා තිබේ. මීට අමතරව දෙවිනුවර හා ගාල්ල යන වරායන්හි සිටි විශාල මුස්ලිම් වෙළෙඳුන් පිරිස් පිළිබඳ ව ද බතූතා සිය වාර්තාවන්හි සඳහන් කොට ඇත. කොළඹ වරාය ජලස්ති නම් වූ පුද්ගයෙකු විසින් පාලනය කළ බවත් ඇබිසීනියානුවන් සියයක් පමණ ඔහු යටතේ වරායේ සේවය කළ බවත් බතූතා විස්තර කර තිබේ. මෙම වාර්තා සියල්ල මගින් පෙනී යනුයේ ඉස්ලාමය අරාබි ලෝකය වෙත හඳුන්වාදීමත් සමග ඉන් ලද නව ජීවයෙන් ප්‍රබෝධයට පත් වූ අරාබි වැසියා වෙළෙඳාමේ වැඩි වාසි අත් කර ගනිමින් 14 වන 15 වන සියවස් වන විට අරාබි මුහුද පමණක් නොව සමස්ත ඉන්දියන් සාගර කලාපය පුරා සිය අණසක පතුරුවා හැර තිබූ බවයි. මේ බව වඩාත් තහවුරු වනුයේ 14 වන සියවස තුළ දී ම ලක්දිවට පැමිණි මාර්කෝ පෝලෝ නමැති වැනීසියානු වැසියා විසින් කරනු ලබන සටහන් අනුවයි. එපමණක් නොව මැරිග්නොල්ලි නම් වූ ඉතාසි සම්භවයක් පැවති කතෝලික පූජකවරයා ද මෙම කාල පරිච්ඡේදයේ දී ම ලක්දිවට පැමිණ ඇති අතර බේරුවල වරායට ගොඩබැසි මොහු කෝය ජාන් නම් මුස්ලිම්වරයෙකු හා ඔහුගේ සහචරයින් විසින් මංකොල්ලකන ලද බව සඳහන් කරයි.

කිතු වසින් 16 වන සියවසේ සිට මෙරටට පැමිණි පෘතුගීසීන් ඇතුළු යුරෝපීයයන් විසින් තබා ඇති වාර්තාවල ද වෙළෙඳ - වාණිජ ඉතිහාසය පිළිබඳ වැදගත් සටහන් අතන්තර්ගත වී තිබේ. ඒ අතුරින් පෘතුගීසි ලේඛකයින් ඉතා වැදගත් වෙයි. කිතු වසින් 1499 වැනි කාල පරිච්ඡේදයක දී ලක්දිව පිළිබඳ ව සටහන් තැබූ ඉතාලි සම්භවයක් සහිත පාතුගීසි ලේඛකයෙකු ලෙස ගිරොලාමො සෙර්නිගි සඳහන් කළ හැකි ය. කුරුඳු, ඉඟුරු, කට්ටකුමන්ජල්, ලාක්ෂා ඉටි

ආදිය ලක්දිව සිට කැලිකට් වෙත ගෙන ආ බව සඳහන් කරන හෙතෙම, කැලිකට් ආශ්‍රිතව වැවෙන කරුඳු හා ගම්මිරිස්වලට වඩා ලක්දිව සිට ගෙනෙන එම කුළුබඩු තත්ත්වයෙන් ඉතා ඉහළ බව ද සඳහන් කර සිටියි. එමෙන් ම ලක්දිව මැණික් සඳහා ද ඉහළ ප්‍රසිද්ධියක් ඉසිලූ බව හෙතෙම තවදුරටත් සඳහන් කරන්නේ ය. පෘතුගීසි ලේඛකයින් බොහෝ දෙනෙකු විසින් කරනු ලබන වාර්තා එක සමාන විස්තර සමූහයකින් යුක්ත වන නමුත් ඇතැම් ලේඛකයින් විසින් ඒ ඒ කාල පරිච්ඡේදයන්හි සිදු වූ දේශපාලන තොරතුරු පිළිබඳ ව ගෙනහැර දක්වන කාරණා පමණක් එකක් අනෙකකින් වෙනස් වේ. මේ අනුව කුරුඳු ඇතුළු කුළුබඩු පිළිබඳ කරන විස්තර පොදුවේ සෑම පෘතුගීසි ලේඛකයෙකු වෙත ම පොදු බවක් උසුලයි. මැණික් හා අලි ඇතුන් වෙළෙඳම මෙන්ම මුතු කිමිදීම පිළිබඳ ව කරන සඳහන් ද මේ අතුරින් කැපී පෙනෙයි.

ලෝකයේ ඉතා ඉහළ ම කුරුඳු ලැබෙනුයේ සීලාංවලින් බව පවසන ලුනාර්දු නාර්දි (ක්‍රි. ව. 1502), ගැස්පාර් ද ගාමා හෙවත් ගැස්පාර් ද ඉන්දියා (1506), තෝමේ ලෝපෙස් (1502), ගැස්පාර් කොරයා (1502), අන්තෝනියෝ රෙයාල් (1512), ලොරෙන්සෝ මොරේනු (1513), දුවාර්තේ බාර්බෝසා (1518), දියෝගෝ ද කුතෝ ආදි ලේඛකයන් වැදගත් තැනක් උසුලයි. මෙරට පැවති වෙළෙඳ ආකර්ෂණය පෘතුගීසි පාලකයින් විසින් කොතරම් අගය කළා ද යන්න පෙනෙනුයේ දොන් මැනුවෙල් රජු විසින් ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදාහට ලියා එවූ ලිපියක් මගිනි. එමගින් රජු අවධාරණය කොට ඇත්තේ ලක්දිව පවතින කුරුඳු ඇතුළු කුළුබඩු බෝග පිළිබඳවත් මුතු මැණික් ආදි අනෙකුත් වෙළෙඳ ද්‍රව්‍ය පිළිබඳවත් නිසි අවධානය යොමු කරන ලෙසයි. මීට ප්‍රතිචාර දක්වනමින් අල්මේදා සඳහන් කරනුයේ ලෝකයේ ඉස්තරම් ම වර්ගයේ සිඟිති මුතු හා විශාල මුතු නිපද වන්නේ ලක්දිව බවත් ඒවා ලබා ගත හැක්කේ මෙරටින් ම පමණක් බවත් ය. ජුවාම් ද බරෝස් නම් වූ පෘතුගීසි ලේඛකයා ඇතුන් හත් දෙනෙකු පටවා ගත් නැවක් ලක්දිව සිට කැලිකට් වෙත ළඟා වූ ආකාරයත් එහි සිට කම්බාය හෙවත් කැම්බ්‍රෙයි දක්වා යාත්‍රා කළ ආකාරයත් සිය වාර්තාවෙහි සටහන් කර තිබෙයි. මේ අතර ම ෆාහියන් හා හියුංසාන් වැනි චීන දේශාටකයින් කරන විස්තරයකට සමාන තොරතුරු කිහිපයක් ජුවාම් සඳහන් කරයි. ශ්‍රී ලංකාවට සීලාං නම් වූ නාමය ලැබී ඇත්තේ චීන නැවක් ලක්දිව ආසන්නයේ දී අනතුරට ලක්වීමෙන් අනතුරුව බව, හෙතෙම සඳහන් කර සිටියි. එම නාමය ලබාදීමට පෙර ලක්දිව හඳුන්වා ඇත්තේ ඉලනාරේ හෝ ත්‍රනාතේ යන නම්වලින් බව හෙතෙම වැඩිදුරටත් සඳහන් කරයි. මෙම සටහන කතුවරයා විසින් ඇසූ පැරණි ජනප්‍රවාදයක් වරදවා වටහා ගැනීමෙන් වූවක් බව පෙනෙයි. ජෝසෆ් නමැති කතෝලික පියනම ද සඳහන් කරනුයේ ඉන්දියන් සාගරයේ ඇති ඉතා වැදගත් ම දූපත් දෙක අතුරින් ශ්‍රී ලංකාව එකක් වූ බවයි. අන්ද්‍රෙ කොර්සාලි (1515) ලක්දිව පිළිබඳ ව සටහන් තබමින් සඳහන් කරනුයේ ඉන්දියාවටත් වඩා මැණික් බහුල ව උපදින රට ශ්‍රී ලංකාව බවයි. පේද්‍රුරු තිසේරා පවසන්නේ අප්‍රේල් සිට මැයි දක්වා කාලය මෙරට මුතු කිමිදීම සිදු කරන කාලය බවයි. රැල්ෆ් පිච් (1589) මෙරට ආහාර හා ජලය ලබා ගැනීමේ පහසුකම් සහිත ස්ථානයක් ලෙස සඳහන් කර සිටියි. මේ අනුව ද පෙනී යන්නේ ක්‍රිතු වසින් 16 වන සියවස වන විට පෙරදිග ලෝකයට සංක්‍රමණය වූ පෘතුගීසීන් ඇතුළු යුරෝපා ජාතීන්ගේ නිබඳ ආකර්ෂණයට ලක් වූ රාජ්‍යයක් ලෙස ලක්දිව ප්‍රකටව පැවති බවයි. විශේෂයෙන් කුරුඳු ඇතුළු කුළුබඩු බෝග ලබා ගැනීම උදෙසා ඉවහල් වූ දිවයිනක් ලෙස මෙන් ම මුතු මැණික් හා අලි ඇතුන් බහුල රාජ්‍යයක් ලෙස ද ශ්‍රී ලංකාව ඔවුන් අතර අතිශය ජනප්‍රිය වූ බව පෙනී යයි.

උක්ත කරුණු සමාලෝචනයේ දී, ශ්‍රී ලාංකේය වෙළෙඳ - වාණිජ ඉතිහාසය අධ්‍යයනය කිරීමෙහිලා වැදගත් දේශීය මෙන් ම විදේශීය සාහිත්‍යය මූලාශ්‍රය රැසක් පවතින බව පෙන්නුම් කෙරෙන අතර, ඒවායේ අන්තර්ගත කරුණු ප්‍රස්තුතය පිළිබඳ බහුවිධ පැතිමානයන් විවර කරයි. දේශීය මූලාශ්‍රයවලින් ප්‍රකට කෙරෙන තොරතුරු, දේශීය වෙළෙඳ - වාණිජ්‍ය රටාව පිළිබඳ වැඩි නැඹුරුවකින් විතර සපයන අතර විදේශීය මූලාශ්‍රයවලින් මෙරට ජාත්‍යන්තර වෙළෙඳාම සම්බන්ධ අප්‍රකට විත්ති රැසක් අනාවරණය කරයි. සාහිත්‍ය මූලාශ්‍රයවලින් හෙළි කෙරෙන විස්තර තහවුරු කරගැනීම කෙරෙහි මෙන් ම කාසි, මැටි බඳුන්, පබළු වැනි ද්‍රව්‍යාත්මක සංස්කෘතීන් ඔස්සේ අතීත වෙළෙඳ වාණිජ ක්‍රියාවලිය අධ්‍යයනය උදෙසා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය ඉහළ වැදගත්කමක් පෙන්නුම් කරන අතර, මෙම ලිපි පෙළට අදාළව දෙවන ලිපියෙන් ඒ පිළිබඳ සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

දිව්‍යාවධානය, (සිංහල), 1999, පරි, අකුරැටියේ අමරවංශ හිමි, කොළඹ: ඇස්, ගොඩගේ සහ සහෝදරයෝ,

දීපවංසය, 1959, සංස්, කිරිඇල්ලේ ඥාණවිමල හිමි, කොළඹ: ඇම්,ඩී, ගුණසේන සහ සමාගම,

මහාවංශය, (සිංහල), 2006, සංස්, හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, බටුවන්තුඩාවේ, ඩී,එච්,ඇස්, අබේරත්න, නන්දදේව විජේසේකර, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

ෆා-හ්සිඑන් සුං යුං දෙනමගේ ගමන් විස්තරය, 1958. සංස්. බලන්ගොඩ ආනන්ද මෛත්‍රෙය හිමි, මහරගම, සමන් මුද්‍රණාලය.

### ද්විතීක මූලාශ්‍රය

හැරිසන්, බ්‍රයන්, 1965. අග්නිදිග ආසියාවේ සංගෘහිත ඉතිහාසය, පරි. ඩී. ඒ. වෛදගේ, කොළඹ: රත්නාකර පොත් වෙළෙඳ සමාගම.

Dewaraja, Lorna 1994. The Muslims of Sri Lanka, (One thousand years of Ethnic Harmony. 900 - 1915), Colombo: The Lanka Islamic Foundation.

Eberhand, Wolfram 1948. A History of China, London: Routledge and Kegan Paul.

Hitti, Philip K. 2001. History of the Arabs, London: Macmillan Press Ltd.

Nilakantasastri, K. A. 1949. History of Sri Vijaya, Madras: University of Madras.

Wolters, O. W. 1967. Early Indonesian Commerce (A Study of the Origins of Sri Vijaya), Ithaca: Cornell University Press.

### ලිපි සහ සඟරා

දේවරාජා, ලෝනා 2004, "ක්‍රි,ව, 900- ක්‍රි,ව, 1500 කාල පරිච්ඡේදය තුළ සෙරන්ඩිබ් දිවයිනට ආගිය මුස්ලිම් වෙළෙන්දන් සහ වන්දනාකරුවන්", පරි, රෝහිත දසනායක, ඉඳුවර (මහාචාර්ය ඒ,ඩී,ජී, කලන්සූරිය හර සරණිය), සංස්, දයා අමරසේකර ඇතුළු පිරිස, වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ, පිටු, 427-454,

Gunawardhana, R. A. L. H. 2003. "Seaway to Sielediba: Changing Ptterns of Navigation in the Indian Ocean and their Impact on Precolonial Sri Lanka," Sri Lanka and the Silk Road of the Sea, Ed. Senaka Bandaranayake, Lona Dewaraja, Roland Silva, K. D. G. Wimalaratne, Colombo: Sri Lanka Institute of International Relations, Central Cultural Fund. Sri Lanka National Commission for UNESCO, (pp. 17-36).

-, 2003. "Sino - Sri Lankan Relations During the Pre-Colonial Times," Sri Lanka and the Silk Road of the Sea, Ed. Senaka Bandaranayake, Lona Dewaraja, Roland Silva, K. D. G. Wimalaratne, Colombo: Sri Lanka Institute of International Relations, Central Cultural Fund. Sri Lanka National Commission for UNESCO, (pp. 213-224).

# මහ බැංකු සන්නිවේදනයේ
# වෙනස්වන භූමිකාව

**රෝහිණී ලියනගේ**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ**
**සන්නිවේදන දෙපාර්තමේන්තුව**

## 1. හැඳින්වීම

සන්නිවේදනය යනු එක් ස්ථානයක, පුද්ගලයෙකුගේ හෝ කණ්ඩායමක සිට තවත් ස්ථානයකට තොරතුරු හුවමාරු කිරීමේ ක්‍රියාවලිය ලෙස ඉතාම සරල ව හැඳින්විය හැකිය. මෙය අවාචික ව හෝ වාචික ව සිදු විය හැකි ය. තීරණ ගැනීම පහසු කිරීම, අවබෝධය සහ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම, ඉලක්කගත ග්‍රාහක කණ්ඩායම් වෙත යාවත්කාලීන කරන ලද තොරතුරු කාලෝචිත ලෙස ළඟා කර දීම, විනිවිදභාවය හා විශ්වාසය ගොඩ නැගීම ආදී අරමුණු සන්නිවේදනය තුළින් ඉටු කරගත හැකි බව පෙන්වා දිය හැකි ය. මහ බැංකු සන්නිවේදනයේ කාර්යභාරය වර්තමානයට වඩා අතීතයේ තරමක් වෙනස් විය. මුල් අවධියේ දී, මහ බැංකු රහස්‍ය ආයතන ලෙස සලකනු ලැබූ අතර ඒවායේ ප්‍රතිපත්ති සඵලතාව වෙළෙඳපොළ පුදුම කිරීමට ඇති හැකියාව මත රඳා පවතින බව විශ්වාස කර ඇත. මහ බැංකු ප්‍රතිපත්ති සහ උපායමාර්ග තුළින් සාමාන්‍ය මහජනතාව සහ පාර්ශ්වකරුවන්ගේ තීරණ මත ඇති වන දේශපාලන පීඩනය වැළැක්වීමේ අරමුණින් මහ බැංකු ක්‍රියාකාරී සන්නිවේදනයෙන් ඈත් වූ බව ද සංවෘත හා සීමිත ආර්ථික ප්‍රතිපත්ති පැවති කාලයේ දී මහ බැංකු තුළ සීමිත සන්නිවේදන උපායමාර්ග ක්‍රියාත්මක වී ඇති බව ද සඳහන් වේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් මහ බැංකු සන්නිවේදනය සඳහා නිර්දේශිත තාක්ෂණික හා මාර්ගෝපදේශය (IMF TAG, 2022) තුළ සඳහන් කර ඇති ආකාරයට එංගලන්ත මහ බැංකුවේ හිටපු අධිපතිවරයෙකු, මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය සාරාංශ කර ඇත්තේ "කිසිවිටක පැහැදිලි නොකරන්න, කිසිවිටක නිදහසට කරුණු ඉදිරිපත් නොකරන්න ("Never explain" never excuse") (BoE, 1920-1944) යනුවෙනි. ඒ අනුව, මහ බැංකු තීරණ පාර්ශ්වකරුවන් වෙත වැඩි වශයෙන් සන්නිවේදනය නොකෙරිණි. සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල්වල ආර්ථික ප්‍රතිපත්ති ලිහිල් කිරීම, මූල්‍ය ක්‍රමය වෙනස්වීම, විවෘත ආර්ථිකයන් සහ තවත් බොහෝ සාධක හේතුවෙන් මහ බැංකුවල මෙම රහස්‍ය සන්නිවේදන උපක්‍රම ක්‍රමයෙන් වෙනස් වී ඇත. තොරතුරු තාක්ෂණයේ සහ විදුලි සංදේශ අංශයේ ශීඝ්‍ර දියුණුවත් සමඟ, තොරතුරු සහ තොරතුරු මූලාශ්‍ර ලබා ගැනීමේ සැලකිය යුතු ප්‍රගතියක් සටහන් වේ. කෙසේ වුව ද මුදල් ප්‍රතිපත්ති සහ මහ බැංකු හා සම්බන්ධ අනෙකුත් ප්‍රතිපත්ති තීරණ පිළිබඳ ව පාර්ශ්වකරුවන් වෙත තොරතුරු බෙදා හැරීමේ ප්‍රබල මෙවලමක් ලෙස මහ බැංකු සන්නිවේදනය හඳුනාගෙන ඇත. ඒ අනුව, සන්නිවේදන ප්‍රතිපත්ති, සැලසුම් සහ උපායමාර්ග සංවර්ධනය තුළින් ආයතනික රාමුව ශක්තිමත් කිරීම පිළිබඳ ව අවධානය යොමු කර ඇති අතර, මෑතක දී දියුණුවන පර්යේෂණ සාහිත්‍යය තුළ සන්නිවේදන නාලිකා/උපායමාර්ග භාවිත කෙරෙමින් මහ බැංකු සන්නිවේදනය කළ යුත්තේ ඇයි ?, කුමක් ද/ කුමකටද ?, කෙසේ ද?, කා හට ද? සහ සන්නිවේදනයේ වැදගත්කම පිළිබඳ පර්යේෂණ උනන්දුව වර්ධනය වෙමින් පවතී.

මහ බැංකු ප්‍රතිපත්තිවල සාර්ථකත්වය කෙරෙහි සන්නිවේදනයේ වැදගත්කම, මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය, මහ බැංකු සන්නිවේදනය සාමාන්‍ය මහජනතාව වෙත ගෙන යෑම, හා සන්නිවේදනයේ ප්‍රවණතා පිළිබඳ සාකච්ඡා කිරීම මෙම ලිපියේ

අරමුණයි. පළමු කොටසේ දී, මහ බැංකුවල සන්නිවේදනයේ වෙනස්වන භූමිකාව සාකච්ඡා කෙරේ. දෙ වන කොටසින් මහ බැංකුව ආරම්භයේ සිට ම වඩාත් කැපී පෙනෙන සන්නිවේදනය, මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය සහ උපායමාර්ග විස්තර කෙරෙයි. මහ බැංකු ප්‍රතිපත්තිවල විනිවිදභාවය සහ පාර්ශ්වකරුවන් වෙත සන්නිවේදනය සන්නිවේදනය කෙරෙන ක්‍රියාමාර්ගවල විනිවිදභාවය වැඩිදියුණු කිරීමේ දී ඉලක්කගත ග්‍රාහක සංඛ්‍යාව පුළුල් කිරීමේ අත්‍යවශ්‍ය කරුණු සහ වැදගත්කම පරීක්ෂා කිරීමට උත්සාහ කරමින් සාමාන්‍ය ජනතාව වෙත මහ බැංකු සන්නිවේදනය 3 වන කොටස යටතේ සාකච්ඡා කෙරේ. අවසාන වශයෙන්, සන්නිවේදන උපාය මාර්ගවල සඵලතාවය තක්සේරු කිරීම සහ සමාප්තිය පිළිවෙලින් 4 සහ 5 වන කොටස්වලින් ආවරණය කිරීමට අපේක්ෂා කෙරේ.

මහ බැංකුවල සන්නිවේදනයේ කාර්යභාරය විවිධ වූ හේතු නිසා වැඩි දියුණු වෙමින් පවතී. ප්‍රධාන හේතු ලෙස ප්‍රතිපත්ති රාමුව හා දිශානතිය වෙනස් වීම සහ ලිබරල්කරණය වූ ආර්ථික තත්ත්වයන් යටතේ වාර්තා වූ ආර්ථික ක්‍රියාකාරකම්වල විශාල උච්චාවචනයන්, ජාත්‍යන්තර වෙළෙඳාම සහ මූල්‍යය හරහා ආර්ථික ක්‍රියාකාරකම් ඒකාබද්ධ කිරීම හඳුනාගත හැකි ය. සංවෘත ආර්ථිකයන්හි ප්‍රතිපත්තිවලට සාපේක්ෂ ව බලන විට විවෘත ආර්ථික වාතාවරණය තුල විදේශීය අංශය සහ මුදල් අංශය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති දිශානතිය කැපී පෙනෙන ලෙස වෙනස් විය. මුදල් ප්‍රතිපත්ති දිශානතිය සමස්ත මුදල් තොගය ඉලක්ක කිරීම, විනිමය අනුපාත ඉලක්ක කිරීම, බහුවිධ අරමුණු ඉලක්කගත කරණයේ සිට උද්ධමන ඉලක්ක කිරීම දක්වා වෙනස් කරන ලදී. ඇතැම් රටවල උද්ධමන ඉලක්කගත කිරීම, නම්‍යශීලී උද්ධමන ඉලක්කගත කිරීම දක්වා වෙනස්වීම් ද හඳුනාගත හැකි ය. මේ සම්බන්ධයෙන් සිදු කරන ලද අධ්‍යයනයකට අනුව (Posen et al., 1998) වර්තමානයේ මහ බැංකු විසින් අනුගමනය කරන ජනප්‍රිය ප්‍රතිපත්ති රාමුව ලෙස උද්ධමන ඉලක්කකරණය, ක්‍රියාත්මක කිරීම මහ බැංකුවල සන්නිවේදන කාර්යභාරයේ වැදගත්කම වැඩි කිරීමට හේතුවක් ලෙස සොයා ගෙන තිබේ. 1990 ගණන්වල උද්ධමන ඉලක්කකරණ රාමුව ආරම්භ කළ ප්‍රමුඛ රටක් ලෙස නවසීලන්තය හඳුනාගෙන ඇත. මෙසේ උද්ධමන ඉලක්කගත කිරීම සමහර රටවල ඉහළ සහ පහළ මායිම් පරාසයක් තුළ, දී ඇති සම්භාවිතා මට්ටමක් සමග වෙනස්වීමට ඇති හැකියාව පුරෝකථනය කරමින්, උද්ධමන ව්‍යාප්ති සටහන් ආශ්‍රයෙන් පැහැදිළි කරන රාමුවක් වෙත වර්ධනය වීම ද නිරීක්ෂණය කළ හැකි ය.


2008 වසරේ ඇති වූ ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසුව, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සහතික කිරීම සඳහා මහබැංකු සන්නිවේදන ප්‍රතිපත්තිය, මුදල් ප්‍රතිපත්ති මෙන්ම මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති සන්නිවේදනයට ද අවධානය යොමු විය. තව ද මහ බැංකු මුදල් ප්‍රතිපත්ති තීරණ ප්‍රකාශ කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ මූලධර්මයක් ලෙස මුදල් ප්‍රතිපත්තියට අනුගත වීම සඳහා ඉදිරි දැක්මක් සහිත මග පෙන්වීමක් අනුගමනය කරන ලෙස ද අවධාරණය කර ඇත. මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයට අමතර ව මූල්‍ය පද්ධතිය, ක්ෂුද්‍ර විචක්ෂණ සහ සාර්ව විචක්ෂණ නිරීක්ෂණ සම්බන්ධ තොරතුරු ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසු මහ බැංකු සන්නිවේදන විෂය පථයට එක් කරන ලදී. එසේ ම මහ බැංකුවේ ලියා පදිංචි බැංකු මූල්‍ය හා කල්බදු සමාග ම්වලට අදාළ සුපරීක්ෂණ රාමුව ශක්තිමත් කිරීම, තැන්පතු රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම, අනවසර තැන්පතුකරණයේ නියැලෙන ආයතන හා මූල්‍ය වංචා ක්‍රම පිළිබඳ නිරන්තරයෙන් දැනුම්වත් කිරීම සහ මූල්‍ය පාරිභෝගිකයා පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම ආදී කරුණු රැසක් මහ බැංකු විෂය පථයට හා සන්නිවේදනයට එකතු වීම ද නිරීක්ෂණය කළ හැකි ය. ග්‍රාහක පදනම පුළුල් කිරීම සඳහා කර ඇති නිර්දේශයන්ට අනුකූල ව මූල්‍ය වෙළෙඳපොළ කෙරෙහි අවධානය යොමු කරන සම්ප්‍රදායික ප්‍රේක්ෂක/ග්‍රාහක පදනමට වඩා, මුදල් ප්‍රතිපත්තිය නිත්‍ය සංඛ්‍යාතයක් සහිත ව සහ පුළුල් ප්‍රේක්ෂක පදනමක් වෙත සන්නිවේදනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර ඇත. සාම්ප්‍රදායික ඉලක්කගත ග්‍රාහකයින් සමග, රජය සහ පාර්ලිමේන්තුව, සාමාන්‍ය ජනතාව සහ මාධ්‍ය, මූල්‍ය වෙළෙඳපොළ සහභාගිවන්නන්, ව්‍යාපාරික අංශය, ශාස්ත්‍රීය අංශය, සිසුන් සහ මහ බැංකු විෂය පථය පිළිබඳ ව උනන්දුව දක්වන පිරිස් ඇතුළත් ව අංශ රාශියක් වෙත මහ බැංකු සන්නිවේදනයේ ප්‍රේක්ෂක/ග්‍රාහක පදනම වර්ධනය වෙමින් පවතී. 2008 ගෝලීය මූල්‍ය අර්බුද වලින් පසු මහ බැංකු සන්නිවේදනය තීව්‍ර වී ඇති බව මහබැංකු අධිපතිවරුන් 80% කට වඩා පෙන්වා දී ඇති බව සමීක්ෂණයකින් හෙළි වේ.

මහ බැංකු සන්නිවේදන කාර්යභාරයේ වැදගත්කම ඉහළ යෑම සඳහා බල පා ඇති අනෙකුත් සාධක වන්නේ

ප්‍රතිපත්ති සඳහා විනිවිදභාවය සහ මහජනතාව වෙත වගවීමේ අවශ්‍යතාව හඳුනා ගැනීමයි. මුදල් ප්‍රතිපත්තියේ ඵලදායිතාව සම්බන්ධයෙන්, අධ්‍යයනයකින් නිගමනය කෙරෙන ආකාරයට මුදල් ප්‍රතිපත්තියට ප්‍රතික්‍රියා දැක්වීම සහ සම්ප්‍රේෂණ යාන්ත්‍රණය තුළ (Blinder et al., 2008) පැහැදිළි ව පෙනෙන පරිදි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සහතික කිරීම සඳහා විනිවිදභාවය, වගවීම සහ ක්‍රියාකාරී සන්නිවේදනය ඉතා ප්‍රයෝජනවත් වෙයි. ආනුභවික අධ්‍යයන යෝජනා කරන ආකාරයට මුදල් ප්‍රතිපත්තියේ පුරෝකථනය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීමට සහ ප්‍රතිපත්ති ඵලදායිතාවය සහතික කිරීම සඳහා විනිවිදභාවය සහ වගවීම, උපකාරී වෙයි. ඉතා සරල භාෂාවෙන් පැහැදිලි ව සන්නිවේදනය කිරීම, ප්‍රතිපත්තිවලට අනුගත වීම සඳහා ඉදිරි දැක්මක් සහිත ව මග පෙන්වීම ප්‍රතිපත්ති ඵලදායිතාව සහ පුරෝකථනය කිරීමේ හැකියාව කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි. මෙය තවදුරටත් පුද්ගලික අංශයේ අපේක්ෂාවන්, තීරණ ගැනීම් සහ අනාගත ප්‍රතිපත්ති අභිප්‍රායයන් පිළිබඳ පැහැදිලි ඇඟවීමක් සමඟ ප්‍රතිපත්ති මත ඇතිවිය හැකි අවිනිශ්චිතතාව අඩු කිරීමට සහ කෙටි, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ව මහ බැංකු ප්‍රතිපත්ති සඳහා වන විශ්වසනීයත්වය සහ විනිවිදභාවය කෙරෙහි ධනාත්මක ලෙස බලපෑමක් ඇති කිරීමට ද උපකාරී වන බව සොයාගෙන ඇත. (Fry et al., 2000) විසින් මේ සම්බන්ධයෙන් සිදු කර ඇති අධ්‍යයනයක දී මහ බැංකු 94 ක් යොදා සිදු කළ සමීක්ෂණයකට අනුව 74% අදහස වූයේ ප්‍රතිපත්තිවල විනිවිදභාවය මුදල් ප්‍රතිපත්ති සඵලතාවයට ඉතා වැදගත් හා අත්‍යවශ්‍ය දෙයක් ලෙස සලකන බවයි. තවද, රටවල් බොහෝ සංඛ්‍යාවක් යොදා සිදු කළ අධ්‍යයනයක සාක්ෂි මගින් විනිවිදභාවය සහ ප්‍රතිපත්ති අනුපාත පුරෝකථන දෝෂ අතර ප්‍රතිලෝම සම්බන්ධයක් පවතින බව සොයාගෙන ඇති අතර එය පහත දක්වා ඇත.

පහත රූපයට අනුව, ප්‍රතිපත්තිවල ඉහළ විනිවිදභාවයක් ඇති රටවල් ලෙස, ස්වීඩනය, නවසීලන්තය, ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, කැනඩාව, ඕස්ට්‍රේලියාව යන රටවල් පෙන්වා දී ඇති අතර ප්‍රතිපත්ති අනුපාත පුරෝකථනය කිරීමේ දී අඩු දෝෂ වාර්තා කර ඇති බවත්, ඉන්දියාව සහ බ්‍රසීලය තුළ ඇති අවම විනිවිදභාවය තුළ පුරෝකථන දෝෂයන් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති බවත්, හරස් කඩ දත්ත පරීක්ෂා කරමින් සිදු කර ඇති විශ්ලේෂණයකට අනුව (Dincer and Eichengreen, 2013) සඳහන් කර ඇත. විනිවිදභාවය සහ විශ්වසනීයත්වය වැඩිදියුණු

**රූප සටහන 1: ප්‍රතිපත්ති පුරෝකථන දෝෂ සහ මහ බැංකු විනිවිදභාවය**




විනිවිදභාවය මැනීමට ඉදිරිපත් කර ඇති දර්ශකය 2010-2014 (1-15, 15 වඩාත්ම විනිවිදභාවයක් ඇති)

මූලාශ්‍රය ජා.මූ.අ තාක්ෂණික මාර්ගෝපදේශය

කිරීම සඳහා, මහබැංකු සන්නිවේදනයේ වැදගත්කම පිළිබද ව මෙම ලිපියේ තුන් වන කොටස යටතේ රජය, පාර්ලිමේන්තු සහ සාමාන්‍ය ජනතාව වෙත ප්‍රේක්ෂක පදනම පුළුල් කිරීම සඳහා කර ඇති නිර්දේශ පිළිබද අවධානට යොමු කරමින් සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරේ.

තවද, 2008 ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසු මහ බැංකුවල සන්නිවේදන භූමිකාවේ අවශ්‍යතාව ඉහළ යැමට හේතු ලෙස බොහෝ කරුණු හඳුනාගත හැකි ය. අධ්‍යයනයක් මගින් (Blinder et al., 2008) නිගමනය කරන ආකාරයට තොරතුරු තාක්ෂණයේ සහ සන්නිවේදනයේ සැලකිය යුතු සංවර්ධන ක්‍රියාවලිය තුළ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය මගින් වෙළෙඳපොළ පුදුමයට පත් කරවීමේ සාම්ප්‍රදායිකත්වයට වර්තමානයේ ඉඩක් නොමැති තරම් ය. කෙසේ වෙතත්, බොහෝ ආනුභවික සාක්ෂි යෝජනා කරන්නේ, ආයෝජන, පරිභෝජනය ඉතුරුම්, සමස්ත ඉල්ලුම සහ මූල්‍ය වෙළෙඳපොළ තීරණ ගැනීමට බලපෑම් කිරීමේ හැකියාව සහ වත්කම් මිලකරණය කෙරෙහි බලපෑම් කිරීමෙහි ලා මහ බැංකුවේ, මුදල් හා අනෙකුත් ප්‍රතිපත්ති තීරණ මෙන් ම එම තීරණ ඉතා පුළුල් ග්‍රාහක පදනමක් වෙත කාලෝචිත ව සන්නිවේදනය ද මහ බැංකු ප්‍රතිපත්තිවල වැදගත් සහ බලවත් අංගයක් බවයි. තවද, Covid 19 වසංගතය සහ ආර්ථික ක්‍රියාකාරකම් හැකිලීමෙන් පසු ඩිජිටල් මාධ්‍ය, වැඩ සටහන් සජීවී විකාශනය, සමාජ මාධ්‍ය වේදිකා හරහා තොරතුරු ප්‍රකාශ කිරීම YouTube, Facebook, Instagram සහ Twitter (X-Account) පිටුවල පළ කිරීම තුළින් මහ බැංකු සන්නිවේදනය මහ ජනතාව වෙත ප්‍රවේශය වැඩි වීමට හේතු විය. මේ සම්බන්ධයෙන් තවදුරටත් WhatsApp සමූහයන් ස්ථාපිත කිරීම මගින් තෝරාගත් හා ඉලක්කගත ග්‍රාහක කණ්ඩායම් වෙත තොරතුරු බෙදා හැරීම සහ පණිවිඩ යැවීම තුළින් ද්වීපාර්ශ්වික සන්නිවේදනය වැඩි දියුණු වීමට ද උපකාරී විය.

පුරෝකථනය කිරීමේ හැකියාව වැඩි වීමත් සමග තීරණ ගැනීමේ ක්‍රියාවලියට සන්නිවේදනයේ හිතකර බලපෑමක් ඇති කරන අතර, ප්‍රතිපත්ති තීරණ කෙරෙහි පෞද්ගලික අංශයේ අපේක්ෂාවන්ට අනුගත වීම සඳහා ඉදිරි දැක්මක් සහිතව මාර්ගෝපදේශකත්ව සන්නිවේදන ප්‍රවේශයක් අනුගමනය කිරීම සමග ප්‍රතිපත්ති තීරණ කෙරෙහි ඇතිවිය හැකි අවිනිශ්චිතතාව අඩු කරයි. මේ තුළින් මහ බැංකු ප්‍රතිපත්ති පිළිබඳ ව විනිවිදභාවය සහ විශ්වාසනීයත්වය පාර්ශවකරුවන් වෙත ගොඩනැගීමට සහ ආර්ථිකයේ කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගුකාලීන ඉලක්ක සපුරා ගැනීමට තවදුරටත් උපකාරී වේ. තීරණ ගැනීමේ ක්‍රියාවලියට ධනාත්මක බලපෑමක් ඇති කිරීම සඳහා සහ මධ්‍ය කාලීන ව ආර්ථිකයට ඇති වන අහිතකර බලපෑම වළක්වා ගැනීම සඳහා මහ බැංකු සිය ප්‍රතිපත්ති ඉලක්ක සහ රාමුව පැහැදිලිව සන්නිවේදනය කළ යුතුය. තවද, ඉදිරි මග පෙන්වීම සමඟ අනාගත අවදානම් තත්ත්වයන් සමගින් මුදල් තොගය, විනිමය අනුපාත හෝ උද්ධමන ඉලක්ක සහ නම්‍යශීලී උද්ධමන රාමුව ඉලක්ක කරගත් ප්‍රතිපත්තිවල ඉලක්ක නිශ්චිත ව හා පැහැදිලි ව ලබා දිය යුතුය. මුදල් ප්‍රතිපත්ති තීරණ සන්නිවේදනය කිරීමේ දී, විවිධ ඉලක්කගත කණ්ඩායම් වෙත නිත්‍ය කාලාන්තරවලින් යුතුව අත්‍යවශ්‍ය තොරතුරු ලබා දීම නිර්දේශ කෙරේ.

මහ බැංකු ප්‍රතිපත්ති තීරණ සහ එමගින් තීරණ ගැනීමට බලපෑම් කිරීම, ප්‍රතික්‍රියා කාර්යයන් සහ සඵලතාව වැඩි දියුණු කිරීම සඳහා විවිධ ඉලක්කගත ග්‍රාහකයින් අරමුණු කරගෙන සන්නිවේදනය තුළින් ඉහළ ප්‍රවේශයක් ලබා ගැනීම අපේක්ෂා කෙරේ. මේ සඳහා මහබැංකු සන්නිවේදනය සරල සහ කාලෝචිත ආකාරයකින් සාමාන්‍ය ජනතාව සහ මාධ්‍ය, රජය සහ පාර්ලිමේන්තුව, මූල්‍ය වෙළෙඳපොළ සහභාගිවන්නන්, ව්‍යාපාරික අංශය සහ මහ බැංකු ප්‍රත්පත්ති හා කටයුතු පිළිබද උනන්දු වන ප්‍රජාවන් සඳහා දැනුවත් කිරීමට උපකාරී වේ. තව ද, මහ බැංකුවල ප්‍රතිපත්ති සඳහා මහජනතාවට වගවීම පවත්වා ගැනීමටත්, මූල්‍ය සාක්ෂරතාව, මූල්‍ය ක්‍රමය පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීමට, මූල්‍ය අන්තර්ගතභාවය ආවරණය කිරීමට සහ වැඩි දියුණු කිරීමටත් සන්නිවේදන මාධ්‍යයන් හා විවිධ සන්නිවේදන උපක්‍රම හරහා සමාජයේ සියලු ම කොටස් ආවරණය වන පරිදි තොරතුරු බෙදා හැරීමෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තවද, මූල්‍ය කරුණු පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීමට ද එය උපකාරී වේ. ප්‍රතිපත්තිවල මධ්‍ය කාලීන හා දිගු කාලීන ඉලක්ක කෙරෙහි අවධානය යොමු කරමින් තාක්ෂණික විශ්ලේෂණ, න්‍යායික අදාළත්වය සහ ප්‍රායෝගික ප්‍රවේශයන් සමගින් සාමාන්‍ය ජනතාව වෙත පණිවිඩ ගෙන යා හැකි වැදගත් ග්‍රාහක කොටසක් ලෙස මහ බැංකු ප්‍රතිපත්ති හා මෙහෙයුම් කටයුතු කෙරෙහි අවධානය හා නිරීක්ෂණය කරන විශේෂඥ

දැනුම සහිත කණ්ඩායම් හඳුනාගෙන ඇත. ඔවුන් විසින් මහබැංකු ප්‍රතිපත්ති හා තීරණයන් නිවැරදි ව විශ්ලේෂණය කිරීම හා වාර්තාකරණය තුළ මහබැංකු සන්නිවේදනය තවත් ස්ථරයක් හරහා ප්‍රජාව වෙත ගමන් කරවීමට ඉවහල් වේ. රජය සහ පාර්ලිමේන්තුව මහජනතාව නියෝජනය කරන නිසා එම ප්‍රජාව ඉලක්ක කරගත් සන්නිවේදනයේ දී මුදල් ප්‍රතිපත්ති තීරණ පිළිබඳ වගවීම සහ එම ප්‍රතිපත්ති තීරණ ආර්ථිකයේ විවිධ අංශ කටයුතු සහ කුටුම්භ තුළ තීරණ ගැනීම කෙරෙහි වන බලපෑම සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහතික කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු ය. මහ බැංකු තීරණ පිළබඳව නිරන්තර විමසිල්ලෙන් සිටින ග්‍රාහකයින් සාම්ප්‍රදායික සවන්දෙන්නන් ලෙස හැඳින්වේ. මූල්‍ය වෙළෙඳපොළ සහභාගිවන්නන් යනු මහ බැංකු, සන්නිවේදනය කරන විට සවන් දෙන සහ ප්‍රතිචාර දක්වන සාම්ප්‍රදායික ග්‍රාහකයින් ය. ආනුභවික සාක්ෂි යෝජනා කරන ආකාරයට (Freedman) Laxton, 2009) මහ බැංකුවල අපේක්ෂිත ක්‍රියාවක් ලෙස හඳුනාගෙන ඇති නිත්‍ය මූල්‍ය ප්‍රතිපත්ති තීරණ ප්‍රකාශයට පත් කිරීමේ කාලය තුළ වෙළඳපල ගනුදෙනුවල (මිල සහ ප්‍රමාණ) සුමට ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කල හැකිය. මේ සඳහා මූල්‍යය වෙළෙඳපොළ සහභාගීත්වය / සාම්ප්‍රදායික ග්‍රාහක පදනමේ දායකත්වය, මහ බැංකු සන්නිවේදනය ආදී කරුණු තවමත් කැපී පෙනෙන බවට සාක්ෂියකි. 2008 න් පසු මහ බැංකු සන්නිවේදනය තුළින් ප්‍රතිපත්ති තීරණවල ඵලදායීතාවය ඉහළ නැංවීමට සහ අභ්‍යන්තර මෙහෙයුම් කටයුතු පිළිබදව වගවීමට සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීමට සාම්ප්‍රදායික ග්‍රාහකයින්ට වඩා පුළුල් ප්‍රේක්ෂක පදනමක් වෙත ප්‍රතිපත්ති තීරණ ගෙන යෑම නිර්දේශ කර තිබේ. එසේ හෙයින් සන්නිවේදනයේ අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සහ මුදල් හා මූල්‍ය පද්ධති ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පුළුල් ග්‍රාහක පදනමක් වෙත සම්ප්‍රේෂණය කිරීම තුළින් සමාජයේ සියලු ම කොටස් වෙත ප්‍රතිපත්ති තීරණ සන්නිවේදනය කිරීම අත්‍යාවශ්‍ය වේ. මහ බැංකු සන්නිවේදනයේ පෙර ගමන්කරු වන මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය පිළිබද ව මෙතැන් සිට සාකච්ජා කරමු.

## 2. මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය

මහ බැංකු අරමුණු හා කාර්යයන් කෙරෙහි ඇති ඍජු දායකත්වය නිසා ම මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය මහ බැංකු සන්නිවේදන ක්‍රියාවලිය ආරම්භයේ සිට ම මූලිකත්වය දරමින් මිල හා ආර්ථික ස්ථායීකරණ අරමුණු ඉටු කිරීමෙහි ලා ප්‍රබල දායකත්වයත් දරයි. මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය මහ බැංකු සන්නිවේදනයේ කේන්ද්‍රීය කාර්යයක් ඉටු කරයි. එබැවින් මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය පිළිබඳව ශාස්ත්‍රීය උනන්දුව නිරන්තරයෙන් වැඩෙමින් පවතී. අනාගත ප්‍රතිපත්ති පෙරදැක්මකින් යුක්ත ව වෙළෙඳපොළට සංඥා නිකුත් කිරීම සඳහා තොරතුරු සැපයීම හේතුවෙන් වෙළෙඳපොළ තීරණ ගැනීමට, මග පෙන්වීම සඳහා ඉතා ඵලදායී හා කාර්යක්ෂම ක්‍රමයක් ලෙස මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය හඳුනාගෙන ඇත. මුදල් ප්‍රතිපත්ති තීරණ සන්නිවේදනය කිරීම මගින් මහ බැංකු ප්‍රතිපත්තිවල විනිවිදභාවය වැඩි දියුණු කිරීම, වගවීම සහ ප්‍රතිපත්ති ඵලදායිතාව වැඩි දියුණු කිරීමට ද හේතු වේ. තවද, මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය, පැහැදිලි සහ ඉදිරි දැක්මක් සහිත ව මාර්ගෝපදේශක මූලධර්ම සමඟින් පුරෝකථනය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම නිසා එය ප්‍රතිපත්ති ඵලදායිතාව වැඩිදියුණු කිරීම කෙරෙහි හේතුවන බව සොයාගෙන තිබේ. අධ්‍යයනයකට අනුව (Blinder 1998) මුදල් ප්‍රතිපත්ති පුරෝකථනය කිරීමේ හැකියාව සහ වෙළෙඳපොළ ප්‍රතික්‍රියා යන විචල්‍යයන් අතර චක්‍රීය සබඳතාවක් පවතින බව විග්‍රහ කර ඇත. එම අධ්‍යයනයට අනුව, මුදල් ප්‍රතිපත්තියට වෙළෙඳපොළ ප්‍රතික්‍රියා වඩාත් හොඳින් පුරෝකථනය කළ හැකි අතර වෙළෙඳපොළ ප්‍රතික්‍රියා මගින් මහ බැංකුවලට මුදල් ප්‍රතිපත්තිය වඩාත් හොඳින් පුරෝකථනය කළ හැකි වේ. විචල්‍යන් අතර මෙවැනි යහපත් සබඳතා පැවතීම ඉදිරි දැක්මක් සහිත ව මුදල් ප්‍රතිපත්තිය සන්නිවේදනය කරන විට, මුදල් සහ මූල්‍ය වෙළෙඳපොළ තීරණ හරහා ආරම්භ කරන පුද්ගලික අංශයේ අපේක්ෂාවන් මත ධනාත්මක ලෙස බලපායි. රටවල් විශාල සංඛ්‍යාවක් යොදාගෙන සිදු කර ඇති පර්යේෂණ සාක්ෂිවලට අනුව, පෞද්ගලික අංශය විසින් ප්‍රතිපත්ති අනුපාත පුරෝකථනය කිරීමේ දෝෂ සහ විනිවිදභාවය පිළිබඳ ඍණාත්මක සම්බන්ධතාවක් නිරීක්ෂණය කෙරේ. ඒ අනුව, ප්‍රතිපත්ති තීරණවල ඉහළ විනිවිදභාවයක් ඇති විට පුද්ගලික අංශය විසින් සිදු කරන ප්‍රතිපත්ති පොළී අනුපාතික පුරෝකථන දෝෂය අඩු වී ප්‍රතිපත්ති අනුපාත පුරෝකථනය කිරීම වඩාත් නිවැරදි වේ. මහ බැංකු සන්නිවේදනය තුළින් විනිවිදභාවය ඇති කිරීම සඳහා සන්නිවේදනය ජනගහනයේ සෑම කොටසක්

ම ආවරණය වන ලෙස හා ස්ථරකරණය පාදක වූ සන්නිවේදන ක්‍රියාවලියක් අනුගමනය කිරීම ද වැදගත් වේ. රජයේ සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, මූල්‍ය වෙළෙඳපොළ, සාමාන්‍ය ජනතාව, මාධ්‍යවේදීන් සහ මහ බැංකු කටයුතු පිළිබඳ උනන්දුවන්නන් ඇතුළු ව විවිධ සහ පුළුල් ඉලක්කගත ප්‍රේක්ෂකයින් වෙත කාලෝචිත ව සන්නිවේදනය තුළ ප්‍රතිපත්ති අවිනිශ්චිතතා අවම කිරීමට, මහ බැංකු ප්‍රතිපත්ති පිළිබඳ විනිවිදභාවය සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමට තවදුරටත් උපකාරී වේ. මහ බැංකුවල මූල්‍ය ප්‍රතිපත්ති සන්නිවේදන ක්‍රියාවලියේ ශීඝ්‍ර වර්ධනයත් සමග ඒ පිළිබද පර්යේෂණ උනන්නදුව හා පර්යේෂණ සාහිත්‍යය වැඩි දියුණු වෙමින් පවතින අතර සන්නිවේදන උපාය මාර්ගවල සඵලතාවය මැනීම සඳහා විවිධ උපාය මාර්ග යොදා ගැනීම කෙරෙහි ද අවධානය වැඩි වී ඇති බව පෙනී යයි. සන්නිවේදන උපාය මාර්ගවල සඵලතාවය මැනීම පිළිබඳ සිදු කර ඇති සොයාගැනීම්වලින් පෙනී යන්නේ මූල්‍ය ප්‍රතිපත්ති සන්නිවේදනය වැදගත් සහ ප්‍රබල මෙවලමක් වන්නේ මූල්‍ය වෙළෙඳපොළට බලපෑම් කිරීමේ හැකියාව, අනාගත අභිප්‍රායයන් සහ ඒ යටතේ පොලී අනුපාත හරහා බලපෑම් කිරීම, විවිධ අවදානම් ඉස්මතු කිරීම, සහ අවිනිශ්චිතතා අඩු කිරීම සඳහා මී ළඟ මුදල් ප්‍රතිපත්ති විවරණ දිනය ප්‍රකාශයට පත්කිරීම වැනි අන්තර්ගතයන් හේතුවෙනි.

මහ බැංකු සන්නිවේදනය සඳහා විශ්වීය වශයෙන් පිළිගත් හොඳ ම භාවිතයන් හා උපකරණ යොදා ගන්නා අතර එය රටේ ආර්ථික, භූගෝලීය, සංස්කෘතික ලක්ෂණවලට හා මූල්‍ය සාක්ෂරතාවට අනුකූල ව විවිධ කාණ්ඩ අනුව ඉලක්කගත ග්‍රාහකයින් ආවරණය කිරීම සඳහා වඩාත් සුදුසු උපක්‍රම අනුගමනය කිරීමට නිර්දේශ කෙරේ. කෙසේ වෙතත්, රටවල් අතර ආර්ථික හා මූල්‍ය සාක්ෂරතාවය, සංස්කෘතිය, භාෂාව, සම්ප්‍රදාය, පිරිවැය, ආගමික සහ ඓතිහාසික හේතු පිළිබඳ දැනුම් මට්ටමේ නොගැලපීම් නිසා පුළුල් වූ ප්‍රේක්ෂක පදනමකට ප්‍රතිපත්ති තීරණ සන්නිවේදනය කිරීමේ දී විශ්වීය හොඳ ම භාවිතයන් වුව ද සියළු රටවලට එක සේ යෙදීම පිළිබද ව විවිධ ගැටලු පවතී. එබැවින්, සන්නිවේදන උපක්‍රමවල අන්තර්ගතය සැලසුම් කිරීමේ දී, සංවර්ධනය කිරීමේ දී සහ නිර්ණය කිරීමේ දී සුදුසු පරිදි මෙම සාධක සලකා බැලිය යුතු ය. ඒ අනුව මහ බැංකු සන්නිවේදන උපකරණ ඉතා සූක්ෂ්ම ප්‍රවේශයකින් තෝරාගෙන තම ග්‍රාහක පදනම සඳහා නියම වේලාවට නිවැරදි පණිවිඩය ලබා දීමේ අරමුණින් සුදුසු උපාය මාර්ගවලට අනුගත විය යුතු වේ. මහ බැංකු සන්නිවේදනයේ දී, මූල්‍යය, වත්කම් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහභාගිවන්නන් සහ බොහෝ විට පුද්ගලික සහ ව්‍යාපාරික අංශය තීරණ ගැනීම් සම්බන්ධයෙන් අවධානය යොමු කරයි. එබැවින්, මහ බැංකු මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය ප්‍රබල මෙවලමක් ලෙස හඳුනාගෙන ඇති අතර, ආනුභවික සාක්ෂි අනුව පැහැදිලි කර ඇති පරිදි, මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය පුළුල් ඉලක්කගත ග්‍රාහකයින් වෙත වර්තමාන මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය, මූල්‍ය පද්ධතියේ ස්ථායිතාව සහතික කිරීම, මූල්‍ය වෙළෙඳපොළ වර්තමාන තත්ත්වය, බාහිර අංශයේ ක්‍රියාකාරීත්වය, උද්ධමන අපේක්ෂාවන් හා අනාගත අවදානම් සඳහා මග පෙන්වීමට විශාල වශයෙන් භාවිත කර ඇත. මේ සඳහා උද්ධමන ව්‍යාප්ති සටහන යොදා ගනිමින් පුරෝකථනයන් පැහැදිළි ව ඉදිරිපත් කිරීම ද නිර්දේශ කර ඇත.

මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයේ සාම්ප්‍රදායික සහ ප්‍රමුඛ උපායමාර්ග ලෙස ප්‍රධාන වශයෙන් මාධ්‍ය නිවේදන සහ මාධ්‍ය සාකච්ඡා ඇතුළත් වේ. මාධ්‍ය නිවේදන සහ මාධ්‍ය සාකච්ඡා, පූර්ව කාලසටහනකට හා නිවේදනය කළ දින දර්ශනයට අනුකූල ව ඉලක්කගත හා පුළුල් ග්‍රාහක පදනමක් වෙත ප්‍රතිපත්ති තීරණ සහ එයට අදාල අදහස් ප්‍රකාශ කිරීමේ මූලික අරමුණින් යුතුව සිදු කරනු ලබයි. මුදල් ප්‍රතිපත්ති මාධ්‍ය නිවේදනය නිකුත් කිරීමේ මූලික අරමුණ අපේක්ෂිත තීරණය මහජනතාවට සන්නිවේදනය කිරීමයි. එම මුදල් ප්‍රතිපත්ති තීරණය ආර්ථිකයේ කෙටි හා මධ්‍ය කාලීන අරමුණු සමඟ සමපාත වීමට හැකිවන ආකාරයට මාධ්‍ය නිවේදන සැකසීම සඳහා මාර්ගෝපදේශ ඉදිරිපත් කිරීම ද සිදු කර ඇත. මාධ්‍ය නිවේදන සැකසීම සඳහා සාමාන්‍යයෙන් පිළිගත් ව්‍යුහයට අනුව සිරස්තල, ප්‍රධාන පණිවිඩය, උද්ධමනය සහ ආර්ථික වර්ධනය පිළිබඳ සාරාංශය, බාහිර අංශයේ වර්ධනයන් පිළිබද අවධානය යොමු කරයි. අනාගත ප්‍රතිපත්ති අපේක්ෂා විස්තර කිරීමට ඉදිරි මාර්ගෝපදේශය සහිතව මග පෙන්වීම් අනුගමනය කිරීම සහ ප්‍රතිපත්ති තීරණවල දී, අවිනිශ්චිතතාවන්ට යටත්ව පුරෝකථනයන් සිදු කිරීම සහ අවශ්‍ය විට උද්ධමන ව්‍යාප්ති සටහන භාවිතා කරමින් නිදර්ශන ඇතුළත් කිරීම ද සිදු වේ. තවද, ඒ පිළිබඳව නිකුත් කරන ලද

මාධ්‍ය නිවේදනය සහ මාධ්‍ය සාකච්ඡා අතර කාල පරතරය අවම කිරීම සඳහා පූර්ව නිවේදනය කරන ලද සිදුවීමක් ලෙස හා නියමිත කාලය තුළ මාධ්‍ය සාකච්ඡා පැවැත්විය යුතු ය. මෙම මාධ්‍ය සාකච්ඡාව අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් මහ බැංකුවේ ඉහළ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පැවැත්වේ. ඉදිරිපත් කිරීම භාෂා ප්‍රතිපත්තියට අනුකූල ව කෙරෙන අතර විවෘත ප්‍රකාශ සහ ද්වි-මාර්ග සන්නිවේදනය සහතික කිරීම සඳහා ප්‍රශ්න සහ පිළිතුරු සැසිවාරයක් ද සම්බන්ධ කර ඇත. තව ද, ප්‍රධාන ප්‍රතිපත්ති පණිවිඩ විකාශනය සඳහා සුදුසු සරල භාෂාවක් භාවිත කළ යුතුය. ඉහත නිර්දේශයන්ට අනුකූල ව, මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම පැවැත්වීමට පෙර සතියක කාලයක් සඳහා මුදල් ප්‍රතිපත්ති, විනිමය අනුපාතිකය සහ

**1 වන වගුව; මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපක්‍රම**

| සන්නිවේදන උපක්‍රම | නිර්දේශිත කාර්යයන් |
|---|---|
| මාධ්‍ය නිවේදන | ප්‍රතිපත්ති තීරණ, නව රෙගුලාසි, සහ දත්ත පිළිබඳ පැහැදිළි කිරීම් සඳහා |
| මාධ්‍ය සාකච්ඡා | මාධ්‍යය නිවේදන නිකුත් කිරීමෙන් පසුව, ඉදිරිපත් කිරීමක් ආකාරයෙන් වැඩි විස්තර ගෙන ඒම සඳහා භාවිත කරන අතර සාමාන්‍යයෙන් ප්‍රශ්නෝත්තර සැසියකින් අවසන් කරයි. |
| වෙබ් අඩවි | විවිධ ස්ථර අන්තර්ගත ප්‍රේක්ෂකයින් ඇතුළු ව පොදුවේ මහජනතාව සඳහා තොරතුරු සපයන ප්‍රධාන තොරතුරු මූලාශ්‍රයයි. ආයතනික පසුබිම, මෙහෙවර සහ අරමුණු, ප්‍රතිපත්ති තීරණ දැන්වීම් මුදල් ප්‍රතිපත්ති නිකුත් කිරීමේ දින දර්ශනය, දත්ත බෙදා හැරීමේ ප්‍රමිති මෙන් ම අනෙකුත් සන්නිවේදන නාලිකා වෙත සබැඳි ඇතුළත් වඩාත් ස්ථායී අන්තර්ගතයක් ඇතුළත් විය යුතු ය. |
| සමාජ මාධ්‍ය | මේ තුළින් වඩාත් සම්පූර්ණ තොරතුරු වෙත යොමුවීමට සහ ඉක්මන් පණිවිඩ සැපයීමට පහසුකම් සපයයි. මෙයට සියලු ම ආකාරයේ සමාජ මාධ්‍ය ජාල ඇතුළත් වන අතර Twitter, Facebook, Google, Instagram, LinkedIn සහ YouTube වලට පමණක් සීමා නොවේ. |
| මාධ්‍ය සමග සම්මුඛ සාකච්ඡා | මහ බැංකු නිලධාරීන් මෙම සන්නිවේදන උපක්‍රමය කෙරෙහි දැඩි ලෙස විශ්වාසය තබයි, ආයතනික පණිවිඩ සමඟ අනුගතවීම සහ පුද්ගලික අදහස් දැක්වීමෙන් වැළකී සිටිය යුතු වේ. |
| පුවත්පත් සඳහා නිත්‍ය තීරු ලිපි | මහ බැංකු බලධාරීන්ට සහ කාර්ය මණ්ඩලයට ආයතනික පණිවිඩ පුළුල් ප්‍රේක්ෂක පිරිසක් වෙත ප්‍රචාරය කිරීමට මාර්ගයකි. |
| විශ්ලේෂකයින්/විශේෂඥයින් සමග රැස්වීම් | ද්වි-මාර්ග අරමුණු සහිත සන්නිවේදන උපක්‍රමයකි. පෙර පණිවිඩ පැහැදිළි කිරීමට සහ ඒ සමගම වෙළෙඳපොළ සහභාගිවන්නන්ගෙන් ප්‍රතිපෝෂණ(feedback) ලබා ගැනීමට භාවිත කරයි. |
| මාධ්‍යවේදීන් සඳහා පසුබිම් සංක්ෂිප්ත/සම්මන්ත්‍රණ | පුවත්පත් මගින් සමාජයට සපයන පණිවිඩ වැරදි සංකල්ප මගහරවා ගැනීම සඳහා සහ මහ බැංකු කටයුතු පිළිබඳ ව මාධ්‍යවේදීන් දැනුවත් කිරීම තුළින් වඩා නිවැරදි ආකාරයට ජනමාධ්‍ය හරහා මහ බැංකු සන්නිවේදනය ස්ථාපිත කිරීමට ඉවහල් වේ. |
| ප්‍රසිද්ධ දේශන | තෝරාගත් ප්‍රේක්ෂක පිරිසක් සමඟ සන්නිවේදනය සඳහා පහසුකම් සපයයි. දේශන වෙබ් අඩවියේ අන්තර්ගත කිරීම් සහ සජීවී විකාශනයන් ද සිදු කරයි. |
| අභ්‍යන්තර ප්‍රවෘත්ති පත්‍රිකා/News Letter | නිශ්චිත ග්‍රාහක පිරිසක් සඳහා පණිවිඩ සැපයීමට යොදා ගනී. |

වෙනත් අදාළ විචල්‍යයන් පිළිබඳ සංවේදී තොරතුරු හෙළි කිරීමෙන් වැළකීම සඳහා සන්නිවේදනය සීමා කිරීමේ කාලසීමාවක් අනුගමනය කෙරේ. මාධ්‍ය සාකච්ඡා, සජීවී විකාශන, ඩිජිටල් මාධ්‍ය හා සමාජ මාධ්‍යවල පළ කිරීම සහ ආයතනික වෙබ් අඩවියේ පළ කිරීම යනාදියට සමගාමීව වෙනත් සන්නිවේදන උපාය මාර්ග ද භාවිතා කළ හැකි ය. මාධ්‍ය සමග සාකච්ඡා සහ සම්මුඛ සාකච්ඡා, පුවත්පත්වල වෙන් කළ තීරු වෙත යාවත්කාලීන කිරීම්, විශ්ලේෂකයින් සමග රැස්වීම්, ප්‍රවීණයන්, මාධ්‍යවේදීන් සඳහා සංක්ෂිප්ත කිරීම් සහ සම්මන්ත්‍රණ, ප්‍රසිද්ධ දේශන සහ පුවත් පත්‍රිකා පළ කිරීම් සඳහා වන ඉල්ලීම්, අවශ්‍යතාව මත සහභාගී වීමට තීරණය කරයි. සැලසුම් කළ ආකාරයට මූල්‍ය ප්‍රතිපත්ති විවරණය සන්නිවේදනය කිරීමෙන් පසු, මූල්‍ය ප්‍රතිපත්ති වාර්තාව/උද්ධමන වාර්තාව සකස් කර ප්‍රකාශයට පත් කරනු ලැබේ. මුදල් ප්‍රතිපත්ති වාර්තාව, මුදල් ප්‍රතිපත්ති රාමුව තුළ ප්‍රතිපත්ති තීරණ සඳහා සලකා බැලීම සඳහා පදනම් වූ තාර්කිකත්වය විස්තර කෙරෙන අතර ආර්ථික සංවර්ධනය පිළිබඳ සවිස්තරාත්මක දළ විශ්ලේෂණයක් සමඟින් ඉදිරි දැක්මක් සහිත මාර්ගෝපදේශයක් කාර්තුමය හෝ අර්ධ වාර්ෂික පදනමින් ප්‍රකාශනය කරයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික මාර්ගෝපදේශවල සඳහන්වන ආකාරයට, මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන උපක්‍රම පහත දක්වා ඇත.

ඉහත 1 වන වගුවේ දක්වා ඇති මුදල් ප්‍රතිපත්ති සන්නිවේදන මාර්ග සලකා බලන විට මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයේ දී තෝරාගත් ප්‍රමුඛ සන්නිවේදන උපක්‍රම භාවිත කෙරෙන අතර අනෙකුත් උපක්‍රම අවශ්‍ය විට පමණක් භාවිතා කිරීම සලකා බලනු ලබන බව පෙනී යයි. තව ද, මෙම උපාය මාර්ග මහ බැංකු සන්නිවේදනයේ මූල්‍ය හා අනෙකුත් ප්‍රතිපත්ති තීරණ සන්නිවේදනය කිරීම සඳහා ද භාවිත වේ. මීළඟට මහබැංකු සන්නිවේදනයේ තවත් අරමුණක් වන ප්‍රතිපත්තිවල විනිවිදභාවය හා මහජනතාව වෙත වගවීම ලඟා කර ගැනීම සඳහා ඉලක්කගත පුළුල් ප්‍රජාව වෙත මහ බැංකු සන්නිවේදනයේ වැදගත්කම පිළිබඳ සොයා බලමු.

### 3. ජනතාව වෙත සන්නිවේදනය

2008 ලෝක මූල්‍ය අර්බුදයෙන් පසුව සිදුකළ නිර්දේශ අනුව මහජනතාව වෙත මහ බැංකු ප්‍රතිපත්ති හා මෙහෙයුම් පිළබඳ සන්නිවේදනයේ වැදගත්කම පිළිබඳව වැඩි අවධානයක් යොමු වීම සිදු වී ඇත. පර්යේෂණාත්මක අධ්‍යයනයක් අනුව (Blinder et al., 2022), මහ බැංකුවට තම ප්‍රතිපත්ති කෙරෙහි මහජන විශ්වාසය සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමට අවශ්‍ය නම් සහ ඒ සඳහා සාමාන්‍ය ජනතාව වෙත මහබැංකු සන්නිවේදනය විවිධ සන්නිවේදන මාර්ග භාවිතා කරමින් ගෙන යා යුතු ය. මහ බැංකුවේ ප්‍රතිපත්ති කෙරෙහි සාමාන්‍ය ජනතාවට වගවීම හා විනිවිදභාවය පවත්වා ගැනීමට අමතර ව, මූල්‍ය පද්ධතිය, මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ දැනුවත් කිරීම සහ මූල්‍ය අන්තර්ගතභාවය සහතික කිරීම සඳහා මහ බැංකු සන්නිවේදනය සාමාන්‍ය ජනතාව වෙතට ගෙන යෑමේ වැදගත්කම ඉහළ යමින් පවතී. මහ බැංකු සන්නිවේදනය ජනතාව වෙත ගෙන යෑම සඳහා මාධ්‍යවේදීන්ගේ කාර්යභාරය ද ඉතා වැදගත් වේ. මාධ්‍ය/මාධ්‍යවේදීන් ඔවුන්ගේ මාධ්‍ය ආවරණ හරහා මහ බැංකු තොරතුරු බෙදා හැරීමට කටයුතු කරයි. මහජනතාව නිවැරදි ව දැනුවත් කිරීම සඳහා මහ බැංකුවේ අරමුණු, කාර්යයන්, ක්‍රියාකාරකම් සහ ප්‍රතිපත්ති පිළිබඳ ව මාධ්‍යවේදීන්ගේ අවබෝධය ඉතා වැදගත් වේ. එබැවින්, ප්‍රධාන කාර්යයන්, ප්‍රතිපත්ති තීරණ, වාර්ෂික වාර්තාවලින් පිළිබිඹු වන ආර්ථිකයේ තත්ත්වය, වර්තමාන තොරතුරු පිළබඳ යාවත්කාලීන කිරීම් සහ ගැටලු ආදී මාතෘකා පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම සඳහා මාධ්‍ය සාකච්ඡා, මාධ්‍ය හමු, දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ. මාධ්‍ය නාලිකාවල පළ වන තොරතුරු වැරදි ලෙස අර්ථකථනය කිරීම වළක්වා ගැනීමටත්, මහජනතාවට අදාළ කරුණු සම්බන්ධයෙන් කිහිප වතාවක් සන්නිවේදනය පවත්වාගෙන යාම සහතික කිරීමටත් මෙය උපකාරී වේ.

මහ බැංකු සන්නිවේදනයේ ග්‍රාහක පදනම කාණ්ඩ කිහිපයක් යටතේ වර්ගීකරණය කර ඇති අතර ඉන් විශාලතම ග්‍රාහක කාණ්ඩය ලෙස සාමාන්‍ය ජනතාව හඳුනාගත හැකි ය. විවිධ උපක්‍රම භාවිත කරමින් සාමාන්‍ය ජනතාව ඇමතීමේ සන්නිවේදන ප්‍රයත්න 2010 වසරෙන් පසු ක්‍රමානුකූල ව ආරම්භ කර ඇත. සමාජ මාධ්‍ය වේදිකාව හරහා සාමාන්‍ය ජනතාව වෙත සන්නිවේදනය පුළුල් කිරීමේ උත්සාහය සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති බව සොයාගෙන ඇත. මේ පිළිබඳව සිදු කරන ලද සමීක්ෂණයකට අනුව

(Blinder et al., 2022) මහ බැංකු ප්‍රතිපත්ති හා තීරණ පිළිබඳ ව මහජන ව්‍යාප්තිය ඉහළ නැංවීමේ අරමුණු වන්නේ උද්ධමන අපේක්ෂාව, විනිවිදභාවය, වගවීම හා තීරණ ගැනීම සඳහා පුරෝකථනය කිරීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා මඟ පෙන්වීමක් ලබා දීම බව තහවුරු කර ඇත. 2008 ලෝක මූල්‍යය අර්බුදයෙන් පසු මහ බැංකු සන්නිවේදනය තීව්‍ර වී ඇති බව මහ බැංකු අධිපතිවරුන්ගෙන් 80%කට වඩා වැඩි ප්‍රමාණයක් පෙන්වා දී ඇති බව සමීක්ෂණයක් මගින් අනාවරණ කරයි. සම්ප්‍රදායික ඉලක්කගත ප්‍රේක්ෂක පදනම, මූල්‍ය වෙළෙඳපොළ සහ සාමාන්‍ය ජනතාව, විශේෂඥයින් වෙත යොමු වීම ක්‍රමයෙන් වැඩි වී ඇත. සමීක්ෂණ සහ ඩිජිටල් මාධ්‍ය යාවත්කාලීන කිරීම් හා සම්බන්ධ තොරතුරු අනුව මහ බැංකුවල ජනප්‍රියත්වය මන්දගාමී ව නමුත් ස්ථාවර වේගයකින් වැඩි වෙමින් පවතින බව සොයා ගෙන ඇත. තවද, විවිධ පුළුල් ඉලක්කගත ප්‍රේක්ෂකයින් වෙත සරල සහ පැහැදිලි භාෂාවෙන් සන්නිවේදන ප්‍රතිපත්ති, සැලසුම් සහ උපාය මාර්ග සංවර්ධනය කිරීමත් සමග මෑත කාලයේ දී මහ බැංකු සන්නිවේදනයේ ඉහළ ප්‍රවේශයක් සටහන් විය.

කොවිඩ් 19 හා සබැදි ආර්ථික අවපාතයෙන් පසු මහ බැංකු සන්නිවේදනයේ වැඩි දියුණු වීමක් නිරීක්ෂණය කර ඇති අතර, මහ බැංකු තීරණ මගින් සහන බලාපොරොත්තුවෙන් සිටි මහජනතාවට උද්ධමනය ඉලක්ක කර ගනිමින් නම්‍යශීලී උද්ධමන ඉලක්ක කිරීම දක්වා ප්‍රතිපත්ති රාමුව වෙනස් කිරීම, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීම, බැංකු පොලී අනුපාත පහත වැටීම, වෙළෙඳපොළ ණය සහන පැකේජ ලබා දීම ආදී කරුණු රැසක් හේතු වී ඇත. ප්‍රාදේශීය සංවර්ධනය ඉලක්ක කර ගනිමින් මහ බැංකු විසින් වාණිජ බැංකු හරහා ලබා දුන් ඇතැම් ණය සඳහා පොලී අනුපාත අඩු කිරීම හා පොළිය කපා හැරීම් පිළිබඳ නිවේදන, මහ බැංකුවල ඉලක්කගත ග්‍රාහක පදනම සමාජ මාධ්‍ය ජාල හරහා පුළුල් කිරීම සඳහා හේතු විය. ඒ අනුව මහබැංකු සන්නිවේදනය තුළ, මුද්‍රිත, විද්‍යුත්, ඩිජිටල් මාධ්‍ය, වැඩ සටහන් සජීවී විකාශනය, විවිධ ප්‍රේක්ෂකයින් ඉලක්ක කරගත් සමාජ මාධ්‍ය වේදිකාව ඇතුළු සාම්ප්‍රදායික සහ නවතම සන්නිවේදන ක්‍රමෝපායන් දෙක ම අනුගමනය කරන ලදී. අධ්‍යනයකින් පෙන්වාදෙන ආකාරයට (Masciandaro et al., 2023) ඉහළ මහජන සහභාගීත්වයක් වාර්තා කරන G20 රටවල මහ බැංකුවලට අනුව මුදල් ප්‍රතිපත්ති තීරණ සම්බන්ධයෙන් මනාපය පළකිරීම සඳහා ඉහළ මහජන ප්‍රතිචාරයක් Twitter සමාජ මාධ්‍ය වේදිකාව මගින් වාර්තා කර ඇත. මෑත කාලීන මහ බැංකු සන්නිවේදන ප්‍රයත්නයේ දී මහ බැංකු විසින් සන්නිවේදන තොරතුරු සාමාන්‍ය ජනතාව අතරට සන්නිවේදනය කිරීම සඳහා සමාජ මාධ්‍ය වේදිකාව ද භාවිත කර ඇති බව නවතම සොයාගැනීම් වාර්තා කරයි. කෙසේ වෙතත් මහබැංකු සන්නිවේදනය සාමාන්‍ය ජනතාව වෙතට ගෙනයෑම අභියෝගාත්මක කාර්යයක් ලෙස දක්වා ඇත. එයට වැරදි අර්ථකථන එකතු කිරීම සමඟ දක්වන ප්‍රතිචාර අයහපත් වීම, ද්වි-මාර්ග සන්නිවේදනය සහ ප්‍රවීණයන් නොවන අයගෙන් සහ මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ අනවබෝධය තුළ ජනතාවගෙන් අනපේක්ෂිත ප්‍රතිචාර ඇතුළත් විය හැකි වන බැවිනි. සන්නිවේදනය ඇතැම්විට විට තොරතුරු ලබා ගැනීමේ මූලාශ්‍රයක් ලෙස ද ක්‍රියා කරයි. ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග, ගැටලු සහ අභියෝග පිළිබඳ ප්‍රතිපෝෂණ ලබා ගැනීමට, මහ බැංකු ප්‍රතිපත්ති පිළිබඳ විශේෂිත උනන්දුවක් දක්වන කොටස්වල අදහස් නිරීක්ෂණය කිරීමට සහ සමාජ ප්‍රශ්න පිළිබඳ අදහස් ලබා ගැනීම සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු දිනපතා ලැබේ. උදාහරණ ලෙස මූල්‍ය වංචා සහ පිරමීඩාකාර මූල්‍ය වංචා, හා අවනසර මූල්‍ය සමාගම් පිළිබඳ තොරතුරු රැසක් විද්‍යුත් තැපැල හරහා යොමු කිරීම පෙන්වා දිය හැකි ය.

මහ බැංකු සන්නිවේදනය සාමාන්‍ය ජනතාව වෙත ගෙන යෑම සඳහා ආයතනික වෙබ් අඩවි, මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය, ඩිජිටල් මාධ්‍ය, සාමාන්‍ය විද්‍යුත් තැපැල සඳහා විමසීම්, යූ ටියුබ් ගිණුම් සඳහා නිකුත් කිරීම, මුහුණු පොත් පිටුවල පළකිරීම්, සමාජ මාධ්‍ය වේදිකාවල පළ කිරීම්, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ ප්‍රවර්ධන ව්‍යාපාර ඇතුළු විවිධ ප්‍රවේශයන් භාවිත කළ හැකි ය. (Casiraghi) Perez, 2022) අනුව, මහ බැංකු සන්නිවේදනයේ දී මුදල් ප්‍රතිපත්ති, මෑතකාලීන ආර්ථික දැක්ම, මූල්‍ය අධ්‍යාපනය, මූල්‍ය සාක්ෂරතාව, මූල්‍ය අන්තර්ගත පිළිබඳ දැනුවත් කිරීමේ අභිප්‍රාය ඇතිව මහජන සම්බන්ධතා වැඩසටහන් ප්‍රවර්ධනය කළ යුතු ය. තවද, ප්‍රධාන ඉලක්කගත ප්‍රේක්ෂක පදනම පුළුල් කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් සහ නුදුරු අනාගතයේ දී වෙළඳපොළට ඇතුළු වීමට අපේක්ෂා කරන අය, විශ්වවිද්‍යාල සිසුන්, පාසල් සිසුන් සහ වෘත්තිකයන් ද ඉලක්ක කරගෙන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ.

ආනුභවික අධ්‍යයනයට අනුව, සාමාන්‍ය ජනතාව වෙත මහ බැංකු සන්නිවේදනය කාන්දුකරණය සඳහා අත්‍යවශ්‍ය කරුණු තුනක් (Haldane, A., Macaulay, A.,) McMahon, M. 2020) පෙන්වා දී ඇත. ඒ අනුව 1. පැහැදිලි කිරීම (Explaining), 2. නියැලීම (Engagement) සහ 3. අධ්‍යාපනය (Education) යන කරුණු ත්‍රිත්වය හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, ඉහත දැක්වෙන අත්‍යවශ්‍ය කරුණු තුනට අනුකූල ව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා, සීමිත මහ බැංකු නිලධාරීන් සංඛ්‍යාවක් බැංකු පරිශ්‍රයෙන් පිටතට ගොස් රාජකාරිය ඉටු කළ හැකි වුව ද ඒ සඳහා අවශ්‍ය සම්පත්, ප්‍රතිපාදන වෙන් කිරීම සහ අනෙකුත් දෙපාර්තමේන්තුවල සහයෝගය ද වැදගත් වේ. තව ද මහ බැංකු සන්නිවේදනය සාමාන්‍ය ජනතාව වෙත කාන්දුකරණය වලක්වන සීමාවන් බොහෝ අධ්‍යයනයන්හි පෙන්වා දී ඇත. මූල්‍ය හා ආර්ථික දැනුම් මට්ටම අඩු වීම, ප්‍රතිපත්තිමය තීරණය සහ ප්‍රතික්‍රියා පිළිබඳ අවබෝධය අඩුවීමෙන් සහ ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වීම හෝ වැරදි ප්‍රතිචාර දැක්වීම ඒ අතර වේ. ප්‍රතිපත්ති විග්‍රහයන්හි දී ඉදිරි මග පෙන්වීම සහ ප්‍රමාණාත්මක ලිහිල් කිරීම් සහිත ව පැහැදිලි කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇතත්, අපේක්ෂිත මූල්‍ය දැනුමක් ඇති සහ අනාගත අභිප්‍රායයන් ඇති අයට පමණක් මෙය වලංගු වේ. සමහර ප්‍රදේශවල සහ ප්‍රාදේශීය වශයෙන් පවතින සංවර්ධනයේ විෂමතා සහ දරිද්‍රතාවයේ අවදානම යටතේ ජීවත් වන, මහජනයාට විකල්ප අවස්ථා සඳහා තෝරා ගැනීම් තිබිය නො හැකි ය. කෙසේ වෙතත්, විනිවිදභාවය, වගවීම සහ විශ්වසනීයත්වය වැඩිදියුණු වනවාත් සමග මහ බැංකු ප්‍රතිපත්ති කෙරෙහි මහජන උනන්දුව වැඩි වීමක් පෙන්නුම් කරන අතර ඉහළ මහජන නියෝජන ප්‍රවේශයක් තුළ මහ බැංකුවල ජනප්‍රියතාවය මන්දගාමී වේගයකින් හෝ වැඩි වීම වැදගත් වේ. තවද, මූල්‍ය අංශය පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම, දැනුවත් කිරීමේ සැසි මගින් මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ අවබෝධය, මූල්‍ය පහසුකම් වෙත ප්‍රවේශ වීමේ හැකියාව, මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම, විධිමත් ප්‍රවාහයන් හරහා මූල්‍ය විසඳුම් ලබා ගැනීම, ආර්ථික වර්ධනයට සහ දිළිඳුකම අඩු කිරීම සඳහා මැදි හා දිගුකාලීන වශයෙන් උපකාරී වේ.

### 4. සන්නිවේදන උපාය මාර්ගයන්හි ඵලදායීතාවය මැනීම

මහ බැංකු ප්‍රතිපත්තිවල ප්‍රබල මෙවලමක් ලෙස සන්නිවේදනය හඳුනාගෙන ඇති අතර, පුළුල් ප්‍රේක්ෂක පිරිසක් ආවරණය කිරීම සඳහා ප්‍රතිපත්ති තීරණ සහ වෙනත් තොරතුරු සන්නිවේදනය කිරීමේ දී මහ බැංකු සන්නිවේදන ප්‍රතිපත්ති, සන්නිවේදන සැලැස්ම, මාර්ගෝපදේශ සහ උපායමාර්ග පිළිබඳව ආයතනික වශයෙන් සිදු වෙමින් පවතින වර්ධනයන් රැසක් නිරීක්ෂණය කළ හැකි ය. තව ද, ඵලදායී සන්නිවේදන උපායමාර්ග සංවර්ධනය කරන්නේ කෙසේද යන්න පිළිබඳ උනන්දුව සහ ඵලදායිතාව මැනීමේ ක්‍රම පිළිබඳ උනන්දුව, පාර්ශ්වකරුවන්ට ඵලදායී ලෙස තොරතුරු ලබා දීම සඳහා සුදුසු සන්නිවේදන මාර්ග යෙදීම සඳහා අඛණ්ඩ සාකච්ඡා වර්ධනය වෙමින් පවතී. සන්නිවේදන කාර්යක්ෂමතාව තක්සේරු කිරීම අභියෝගාත්මක වුවද, ප්‍රමාණාත්මක, ගුණාත්මක විශ්ලේෂණය සහ සිද්ධි අධ්‍යයනයන් භාවිතා කරමින් ඵලදායීතාවය තක්සේරු කළ යුතු බවට නිර්දේශ කෙරේ. නිර්දේශිත එක ම සන්නිවේදන උපාය මාර්ගයක් වුව ද විවිධ කාලවල දී විවිධ ප්‍රේක්ෂකයන්ට එක ම ආකාරයෙන් යොදා ගත හැකිද යන්න සහ එහි අදාළත්වය පිළිබඳ ප්‍රශ්නසහගත අවස්ථා ද ඇත. තව ද, ඵලදායි ලෙස හඳුනාගෙන ඇති සන්නිවේදන උපායමාර්ගය වෙනත් කාලයකට අකාර්යක්ෂම විය හැකි අතර එමගින් සන්නිවේදන උපාය මාර්ගවල ඵලදායීතාවයට බලපෑම් කිරීමට විවිධ හේතු තිබිය හැකි බවත් පෙනී යයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් 2022 වසර තුළ සිදු කර ඇති තාක්ෂණික මග පෙන්වීම අනුව, මධ්‍යම බැංකු විසින් මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයේ ඵලදායීතාව නිරන්තරයෙන් තක්සේරු කළ යුතු ය. ඉහත සාකච්ඡා කළ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය තුළ වෙළෙඳපොළ අපේක්ෂා සහ පුරෝකථන, ඵලදායීතාවය තක්සේරු කළ හැකි ප්‍රබල මෙවලමක් ලෙස හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, ප්‍රසිද්ධ බ්ලොග් අඩවියකට අනුව "මුදල් ප්‍රතිපත්තිය සන්නිවේදනය 98%ක් සාර්ථක වන අතර ප්‍රායෝගික ව ක්‍රියාත්මක වීම සිමා වේ". සැබෑ ආර්ථිකයට සම්බන්ධ මධ්‍ය හා දිගු කාලීන ක්‍රියා දාමයක ප්‍රතිඵල කෙටි කාලීන ව මැනීම ගැටලු සහගත වේ. එබැවින්, මුල දී, සන්නිවේදන උපාය මාර්ගවල සඵලතාවය තක්සේරු කිරීම, ප්‍රේක්ෂකයින් වෙත පණිවිඩ යැවීම සහතික කිරීම සඳහා අදාළ සිදුවීම් පදනම් කරගත් අධ්‍යයනයන් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. නූතන ප්‍රවේශයේ දී මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනයේ කාර්යක්ෂමතාව මනිනු ලබන්නේ

ප්‍රතිපත්තිමය බලපෑම තක්සේරු කිරීමට දත්ත සහ ක්‍රමවේදයන් භාවිතා කරමිනි. මේ සම්බන්ධයෙන්, මුදල් වෙළෙඳපොළ පවතින දත්ත සහ මූල්‍ය දර්ශක, උද්ධමන අපේක්ෂා සමීක්ෂණය සහ අනෙකුත් සමීක්ෂණ, ඇගයීම් ආකෘති, ඡන්ද විමසීම් ආදිය මගින් දත්ත සහ තොරතුරු රැස් කළ හැකි ය. ඵලදායීතාව තක්සේරු කිරීම මගින් පණිවුඩයේ අන්තර්ගතය වැඩිදියුණු කිරීමට, සරල කිරීමට සහ ඉක්මනින් ග්‍රාහක පදනම වැඩි කරවීමට ප්‍රයෝජනවත් වේ. විවිධ අවශ්‍යතා සඳහා සන්නිවේදන විසඳුම් ලබා දීමේ දී නව උපාය මාර්ග පිළිබඳව තීරණ ගැනීම ද සිදුවේ.

මුදල් ප්‍රතිපත්තියේ සඵලතාව තක්සේරු කිරීම උද්ධමන ඉලක්කගත රාමුවට අනුව සිදු කිරීම නිර්දේශ කර ඇත. සෑම මහ බැංකුවක් ම උද්ධමන අපේක්ෂා සමීක්ෂණයක් පවත්වාගෙන යා යුතු අතර එය පිළිබඳ තොරතුරු මුදල් ප්‍රතිපත්ති තීරණයන්හි ඵලදායීතාව තක්සේරු කිරීම සඳහා බෙහෙවින් ප්‍රයෝජනවත් විය හැකි ය. උද්ධමනය ඉලක්කගත අපේක්ෂාවන් ඇගයීමේ දී, ඉලක්කගත උද්ධමන අපේක්ෂාවන්හි නිරපේක්ෂ අපගමනය, කාලයත් සමග උද්ධමන අපේක්ෂාවේ විචලනය, පුද්ගල පුරෝකථන හරහා උද්ධමන අපේක්ෂාවන් විසරණය, වර්තමාන තොරතුරු සඳහා උද්ධමන අපේක්ෂාවන්ගේ සංවේදීතාව පෙන්වා දී ඇත. ඉහත පිළිතුරු සඳහා අවම අගයයන් ලැබීම මගින් හොඳින් ඉලක්කගත කර ඇති උද්ධමන අපේක්ෂාවන් පෙන්නුම් කරයි.

මූල්‍ය පද්ධති ස්ථායීතාවය සහතික කිරීම සඳහා තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ දී සහ නියෝජිත කටයුතු ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී සන්නිවේදන උපායමාර්ගවල සඵලතාව තක්සේරු කිරීම සලකා බලන කාල සීමාව තුළ සිදුවීම් අධ්‍යයනය, වත්කම් මිල චලනයන් සහ උච්චාවචනයන් සලකා බැලිය හැකි ය. විශේෂයෙන් ගෙවන ලද වැඩසටහන් සඳහා ඵලදායීතාවය තක්සේරු කිරීමේ අවශ්‍යතාව අනුව ප්‍රාදේශීය කාර්යාල ජාලය සමග හෝ බාහිරින් ලබා ගන්නා සේවාදායක පාර්ශ්වයක් සමග සහයෝග යෙන් සමීක්ෂණ පැවැත්වීම සලකා බැලිය හැකි ය. මීට අමතර ව, ග්‍රාහකයින් සංඛ්‍යාව, බැලීම්, මනාප, අදහස්, බෙදා ගැනීම් සහ සාමාන්‍ය නැරඹීමේ කාලය ද ඩිජිටල් සහ සමාජ මාධ්‍ය නාලිකා හරහා භාවිත කරන සන්නිවේදන උපායමාර්ගවල සඵලතාව පෙන්නුම් කරයි. මීට අමතරව, නවතම හා තෝරාගත් සන්නිවේදන උපාය මාර්ග වල ඵලදායීතාව මැනීම වෙනුවට කළමණාකරණය වෙත මාසික ව වාර්තා ඉදිරිපත් කිරීම ද සිදුවේ. පාර්ශ්වකරුවන්ගේ අදහස් පිළිබඳ ප්‍රගතිය සහ ඉදිරි ගමන පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත් කිරීම සඳහා නිරන්තර පදනමින් වාර්තා ඉදිරිපත් කිරීම ද අනුගමනය කළ යුතු වේ. සන්නිවේදන උපාය මාර්ගවල සඵලතාව තක්සේරු කිරීම විවිධ සීමාවන්ට යටත් වේ. මෑත අධ්‍යයනයන්හි සොයාගැනීම්වලට අනුව, මූල්‍ය වෙළෙඳපොළට ඇතුළත් සාම්ප්‍රදායික ප්‍රේක්ෂක පදනම මගින් සහ මාධ්‍යවේදීන් යොදාගෙන සන්නිවේදනයේ ඵලදායීතාව ඇගයීම, වඩා පුළුල් ප්‍රේක්ෂක පදනමක් යෙදොගෙන ඵලදායීතාවය ඇගයීමට වඩා සාර්ථක විය හැකි ය.

## 5. සමාප්තිය

සමස්තයක් ලෙස ගත්විට මහ බැංකු සන්නිවේදනයේ වෙනස්වන භූමිකාව පිළිබඳ සාකච්ඡා කිරීමේ දී, ගෝලීය මූල්‍ය අර්බුදයත් සමග මහ බැංකු සන්නිවේදනයේ විප්ලවීය වෙනසක් සිදු වූ බව පැහැදිළි වේ. මූල්‍ය ප්‍රතිපත්තියේ සඵලතාව, පුරෝකථනය කිරීමේ හැකියාව, වෙළෙඳපොළ අපේක්ෂා සහ තීරණ ගැනීම් සඳහා මග පෙන්වීම්වලට අමතරව මහබැංකු ප්‍රතිපත්ති තීරණ හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් වගවීම, විශ්වසනීයත්වය සහ විනිවිදභාවය ළගා කරගැනීම සඳහා අදාළ වන සාධක මහ බැංකු සන්නිවේදන ප්‍රතිපත්තියට එකතු වෙමින් පවතී. සමහර මහ බැංකු විසින් මුදල් ප්‍රතිපත්ති සහ මූල්‍යය පද්ධතිය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් නීතිමය රාමුව, පාලන ව්‍යුහය සහ අරමුණු වෙනස් කිරීම නිරීක්ෂණය කළ හැකිය. ක්ෂුද්‍ර හා සාර්ව විචක්ෂණ මට්ටම, ප්‍රාග්ධන අවශ්‍යතාව ඉහළ නැංවීම, වෙළෙඳපළ හැසිරීම් සමීක්ෂණ සිදු කිරීම, ආතති පරීක්ෂාවන් සහ පද්ධතිමය වශයෙන් ඇති අවදානම සැලකිල්ලට ගනිමින් අධීක්ෂණ රාමුවට අනුකූල ව මූල්‍ය පද්ධතිය තවදුරටත් ශක්තිමත් කරන ලදී. එසේ ම මහ බැංකුවේ ලියාපදිංචි බැංකු මූල්‍ය හා කල්බදු සමාගම්වලට අදාළ සුපරීක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට අමතරව තැන්පතු රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම, අනවසර තැන්පතුකරණයේ නියැලෙන ආයතන හා මූල්‍ය වංචා ක්‍රම පිළබඳ නිරන්තරයෙන් දැනුවත් කිරීම සහ මූල්‍ය පාරිභෝගිකයා පිළිබඳ වැඩි අවධානයක් යොමු

කිරීම ආදී කරුණු රැසක් මහ බැංකු විෂය පථයට එකතු වීම නිරීක්ෂණය කළ හැකි ය. ග්‍රාහක පදනම පුළුල් කිරීම සඳහා කර ඇති නිර්දේශයන්ට අනුකූල ව මූල්‍ය වෙළඳපොළ කෙරෙහි අවධානය යොමු කරන සම්ප්‍රදායික ප්‍රේක්ෂක පදනමට වඩා, මුදල් ප්‍රතිපත්ති විවරණය නියමිත හා කලින් දන්වා ඇති කාලය තුළ විවිධ ප්‍රේක්ෂකයින් වෙත වැඩි ග්‍රාහක පදනමක් නියෝජනය වන ආකාරයට සන්නිවේදනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර ඇත. පාර්ශවකරුවන් වෙත ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ප්‍රධාන ගාමක බලවේගය ලෙස මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය හඳුනාගෙන ඇත. ඉදිරි මග පෙන්වීම සහ ප්‍රමාණාත්මක ලිහිල් කිරීම් හා ව්‍යාප්ති සටහන් යොදාගෙන පුරෝකථනය කිරීම් මධ්‍ය කාලීන ප්‍රතිපත්තිවලට අනුගත වීමේ දී යොදා ගන්නා ලෙස නිර්දේශ විය. තව ද, ඉලක්කගත ග්‍රාහකයින් සාම්ප්‍රදායික ප්‍රේක්ෂක පදනම, මූල්‍ය වෙළෙඳපොළ, ව්‍යාපාරික අංශය, මාධ්‍යවේදීන්, රජය සහ සාමාන්‍ය ජනතාව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, මහ බැංකු විෂයපථය පිළිබඳ උනන්දුවන්නන් ඇතුළත් ව ජනගහනයේ සෑම ස්ථරයක් ම නියෝජනය වන ආකාරයට පුළුල් වනු ඇතැයි අපේක්ෂා කරන ලදී. මහ බැංකු කටයුතු පිළිබද වගවීම, විශ්වසනීයත්වය සහ විනිවිදභාවය ගොඩ නැගීම තුළින් එහි ප්‍රතිපත්ති ඵලදායිතාව කරා ළඟා වීමේ නව ප්‍රයත්නයක් ලෙස සාමාන්‍ය ජනතාව වෙත සන්නිවේදනය හඳුනාගෙන ඇත. මේ අනුව, සන්නිවේදන දෙපාර්තමේන්තුවක් පිහිටුවීම, සන්නිවේදන ප්‍රතිපත්ති, සැලසුම් සහ උපාය මාර්ග සැකසීම මගින් මහ බැංකු සන්නිවේදනයේ ආයතනික රාමුව හා කාර්යභාරය වැඩිදියුණු වෙමින් පවතී. සාම්ප්‍රදායික, මුද්‍රිත, විද්‍යුත්, ඩිජිටල් සහ සමාජ මාධ්‍ය නාලිකා ආවරණය වන පරිදි ජාත්‍යන්තර වශයෙන් පිළිගත් හොඳ ම ප්‍රායෝගික උපාය මාර්ග භාවිත වෙමින් පවතී. මුද්‍රිත මාධ්‍ය මගින් සිදු කෙරෙන සන්නිවේදනයට වඩා අනෙකුත් මාධ්‍ය භාවිත කරමින් සන්නිවේදනය ප්‍රචලිත වෙමින් පවතින අතර එය මහ බැංකු සන්නිවේදනය තුළ ද නිරීක්ෂණය කළ හැකි ය. සන්නිවේදන උපාය මාර්ගවල සඵලතාව තක්සේරු කිරීම සඳහා ඇගයීම් ශිල්පීය ක්‍රම සංවර්ධනය වෙමින් පවතින අතර ඒ සඳහා විවිධ ක්‍රමවේදයන් අනුගමනය කරමින් පවතී. සම්පත් සීමාවන්, අධිපතිවරයාට වාර්තා කරන සන්නිවේදන කළමනාකරුවන් නොමැති වීම, නිරීක්ෂක ලෙස විවිධ අවස්ථා නියෝජනය නොකිරීම, නිරන්තර සම්බන්ධීකරණය නොමැතිකම, විශේෂඥ සහ දක්ෂ කාර්ය මණ්ඩලයක් නොමැති වීම ආදි කරුණු ලිපියේ සාකච්ඡා කර ඇති සාධකවලට අමතර ව මහ බැංකු සන්නිවේදනයේ ඵලදායීතාවය සීමාවීම කෙරෙහි බලපාන අභ්‍යන්තර සාධක ලෙස හඳුනාගෙන ඇත.

ආශ්‍රිත ග්‍රන්ථ


*Blinder, A. S., Ehrmann, M., De Haan, J., & Jansen, D.-J. (2022). Central bank communication with the general public: Promise or false hope?*

*Blinder, A. S., Ehrmann, M., Fratzscher, M., De Haan, J., & Jansen, D.-J. (2008). Central bank communication and monetary policy: A survey of theory and evidence. Journal of economic literature, 46(4), 910-945.*

*Casiraghi, M., & Perez, L. P. (2022). Central Bank Communications.*

*Dincer, N. N., & Eichengreen, B. (2013). Central bank transparency and independence: Updates and new measures.*

*Freedman, C., & Laxton, M. D. (2009). Why inflation targeting? International Monetary Fund.*

*Haldane, A., & McMahon, M. (2018, May). Central bank communications and the general public. In AEA papers and proceedings (Vol. 108, pp. 578-583). 2014 Broadway, Suite 305, Nashville, TN 37203: American Economic Association.*

*Lawler, P. "How Do Central Banks Talk? Geneva Reports on the World Economy 3." The World Economy 25.7 (2002): 1040-1040.*

*Masciandaro, D., Peia, O., & Romelli, D. (2023). Central bank communication and social media: From silence to Twitter. Journal of Economic Surveys.*

*Maxwell Fry, DeAnne Julius, Sandra Roger Lavan Mahadeva, and Gabriel Sterne. "Key issues in the choice of monetary policy framework." Monetary policy frameworks in a global context 2 (2000).*

*Posen, A. S. V., Laubach, T., & Mishkin, F. S. (1998). Inflation targeting: lessons from international experience. Princeton University Press.*

**ඔබට**
## මිලියනයක දිනුමක්!
**දිනුම ලබා ගැනීමට**
**සුළු අමතර ගාස්තුවක් ගෙවන්න**

## ඔයාට මගේ ආදරය දැනෙනවා නම්...
**මේ, මට ඔයාගේ**
**උදව් ඕනම වෙලාවයි**

## ඔබේ නමට පාර්සලයක් ඇත!
**රේගුවෙන් නිදහස් කිරීමට**
**සහනදායී ගාස්තුවක් ගෙවන්න**

## ඔබ වටිනා වාහනයක් දිනා ඇත!
**නිවසටම ගෙන්වා දීමට අදාළ**
**රේගු ගාස්තු ගෙවන්න**

# අනගි රැකියාවක් !
**සුළු ලියාපදිංචි ගාස්තුවක් පමණයි**

# සැලකිලිමත් වන්න
**වංචාකරුවන්ගේ මෙ වැනි ක්‍රමෝපායන්ට නො රැවටෙන්න**

ඔබගේ වයස් සීමාව, ස්ත්‍රී/පුරුෂ භාවය, අධ්‍යාපන පසුබිම හෝ ආදායම් මට්ටම
කුමක් වුවත් පහසුවෙන් ම ඔබත් මෙම වංචාකරුවන්ගේ ගොදුරක් විය හැක.

වංචාවන්ට ගොදුරු වූ විට ඔබට සිදු වන මූල්‍යමය අලාභය සහ ඇති වන මානසික පීඩාව
සුළුපටු නො වේ.

ඔබ රැවටීම සඳහා ලිපි, තැපැල් පත්, සමාජ ජාල අඩවි, දුරකථන ඇමතුම්, කෙටි පණිවුඩ, විද්‍යුත් තැපෑල, අන්තර්ජාල පණිවුඩ හුවමාරු සේවා මගින් වංචාකරුවන් ඔබ හා සම්බන්ධ විය හැක.

වංචාකරුවන්ගේ අරමුණ ඔබ රවටා ඔබගේ විශ්වාසය දිනා ගැනීමයි.
ඔවුනට නො රැවටීම ඔබේ වගකීමයි.


මූල්‍ය බුද්ධි ඒකකය
ශ්‍රී ලංකා මහ බැංකුව
නො. 30, ජනාධිපති මාවත, කොළඹ 01.

112477125
112477692
info@fiusrilanka.gov.lk




# දැන්වීමයි

## මුදල් නෝට්ටු විකෘති කිරීම හෝ වෙනස් කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන සියලු ම මුදල් නෝට්ටු සහ කාසි ශ්‍රී ලංකාව තුළ ඕනෑ ම අගයක ගෙවීමක් සිදු කිරීම සඳහා වලංගු මුදල් වේ.

කෙසේ වෙතත්, විසිතුරු භාණ්ඩ සහ තෑගි අයිතම සකස් කිරීම සඳහා වලංගු මුදල් නෝට්ටු යොදා ගැනීම සහ එවැනි ක්‍රියාකාරකම් සමාජ මාධ්‍යය ඔස්සේ ප්‍රවර්ධනය කිරීමේ ප්‍රවණතාවක් කෙරෙහි ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානය යොමු වී තිබේ.

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 55 වන වගන්තියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලක මණ්ඩලයේ අවසරයකින් තොරව, පහත දක්වා ඇති කටයුතු සිදු කරගෙන යෑමෙහි නියැලී සිටින ඕනෑ ම පුද්ගලයෙකු වරදක් සිදු කරයි.

(අ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් කපා දැමීම, සිදුරු කිරීම හෝ වෙනත් යම් ආකාරයකින් විකෘති කරනු ලැබීම.

(ආ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් මත යමක් මුද්‍රණය කිරීම, මුද්‍රාවක් තැබීම හෝ යමක් ඇඳීම හෝ යම් මුදල් නෝට්ටුවක් මත හෝ යම් මුදල් නෝට්ටුවකට යම් මුද්‍රාවක් හෝ ලකුණක් අලවනු ලැබීම.

(ඇ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවකට හෝ ඒ මත වෙළෙඳ දැන්වීමක ස්වභාවයෙන් හෝ ආකෘතියෙන් යුත් යම් දෙයක් ඇමිණීම හෝ අලවනු ලැබීම.

(ඈ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් කවර හෝ ආකාරයකින් ප්‍රතිනිර්මාණය කරන හෝ යම් මුදල් නෝට්ටුවක අනුරුවක් සෑදීම; හෝ

(ඉ) යම් ව්‍යවහාර මුදල් නෝට්ටුවක් වලංගු මුදලක් වශයෙන් නොවන අන්‍යාකාරයකින් භාවිත කිරීම.

ඉහත දැක්වූ ආකාරයේ වරදකට හසුවන යම් පුද්ගලයෙකු මෙම පනතේ 111 වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරිපිට සමාලෝචන නඩුවකින් අනතුරු ව වරදකරු වීම මත, රුපියල් මිලියන විසි පහකට නොවැඩි දඩ මුදලක් හෝ තෙවසරකට නොඅඩු කාලයක් සඳහා සිරදඬුවකමකට හෝ එවැනි දඩයකට සහ සිර දඬුවමකට යන දෙකට ම යටත් විය යුතු ය.

ඉහත සඳහන් ආකාරයේ නීති විරෝධී කටයුතුවල නියැලීමෙන් වැළකී සිටින ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාව වෙත දැඩි ව අවධාරණය කර සිටියි.

**ව්‍යවහාර මුදල් අධිකාරී - ශ්‍රී ලංකා මහ බැංකුව**